# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ

## නවවැනි පාර්ලිමේන්තුවේ

### *තෙවැනි* සභාවාරය

## පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංක 182

## රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ

පළමුවැනි වාර්තාව

(2022.03.22 සිට 2022.07.05 දක්වා සිදු කරන ලද විමර්ශන)

රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ සභාපති ගරු කබීර් හෂීම් මහතා විසින්
2022 දෙසැම්බර් මස 05 වැනි දින ඉදිරිපත් කරන ලදී.

2022 දෙසැම්බර් මස 05 වැනි දින ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව විසින් මුද්‍රණය කළ යුතු යැයි නියෝග කරන ලදී.

## නවවැනි පාර්ලිමේන්තුවේ තෙවැනි සභාවාරය
## රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ සංයුතිය

| | |
|---|---|
| 1 | ගරු කබීර් හෂීම් මහතා (සභාපති) |
| 2 | ගරු නීතිඥ මොහාන් ප්‍රියදර්ශන ද සිල්වා මහතා |
| 3 | ගරු ලසන්ත අලගියවන්න මහතා |
| 4 | ගරු ප්‍රසන්න රණවීර මහතා (2022.11.19 දින සිට) |
| 5 | ගරු කේ. කාදර් මස්තාන් මහතා |
| 6 | ගරු (ආචාර්ය) සුරේන් රාඝවන් මහතා |
| 7 | ගරු ඩයනා ගමගේ මහත්මිය |
| 8 | ගරු එස්. බී. දිසානායක මහතා |
| 9 | ගරු තිස්ස අත්තනායක මහතා |
| 10 | ගරු (ආචාර්ය) සරත් වීරසේකර මහතා |
| 11 | ගරු විමලවීර දිසානායක මහතා |
| 12 | ගරු නිරෝෂන් පෙරේරා මහතා |
| 13 | ගරු (වෛද්‍ය) සුදර්ශිනී ප්‍රනාන්දුපුල්ලේ මහත්මිය |
| 14 | ගරු ජේ. සී. අලවතුවල මහතා |
| 15 | ගරු අශෝක් අබේසිංහ මහතා |
| 16 | ගරු බුද්ධික පතිරණ මහතා |
| 17 | ගරු ජයන්ත සමරවීර මහතා |
| 18 | ගරු හෙක්ටර් අප්පුහාමි මහතා |
| 19 | ගරු වේලු කුමාර් මහතා (2022.11.19 දින සිට) |
| 20 | ගරු හේෂා විතානගේ මහතා |
| 21 | ගරු (ආචාර්ය) මේජර් ප්‍රදීප් උඳුගොඩ මහතා |
| 22 | ගරු ඉසුරු දොඩන්ගොඩ මහතා |
| 23 | ගරු නීතිඥ වසන්ත යාපාබණ්ඩාර මහතා |
| 24 | ගරු ෂානක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා ( 2022.10.17 දින දක්වා) |
| | ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා (2022.10.18 දින සිට) |
| 25 | ගරු එම්. ඩබ්ලිව්. ඩී. සහන් ප්‍රදීප් විතාන මහතා |
| 26 | ගරු ඩී. වීරසිංහ මහතා |
| 27 | ගරු වීරසුමන වීරසිංහ මහතා |
| 28 | ගරු (මහාචාර්ය) චරිත හේරත් මහතා |
| 29 | ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය මහත්මිය |

## නවවැනි පාර්ලිමේන්තුවේ දෙවැනි සභාවාරය

## රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ සංයුතිය

## (වාර්තාවේ ඇතුළත් විමර්ශන කාල සීමාවේදී)

1.ගරු (මහාචාර්ය) තිස්ස විතාරණ මහතා (සභාපති)
2.ගරු උදය ගම්මන්පිල මහතා
3.ගරු දුමින්ද දිසානායක මහතා
4.ගරු දයාසිරි ජයසේකර මහතා
5.ගරු ලසන්ත අලගියවන්න මහතා
6.ගරු (වෛද්‍යා) සුදර්ශිනී ප්‍රනාන්දුපුල්ලේ මහත්මිය
7.ගරු ශෙහාන් සේමසිංහ මහතා
8.ගරු ප්‍රසන්න රණවීර මහතා
9. ගරු තිස්ස අත්තනායක මහතා
10. ගරු හරීන් ප්‍රනාන්දු මහතා
11. ගරු නිරෝෂන් පෙරේරා මහතා
12. ගරු අශෝක් අබේසිංහ මහතා
13. ගරු බුද්ධික පතිරණ මහතා
14. ගරු කේ. කාදර් මස්තාන් මහතා
15. ගරු මොහමඩ් මුසම්මිල් මහතා
16. ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා
17. ගරු හේෂා විතානගේ මහතා
18. ගරු (වෛද්‍යා) උපුල් ගලප්පත්ති මහතා
19. ගරු බී. වයි. ජී. රත්නසේකර මහතා
20. ගරු වීරසුමන වීරසිංහ මහතා
21. ගරු (මහාචාර්ය) රංජිත් බණ්ඩාර මහතා
22. ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය මහත්මිය

<u>**කාරක සභා ලේකම් කාර්යාලයේ කාර්ය මණ්ඩලය**</u>

රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ වත්මන් කාර්ය මණ්ඩලය:

- සහකාර අධ්‍යක්ෂ (පරිපාලන) / කාරක සභා ලේකම් - අනූෂා සී.පී. සූරියප්පෙරුම මිය
- ප්‍රධාන නිලධාරි - චින්තා එම්.බුලත්සිංහල මිය
- සහකාර ප්‍රධාන නිලධාරි - කේ.එම්.ජී.කේ.ජයවර්ධන මයා
- පාර්ලිමේන්තු නිලධාරි - ජේ.එම්.එස්.නිර්මාණි මිය
- පාර්ලිමේන්තු නිලධාරි - ජී.කේ.සී.තිලකරත්න මෙය
- පාර්ලිමේන්තු නිලධාරි - එච්.එම්.ඩී.ලක්මාලි මෙය
- පාර්ලිමේන්තු නිලධාරි - එම්.එස්.බන්දුලහේවා මිය
- පාර්ලිමේන්තු නිලධාරි - ජී.ඩී.ජේ.එච්.අයේෂ්මන්ති මෙය

<u>**කාරක සභා වාර්තා**</u>

www.parliament.lk යන වෙබ් අඩවියෙන් පහත සඳහන් ගමන් මාර්ගය ඔස්සේ රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ ප්‍රකාශන බා ගත කර ගැනීමට හැක.

Select Language → Business of Parliament → Committee Reports

# පටුන

පිටු අංකය

a. සභාපතිවරයාගේ සටහන........................................................9

b. සංක්ෂිප්ත වාර්තාව..............................................................11

c. විමර්ශනය කරන ලද එක් එක් ආයතනවල හඳුනාගත් ප්‍රධාන ගැටළු , නිරීක්ෂණ, නිර්දේශ /නියෝග..................................15

d. සූචිය ...........................................................................140

## සභාපතිවරයාගේ සටහන

නව වැනි පාර්ලිමේන්තුවේ තෙවැනි සභා වාරයේ, රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ පළමුවැනි වාර්තාව පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 119 (3) හි විධිවිධාන ප්‍රකාරව මම අද දින පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරමි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148 වැනි ව්‍යවස්ථාවෙන්, ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව වෙත පවරා ඇති රාජ්‍ය මූල්‍ය පාලන බලතල හා පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග මගින් සලසා ඇති බලතල අනුව මූල්‍ය අධීක්ෂණ කාරක සභාවක් වශයෙන් රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව කටයුතු කරනු ලබයි. ඒ අනුව, මහජන වියදම් සඳහා පාර්ලිමේන්තුව විසින් ප්‍රදානය කරනු ලබන මුදල් විසර්ජන කිරීම පෙන්නුම් කරන ගිණුම් ද රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් සුදුසු යැයි සලකනු ලැබිය හැකි පාර්ලිමේන්තුව ඉදිරියේ තබනු ලබන වෙනත් යම් ගිණුම් ද විගණකාධිපතිවරයාගේ සහාය ඇතිව පරීක්ෂා කිරීම මෙම කාරක සභාවේ මූලික කර්තව්‍ය වේ.

රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ දෙවැනි සභා වාරයේ පළමු වාර්තාව එවකට රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ සභාපති ගරු (මහාචාර්ය) තිස්ස විතාරණ මහතා විසින් 2022 මැයි මස 20 වැනි දින පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කර ඇති අතර, එහි 2021.08.04 දින සිට 2021.11.19 දක්වා කාරක සභාව විසින් සිදු කරනු ලැබූ විමර්ශන පිළිබඳ තොරතුරු අන්තර්ගත විය.

අද දින ඉදිරිපත් කරනු ලබන මෙම වාර්තාව තුළ නව වැනි පාර්ලිමේන්තුවේ දෙවැනි සභාවාරය තුළ රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් විමර්ශනය කරන ලද විගණකාධිපති වාර්තා හා සම්බන්ධ තොරතුරු ඇතුළත් වන අතර, ශ්‍රී ලංකාවට මුහුණ පෑමට සිදු වූ කොවිඩ් වසංගතය හා ආර්ථික කඩාවැටීම හමුවේ වර්තමානයේ සිදුව ඇති අධ්‍යාපන පද්ධතියේ පසුබෑස්ම , ආහාර අර්බුදය හා මන්දපෝෂණ තත්වය , තෙල් අර්බුදය හේතුවෙන් උද්ගතව ඇති ප්‍රවාහන ගැටළු සහ මෙම අර්බුදකාරී තත්වයන් අවම කිරීම හා විසඳීම සඳහා ගත හැකි ක්‍රියාමාර්ග වැනි කාලීන සහ ආර්ථික වශයෙන් වඩා වැදගත්කමක් ඇති මාතෘකා පිළිබඳව පවත්වන ලද විශේෂ විමර්ශනවල තොරතුරු ද ඒ පිළිබඳව කාරක සභාවේ නිගමන හා නිර්දේශ ද ඇතුළත් වේ.

වර්තමානයේ රට තුළ උද්ගතව ඇති දැවැන්ත ආර්ථික අර්බුදයෙන් මිදී යහපත් ආර්ථිකයක් උදා කිරීම සඳහා පක්ෂ පාට බේද දුරලා පෙරට වඩා කැප වීමෙන් කටයුතු කිරීම දේශපාලන අධිකාරියේ වගකීමක් වන අතර, රාජ්‍ය ආයතනවල පවතින මූල්‍ය අක්‍රමිකතා හා දූෂණ වැළැක්වීමට නිසි පියවර ගැනීම සියලු රාජ්‍ය නිලධාරීන්ගේ වගකීම බව ද රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ සභාපති වශයෙන් මා අවධාරණය කරනු කැමැත්තෙමි.

එසේම, රාජ්‍ය ආයතනවල මූල්‍ය විනය හා කාර්යසාධනය වැඩි දියුණු කිරීම සඳහා කාරක සභාව මගින් දරනු ලබන ප්‍රයත්නය නිරර්ථක නොවීමට වගබලා ගැනීම දේශපාලන අධිකාරියේ මෙන්ම ප්‍රධාන ගණන් දීමේ නිලධාරීන්ගේ වගකීමක් වන බව මෙහිලා විශේෂයෙන් සඳහන් කළ යුතුමය. කාරක සභාවේ නිර්දේශ හා නියෝග ක්‍රියාත්මක කිරීමට කඩිනම් අවධානය යොමු කිරීම හා පසු විපරම් සිදු කරමින් අදාළ නිර්දේශ/නියෝග ක්‍රියාත්මකභාවයට පත් කිරීම ඔවුන්ගේ වගකීම වේ.

රාජ්‍ය මූල්‍ය යාන්ත්‍රණය ශක්තිමත් කිරීමට රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවෙන් මෙතෙක් ගත් ක්‍රියා මාර්ග සම්බන්ධයෙන් පසු ගිය ගිණුම් කාරක සභා වල සේවය කළ සභාපතිවරුන් ඇතුළු සභික මන්ත්‍රීවරුන්ටත්, කාරක සභා කටයුතු සාර්ථකව පවත්වාගෙන යාමට මා හට පූර්ණ සහයෝගය ලබා දෙන වර්තමාන සභික මන්ත්‍රීවරුන්ටත් මාගේ කෘතඥතාවය පුද කරමි.

එසේම, කාරක සභා විමර්ශනවලදී අප වෙත ලබා දෙන අමිල සහය වෙනුවෙන් විගණකාධිපතිවරයා ඇතුළු ඔහුගේ කාර්ය මණ්ඩලයට ද, මහා භාණ්ඩාගාරයේ නිලධාරීන්ට ද, පාර්ලිමේන්තුවේ මහ ලේකම් ඇතුළු කාර්ය මණ්ඩලයට ද මාගේ ස්තුතිය හා ප්‍රසාදය මෙයින් පළ කරමි.

කබීර් හෂීම්

සභාපති

රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව

## සංක්ෂිප්ත වාර්තාව

නවවැනි පාර්ලිමේන්තුවේ දෙවැනි සභා වාරයේ රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් විමර්ශනය කරන ලද ආයතනවලට අදාළව සාකච්ඡා කරන ලද කරුණු, ප්‍රධාන ගණන්දීමේ නිලධාරින් විසින් කරන ලද පැහැදිලිකිරීම්, කාරක සභාව විසින් ලබාදෙන ලද නියෝග හා නිර්දේශ මෙම වාර්තාවේ අඩංගු වේ.

**රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් 2022.03.22 සිට 2022.07.05 දක්වා විමර්ශනය කරන ලද ආයතන හා සම්බන්ධ විගණකාධිපති වාර්තා කාල සීමාව**

| | **ආයතනය** | **සලකා බලන ලද විගණකාධිපති වාර්තා කාලසීමාව / පූර්ව කාරක සභා නියෝග ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය/ වර්තමාන කාර්යසාධනය** | **විමර්ශනය කරන ලද දිනය** |
|---|---|---|---|
| 01 | කොළඹ මහා නගර සභාව | 2017 හා 2018 විගණකාධිපති වාර්තා සහ වර්තමාන කාර්යසාධනය | 2022 මාර්තු 22 |
| 02 | සුරාබදු දෙපාර්තමේන්තුව | 2020 විගණකාධිපති වාර්තාව, පූර්වකාරක සභාව විසින් ලබා දුන් නියෝග ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය සහ වර්තමාන කාර්යසාධනය | 2022 අප්‍රේල් 19 |
| 03 | වෙළෙඳ අමාත්‍යාංශය | 2020 විගණකාධිපති වාර්තාව සහ වර්තමාන කාර්යසාධනය | 2022 මැයි 04 |
| 04 | බලශක්ති අමාත්‍යාංශය | 2018, 2019 විගණකාධිපති වාර්තා, 2020 අතිරික්ත, සීමා ඉක්මවීම් සහ බලය නොලත් කාරක පාඩු ඇතුළත් විගණන වාර්තාව සහ වර්තමාන කාර්යසාධනය | 2022 මැයි 05 |
| 05 | බලශක්ති අමාත්‍යාංශය (නැවත කැඳවීම) | පූර්ව කාරක සභාව විසින් ලබා දුන් නියෝග ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය | 2022 ජුනි 22 |

| | | | |
|---|---|---|---|
| 06 | කෘෂිකර්ම අමාත්‍යාංශය | 2018,2019 හා 2020 විගණකාධිපති වාර්තා සහ වර්තමාන කාර්යසාධනය | 2022 ජූනි 07 |
| 07 | ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුව | 2018,2019 හා 2020 විගණකාධිපති වාර්තා සහ වර්තමාන කාර්යසාධනය | 2022 ජූනි 08 |
| 08 | විදේශ සම්පත් දෙපාර්තමේන්තුව | වර්තමාන ආර්ථික අර්බුදයට අදාළව දෙපාර්තමේන්තුවේ වර්තමාන කාර්යසාධනය | 2022 ජූනි 09 |

## කාරක සභාව විසින් පවත්වන ලද විශේෂ විමර්ශන

| | විශේෂ විමර්ශන | විමර්ශනය කරන ලද දිනය |
|---|---|---|
| 01 | 2021.11.19 දින රජයේ ගිණුම් පිළිබඳ කාරක සභා රැස්වීමේදී ගත් තීරණ ප්‍රකාරව කැඳවූ ශ්‍රී ලංකාවේ අපද්‍රව්‍ය බැහැර කිරීම සහ සමුද්‍රීය පරිසර ආරක්ෂණය පිළිබඳ වර්තමානයේදී පවතින ගැටළු සාකච්ඡා කිරීම සඳහා වන විශේෂ කාරක සභා රැස්වීම. | 2022 මාර්තු 25 |
| 02 | ශ්‍රී ලංකාව වර්තමානයේ මුහුණ දෙමින් සිටින මන්දපෝෂණ තත්වය අඩු කිරීම හා ආහාර අර්බුදය විසඳීම සඳහා ගත හැකි ක්‍රියාමාර්ග පිළිබඳව සොයා බැලීම සඳහා වූ විශේෂ කාරක සභා රැස්වීම. | 2022 ජූනි 10 |
| 03 | ශ්‍රී ලංකාවේ අධ්‍යාපන පද්ධතිය මත ක්‍රියාත්මක කිරීමට නියමිත අනාගත අධ්‍යාපන සැලසුම් සහ අධ්‍යාපන පද්ධතිය මත කොවිඩ් වසංගතයේ බලපෑම සහ පවතින ආර්ථික අර්බුදයේ බලපෑම පිටුදැකීම සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග විමර්ශනය කිරීමේ විශේෂ රැස්වීම. | 2022 ජූනි 15 |
| 04. | වර්තමාන ආර්ථික අර්බුදය හමුවේ රාජ්‍ය ආදායම වැඩි කර ගැනීම සඳහා ගත යුතු පියවර සම්බන්ධයෙන් සාකච්ඡා කිරීම සඳහා වන විශේෂ කාරක සභා රැස්වීම | 2022 ජූනි 15 |
| 05. | ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුවේ බලපත්‍ර නිකුත් කිරීමේ ක්‍රියාවලිය විධිමත් කිරීම සඳහා පරිගණක මෘදුකාංග පද්ධතියක් හඳුන්වා දීමේ හැකියාව පිළිබඳ සාකච්ඡා කිරීම සඳහා කැඳවූ විශේෂ කාරක සභා රැස්වීම | 2022 ජූනි 16 |
| 06. | ශ්‍රී ලංකාවේ පවතින ආර්ථික අර්බුදය යටතේ පවතින අභියෝගවලට මුහුණ දීම සඳහා පොදු ප්‍රවාහන පහසුකම්වල කාර්යක්ෂමතාව ඉහළ නැංවීමට ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යාංශයේ වත්මන් සහ අනාගත සැලසුම් විමර්ශනය කිරීමේ විශේෂ රැස්වීම | 2022 ජූලි 05 |

## විමර්ශනය කරන ලද එක් එක් ආයතනවල හඳුනාගත් ප්‍රධාන ගැටළු , නිරීක්ෂණ, නිර්දේශ / නියෝග

| | | |
|---|---|---|
| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | - ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) /ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම්<br><br>- කාරක සභාවේ නිරීක්ෂණ, නිර්දේශ / නියෝග |
| **කොළඹ මහා නගර සභාව**<br>**විමර්ශනය කරන ලද දිනය - 2022 මාර්තු 22** | | |
| ❖ කැඳවන ලද ආයතන -<br>රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය,<br>පළාත් සභා හා පළාත් පාලන කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය,<br>බස්නාහිර පළාත් සභාව, කොළඹ මහා නගර සභාව | | |
| 01. | ***ක්‍රියාකාරී සැලසුම්***<br><br>කොළඹ මහා නගර සභාවේ 2020 හා 2021 වර්ෂ සඳහා පිළියෙල කළ ක්‍රියාකාරී සැලසුම් 2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ සඳහන් උපදෙස් ප්‍රකාරව පිළියෙල කර නොතිබීම සහ ඒ සඳහා අනුමැතිය ලබාගෙන නොතිබීම. | රජයේ ප්‍රතිපත්තිය අනුව වාර්ෂිකව අදාළ ක්‍රියාකාරකම් (Activities) හඳුනා ගන්නා බව හා ඊට අදාළව අය වැයත් ඉන් පසු ක්‍රියාකාරී සැලැස්මත් (Action Plan) පිළියෙල කරනු ලබන බව ග.නි ප්‍රකාශ කළේය.<br><br>සිය අයවැය පදනම් කරගෙන සකස් කරනු ලබන ක්‍රියාකාරී සැලැස්ම අනුමැතිය සඳහා මහා සභාවට ඉදිරිපත් කළ යු ුතු බවත්, එම අනුමැතිය ලැබුණු පසු අදාළ නිලධාරීන් විසින් එම සැලැස්ම ක්‍රියාත්මක කළ යුතු බවත් ග.නි. වැඩිදුරටත් ප්‍රකාශ කළේය. එසේ වුවද, 2020 වර්ෂයට අදාළව ක්‍රියාකාරී සැලැස්ම සකස් කළද මහා සභාව තුළ එය අනුමත නොවූ බවත්, මහා සභාව තුළ සම්මත වූ අයවැය යෝජනා ප්‍රකාරව රාජකාරි කටයුතු සිදු කළ බවත් ඔහු ප්‍රකාශ කළේය.<br><br>2020/2021 වර්ෂයන්ට අදාළව කොළඹ මහා නගර සභාව විසින් සකස් කළ |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | - ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) /ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම්<br><br>- කාරක සභාවේ නිරීක්ෂණ, නිර්දේශ / නියෝග |
|---|---|---|
| | 2022 වර්ෂය සඳහා පිළියෙල කරන ලද ක්‍රියාකාරී සැලැස්ම සඳහා ද 2022 මාර්තු 07 දින වන විටත් අනුමැතිය ලබා නොගැනීම. | ක්‍රියාකාරී සැලසුම් රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව විසින් හඳුන්වා දුන් අංක 01/2014 චක්‍රලේඛයේ උපදෙස් ප්‍රකාරව පිළියෙල කර නොතිබූ බවත් 2022 වර්ෂය සඳහා වූ ක්‍රියාකාරී සැලැස්ම එම උපදෙස්වලට අනුගතව පිළියෙල කර ඇති අතර, 2022 මාර්තු 31 දින අනුමැතිය සඳහා මහා සභාවට ඉදිරිපත් කිරීමට නියමිත බවත් ග.නි. ප්‍රකාශ කළේය.<br><br>**<u>නිර්දේශ</u>**<br><br>- රාජ්‍ය මූල්‍ය චක්‍රලේඛවලට අනුකූලව ඉදිරි වර්ෂ සඳහා ක්‍රියාකාරී සැලැස්ම සකස් කර නියමිත කාලසීමාව තුළ මහා සභාවේ අනුමැතිය ලබාගෙන, එය ක්‍රියාත්මක කරන ලෙස ප්‍ර.ග.නි/ග.නි. වෙත කාරක සභාව නියෝග කළේය |
| 02. | ***<u>අභ්‍යන්තර විගණන වාර්තා</u>***<br><br>2020 වර්ෂය සඳහා අභ්‍යන්තර විගණන වාර්තා 24ක්ද 2021 වර්ෂය සඳහා වාර්තා 21ක්ද ඉදිරිපත් කර තිබූ අතර, 2020 වර්ෂයේ වාර්තා 4ක හා 2021 වර්ෂයේ වාර්තා 1ක ඇතුළත් නිර්දේශ පමණක්, 2022 මාර්තු 01 දින වන විට ක්‍රියාත්මක කර තිබීම. | 2020 වර්ෂයේ විගණන වාර්තා 24න් 10ක් නිවැරදි කර ඇති බව හා වාර්තා 9ක නිර්දේශ ක්‍රියාත්මක කිරීම සඳහා අදාළ දෙපාර්තමේන්තු ප්‍රධානීන් වෙත යවා ඇති බව මෙන්ම, එක් විගණන වාර්තාවක් ව්‍යාජ පෙත්සමක් මත කැඳවූ වාර්තාවක් බව අභ්‍යන්තර විගණන අංශය විසින් දැනුම් දී ඇති බවද ග.නි. ප්‍රකාශ කළේය.<br><br>2021 වර්ෂයේ විගණන වාර්තා 21න් 10ක් මේ වන විට නිවැරදි කර ඇති බවත් වාර්තා 5කට අදාළව මූලික විමර්ශන ආරම්භ කර ඇති බවත් වාර්තා 2කට අදාළව නීති ක්‍රියාමාර්ග ගැනීම සඳහා නීති |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | **- ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) /ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම්**<br><br>**- කාරක සභාවේ නිරීක්ෂණ, නිර්දේශ / නියෝග** |
|---|---|---|
| | ***<u>අභ්‍යන්තර විගණන අංශයේ පුරප්පාඩු</u>***<br><br>කොළඹ මහා නගර සභාවේ අභ්‍යන්තර විගණන අංශයේ පවතින පුරප්පාඩු පිළිබඳවද කාරක සභාවේ අවධානය යොමු විය. | නිලධාරී වෙත යොමු කළ බවත් ග.නි. ප්‍රකාශ කළේය. තවද, එක් විගණන වාර්තාවකට අදාළව නිලධාරියකු විසින් මානව හිමිකම් කොමිසමේ පැමිණිල්ලක් ගොනු කර ඇති බැවින් මේ සම්බන්ධයෙන් ඉදිරි ක්‍රියාමාර්ග ගැනීම සඳහා එම විගණන වාර්තාව ප්‍රධාන ලේකම් වෙත යොමු කර ඇති බවද කාරක සභාව හමුවේ අනාවරණය විය.<br><br><u>නිර්දේශ</u><br><br>- පළාත් සභාවට බඳවා ගනු ලබන සංවර්ධන නිලධාරීන් තාවකාලික පදනම මත අභ්‍යන්තර විගණන නිලධාරීන් ලෙස සේවයට අනුයුක්ත කිරීමේ හැකියාවක් පවතින්නේද යන්න සොයා බලන ලෙස කාරක සභාව ප්‍රධාන ලේකම්තුමිය වෙත නියෝග කළේය.<br><br>පවතින ඉංජිනේරුවරුන්ගේ පුරප්පාඩු පිරවීම ඉදිරි සතිය තුළදී සිදු කළ හැකි බව අමාත්‍යාංශ ලේකම්තුමා කාරක සභාව හමුවේ සඳහන් කළේය |
| 03. | ***<u>සේවක පුරප්පාඩු</u>***<br><br>කොළඹ මහා නගර සභාවේ සේවක පුරප්පාඩු සංඛ්‍යාව | මේ වන විට මුළු නගර සභාවේම පුරප්පාඩු 3063ක් පවතින බවත්, මෙම පුරප්පාඩු සම්බන්ධයෙන් ගරු ආණ්ඩුකාරතුමා සමඟද සාකච්ඡා කළ බවත් ප්‍ර.ග.නි ප්‍රකාශ කළේය. එසේම මධ්‍යම රජයේ ආයතනවලට සාපේක්ෂව පළාත් පාලන ආයතනවල නිලධාරීන් සේවයට බඳවා ගැනීමේදී හා එම ආයතනවල සේවය කිරීමේදී පවතින යම් |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | **- ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) /ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම්**<br><br>**- කාරක සභාවේ නිරීක්ෂණ, නිර්දේශ / නියෝග** |
|---|---|---|
| | <u>*සේවක සංඛ්‍යාව*</u><br><br>බස්නාහිර පළාත් සභාවේ සේවක සංඛ්‍යාව සඳහා සංශෝධනයක් (Carder Revision) සිදු කිරීම | ගැටළු හේතුවෙන් සේවය අත් හැර යාමේ ප්‍රවණතාවයක් පවතින බව ප්‍ර.ග.නි./ග.නි. ප්‍රකාශ කළේය.<br><br><u>නිර්දේශ</u><br><br>- රාජ්‍ය සේවයේ විශාල නිලධාරීන් පිරිසක් සිටියද ඇතැම් අත්‍යවශ්‍ය සේවාවන් සඳහා නිලධාරීන්ගේ හිඟයක් පවතින බව පෙන්වා දුන් කාරක සභාව රාජ්‍ය සේවකයන්ගේ කාර්යක්ෂමතාවය වර්ධනය කිරීම හා ඵලදායීව සේවය සඳහා යොදා ගැනීමේ අවශ්‍යතාවය අවධාරණය කළේය.<br><br>බස්නාහිර පළාත් සභාවේ සේවක සංඛ්‍යාව සඳහා සංශෝධනයක් (Carder Revision) සිදු කිරීම සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් ඉල්ලීම් කර ඇති බව ග.නි. ප්‍රකාශ කළේය.<br><br>එසේම සේවක සංඛ්‍යාව සංශෝධනය (Carder Revision) කිරීම සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් මුදල් කොමිෂන් සභාව, වැටුප් කොමිෂන් සභාව සහ රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය සමඟ මේ වන විට සාකච්ඡා පවත්වා ඇති බව අනාවරණය විය. කෙසේ වෙතත් අංක 2/2020 චක්‍රලේඛයට අනුව ප්‍රාථමික සේවා ගණයේ තනතුරු සඳහා බඳවා |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | **- ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) /ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම්**<br><br>**- කාරක සභාවේ නිරීක්ෂණ, නිර්දේශ / නියෝග** |
|---|---|---|
| | | ගැනීම් සිදු කිරීමට කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවට බලයක් නොමැති බවත් එම බලය බහුකාර්ය සංවර්ධන කාර්යසාධක බලකා දෙපාර්තමේන්තුවට පවරා ඇති බැවින් මෙම ගැටළුව බහු කාර්ය සංවර්ධන කාර්යසාධක බලකා දෙපාර්තමේන්තුව සමඟ සාකච්ඡා කළ යුතු බවත් මෙහිදී අනාවරණය විය.<br><br>තවද, කොළඹ මහ නගර සභාවේ පහළ ශ්‍රේණිවල තනතුරු සඳහා, ප්‍රාථමික සේවා ගණයේ තනතුරු කාණ්ඩයෙන් බඳවා නොගන්නා බැවින් එම පහළ ශ්‍රේණිවල තනතුරු සඳහා සේවකයින් බඳවා ගැනීමට නගර සභාවට අනුමැතිය ලබා දෙන මෙන් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් ඉල්ලීම් කර ඇති බව ග.නි. කාරක සභාව හමුවේ ප්‍රකාශ කළේය.<br><br>**<u>නිර්දේශ</u>**<br><br>- කොළඹ මහා නගර සභාවේ පවතින සේවක පුරප්පාඩු හා ඒ අතුරින් කඩිනමින් පිරවිය යුතු තනතුරු, එම පුරප්පාඩු පිරවීමට අදාළ යෝජනා ක්‍රියාත්මක කිරීමට පවතින බාධාවන් හා ඊට විසඳුම් මොනවාද යන්නත් අනවශ්‍ය තනතුරු වෙතොත් ඒ පිළිබඳවද තොරතුරුද ඇතුළත් විස්තරාත්මක වාර්තාවක් 2022.04.20 දිනට පෙර කාරක සභාව වෙත ඉදිරිපත් කරන ලෙස කාරක සභාව, |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | - ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) /ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම්<br><br>- කාරක සභාවේ නිරීක්ෂණ, නිර්දේශ / නියෝග |
|---|---|---|
| | | කොළඹ මහා නගර සභාවේ ප්‍ර.ග.නි./ග.නි. වෙත නියෝග කළේය. |
| 04. | ***හිඟ වරිපනම්***<br><br>කොළඹ මහා නගර සභාවේ 2020 දෙසැම්බර් 31 දිනට මුළු හිඟ වරිපනම් ශේෂය රු.3,927,748,364/- ක් විය. එම ප්‍රමාණය තුළ හිඟ වරිපනම් ශේෂය රු.500,000/- ඉක්මවූ දේපළ ඒකක 990ක් පැවතුණ අතර එහි හිඟ වරිපනම් වටිනාකම රු.1,733,724,967/- ක් බව සඳහන් විය. එසේම, රු.1000,000ට වැඩි හිඟ වරිපනම් ශේෂ පවතින දේපළ 353කට අදාළව අවුරුදු 5ට වැඩි මුළු හිඟ ශේෂ රු.649,163,162/- ක් වීම. | 2020 වර්ෂයේ කොළඹ මහ නගර සභාවේ මුළු සත්‍ය ආදායම රු. බිලියන 11.1ක් හා ඇස්තමේන්තුගත ආදායම රු. බිලියන 16 ක් බව ග.නි. ප්‍රකාශ කළේය. ඇස්තමේන්තුගත මුළු වරිපනම් ආදායමෙන් 80%ක ප්‍රමාණයක් වාර්ෂිකව එකතු කිරීමේ හැකියාවක් පවතින බවත්, 20% ක් වූ හිඟ ආදායම රජයේ දෙපාර්තමේන්තු, රජයේ සංස්ථා දේපළ හා පුද්ගලික දේපළ වලින් යුක්ත බවද කාරක සභාව හමුවේ අනාවරණය විය.<br><br>2016 වර්ෂයේ සිට 2020 වර්ෂය දක්වා හිඟ ආදායම් අඛණ්ඩව වර්ධනය වී ඇති බව නිරීක්ෂණය විය.<br><br>**නිර්දේශ**<br><br>- හිඟ ආදායම් අයකර ගැනීම මඟින් නගර සභාවේ මුළු ආදායම වැඩිකර ගැනීමට නිශ්චිත ක්‍රමවේදයක් අනුගමනය කිරීමේ අවශ්‍යතාවය කාරක සභාව අවධාරණය කළේය. |
| 05. | ***ආදායම් එකතු කිරීම***<br><br>නගර සභාවේ ආදායම් එකතු කිරීම වඩාත් කාර්යක්ෂම කිරීම සඳහා ගෙන ඇති පියවර | නගර සභාවේ ආදායම් එකතු කිරීම වඩාත් කාර්යක්ෂම කිරීම සඳහා කොරියානු ජාත්‍යන්තර සහයෝගිතා ඒජන්සිය (KOIKA- Korea International Cooperation Agency ) හා ඒකාබද්ධව බදු තොරතුරු පද්ධතියක් (Tax Information System) කඩිනමින් |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | **- ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) /ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම්**<br><br>**- කාරක සභාවේ නිරීක්ෂණ, නිර්දේශ / නියෝග** |
|---|---|---|
| | | ආරම්භ කිරීමට අවශ්‍ය පියවර ගෙන ඇති බව ප්‍ර.ග.නි. ප්‍රකාශ කළාය. ඒ හරහා වාර්ෂිකව රු. බිලියන 20ක ආදායමක් ඉදිරියේදී ළඟා කර ගැනීමට අපේක්ෂිත බව ප්‍ර.ග.නි කාරක සභාව හමුවේ වැඩිදුරටත් සඳහන් කළාය. තවද, මහජන සේවාවන් කාර්යක්ෂමව සැපයීම සඳහා තනි කවුළු (Single Window Counter) විවෘත කර ඇති බව හා මහා නගර සභාවේ සැලසුම් අංශයේ (Planning Division) සේවාවන් මාර්ගගත (Online) ක්‍රමවේදය හරහා සැපයීමට අවශ්‍ය කටයුතු සිදුකර ඇති බවද ප්‍ර.ග.නි./ග.නි. ප්‍රකාශ කළේය.<br><br><u>**නිර්දේශ**</u><br><br>- කොළඹ මහා නගර සභාවේ සමස්ත ආදායම, සමස්ත වියදම හා හිඟ ආදායම් වෙන් වෙන් වශයෙන් (breakdown) මෙන්ම මහා නගර සභාව විසින් ලබා දෙනු ලබන මහජන ආධාර පිළිබඳ විස්තර ඇතුළත් විශ්ලේෂණාත්මක පරිගණක ඉදිරිපත් කිරීමක් (Power Point Presentation) මීළඟට පැවැත්වීමට නියමිත රැස්වීමේදී කාරක සභාව වෙත ඉදිරිපත් කරන ලෙස කොළඹ මහ නගර සභාවේ ප්‍ර.ග.නි./ග.නි. වෙත කාරක සභාව නියෝග කළේය. |

| | | |
|---|---|---|
| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | - ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) /ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම්<br><br>- කාරක සභාවේ නිරීක්ෂණ, නිර්දේශ / නියෝග |
| **2021.11.19 දින පරිසර අමාත්‍යාංශය රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව හමුවට කැඳවූ අවස්ථාවේ ගත් තීරණ ප්‍රකාරව පැවැත්වූ ශ්‍රී ලංකාවේ අපද්‍රව්‍ය බැහැරකිරීම සහ සමුද්‍රීය පරිසර ආරක්ෂණය පිළිබඳ වර්තමානයේදී පවතින ගැටළු සාකච්ඡා කිරීම සඳහා වූ විශේෂ කාරක සභා රැස්වීම**<br><br>**විමර්ශනය කරන ලද දිනය - 2022 මාර්තු 25** | | |
| ❖ කැඳවන ලද ආයතන -<br>පරිසර අමාත්‍යාංශය, නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය, නාගරික සංවර්ධන, කසල බැහැරකිරීම් හා ප්‍රජා පවිත්‍රතා රාජ්‍ය අමාත්‍යාංශය, වෙරළ සංරක්ෂණ හා පහත් බිම් සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය, මධ්‍යම පරිසර අධිකාරිය, සමුද්‍රීය පරිසර සංරක්ෂණ අධිකාරිය | | |
| 1. | ***<u>අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය</u>***<br><br>පරිසර අමාත්‍යාංශය මඟින් අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ ජාතික ප්‍රතිපත්තියක් (2020) සකස් කර තිබුණද එම ජාතික ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමේ සැලැස්මක් සකස් කර නොතිබීම හා පසුවිපරම් කටයුතු කිරීමේ ක්‍රමවේදයක් හඳුනාගෙන නොතිබීම. | පරිසර අමාත්‍යාංශය මඟින් සැකසූ “ජාතික පරිසර ප්‍රතිපත්තිය” සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය හිමිවී ඇති අතර එය ක්‍රියාත්මක කිරීමේ මෙවලම ලෙස “ජාතික පරිසර ක්‍රියාකාරි සැලැස්ම” සකස්කර අවසන්ව ඇති බව ප්‍ර.ග.නි. සඳහන් කළේය. ජාතික අපද්‍රව්‍ය කළමනාකරණ ජාතික සැලැස්මද ඉහත කී ජාතික පරිසර ක්‍රියාකාරි සැලැස්මට ඇතුළත් බවද මුද්‍රණ කටයුතුවලින් පසු නුදුරේදී අදාළ වගකිව යුතු ආයතන සම්බන්ධීකරණය කර වගකීම් පැවරීම සිදු කළ හැකි බවද ප්‍ර.ග.නි. සඳහන් කළේය.<br><br>**<u>නිර්දේශ</u>**<br><br>අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා අදාළ සියලු ආයතන අතර නිසි සම්බන්ධීකරණයක් ඇති කරලමින් මනා |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | **- ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) /ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම්**<br><br>**- කාරක සභාවේ නිරීක්ෂණ, නිර්දේශ / නියෝග** |
|---|---|---|
| | | ක්‍රියාකාරි සැලැසුමක් හා පසු විපරම් කිරීමේ ක්‍රමවේදයක් සකස්කර එය ක්‍රියාවේ යෙදවීමේ ප්‍රගතිය පිළිබඳ වාර්තාවක් ඉදිරිපත් කරන ලෙස කාරක සභාව ප්‍ර.ග.නි./ග.නි.ට නියෝග කළේය.<br><br>අපද්‍රව්‍ය කළමනාකරණය සම්බන්ධයෙන් වැඩි බලතල හිමි හා වැඩි කාර්යභාරයක් ඉටු කරන පළාත් පාලන ආයතන මෙම අපද්‍රව්‍ය කළමනාකරණ ජාතික සැලැස්මට සම්බන්ධ වීම අනිවාර්ය සාධකයක් විය යුතු බවද කාරක සභාව අවධාරණය කළේය. |
| 2. | ***<u>අන්තරායකර අපද්‍රව්‍ය බැහැර කිරීම</u>***<br><br>අන්තරායකර අපද්‍රව්‍ය පරිසර හිතකාමි ලෙස බැහැර කිරීම සඳහා පහසුකම් සැපයීමට ගෙන ඇති ක්‍රියාමාර්ග | අපද්‍රව්‍ය නිපදවන හා බැහැර කරන ආයතන සඳහා මධ්‍යම පරිසර අධිකාරිය විසින් බලපත්‍ර නිකුත්කිරීමේ ක්‍රමවේදය හරහා අන්තරායකර අපද්‍රව්‍ය පරිසර හිතකාමී ලෙස බැහැර කිරීම නියාමනය කිරීම සිදු කරන බව ග.නි. ප්‍රකාශ කළේය. ඊට අදාළ පහසුකම් සැලැසීමේ යාන්ත්‍රණයක් සැකසීමට තමන්ට බලතල නොමැති බවද ග.නි. වැඩිදුරටත් ප්‍රකාශ කළේය.<br><br>මේ සම්බන්ධයෙන් රාජ්‍ය නිලධාරීන් මැදිහත්වී ක්‍රියාත්මක විය යුතු බව පෙන්වා දුන් කාරක සභාව, මෙතෙක් එලෙස ක්‍රියාත්මක නොවීම පිළිබඳ සිය අප්‍රසාදය පළ කළේය. |
| 3. | ***<u>කොළඹ අග නගර ආශ්‍රිත නාගරික සංවර්ධන ව්‍යාපෘතිය</u>***<br><br>කොළඹ අග නගර ආශ්‍රිත නාගරික සංවර්ධන ව්‍යාපෘතිය | විශ්වසනීය තොරතුරු මත පදනම් නොවී ව්‍යාපෘති සඳහා ආයෝජනය කිරීම පිළිබඳ කාරක සභාව සිය අප්‍රසාදය පළ කළේය. |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | **- ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) /ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම්**<br><br>**- කාරක සභාවේ නිරීක්ෂණ, නිර්දේශ / නියෝග** |
|---|---|---|
| | (MCUDP - අරුවක්කාරු) සඳහා සැලැසුම් සකස් කරද්දී ඒ සඳහා දිනකට මෙට්‍රික් ටොන් 1200ක ධාරිතාවයක කසල ලැබේ යැයි නිගමනය කර ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර ඇතත් දැනට සත්‍ය වශයෙන්ම ලැබෙන්නේ දිනකට කසල මෙට්‍රික් ටොන් 450ක් පමණක් බව කාරක සභාවේදී අනාවරණය වීම. | <u>නිර්දේශ</u><br><br>අපද්‍රව්‍ය කළමනාකරණය සම්බන්ධයෙන් අදාළ වගකිව යුතු සියලු ආයතන සම්බන්ධ කරමින් ජාතික මට්ටමේ දත්ත පද්ධතියක් පවත්වාගෙන යාමේ වැදගත්කම මතු කළ කාරක සභාව ඒ සඳහා මැදිහත්වීම අදාළ අමාත්‍යාංශවල වගකීම බවද අවධාරණය කළේය. |
| 4. | ***<u>කොළඹ අග නගර ආශ්‍රිත නාගරික සංවර්ධන ව්‍යාපෘතියේ වර්තමාන තත්ත්වය</u>***<br><br>ඇ.ඩො.මි.120ක වටිනාකමකට ඇස්තමේන්තුගත කොළඹ අග නගර ආශ්‍රිත නාගරික සංවර්ධන ව්‍යාපෘතියේ (MCUDP - අරුවක්කාරු) ප්‍රගතිය පරීක්ෂා කිරීමේදී 2020 දෙසැම්බර් 31 දිනට ඇ.ඩො.මි. 8.271ක් වූ දුම්රිය එන්ජින් 4ක් පමණක් මිලට ගෙන තිබීම හා මෙම ව්‍යාපෘතියේ වර්තමාන තත්ත්වය | මෙම ව්‍යාපෘතිය සඳහා අපේක්ෂිත කසල ධාරිතාවය නොලැබෙන තත්ත්වයක් තුළ හා ඉහත සඳහන් දුම්රිය එන්ජින් 2ක් දුම්රිය දෙපාර්තමේන්තුව විසින් මගී ප්‍රවාහනයට යොදාගෙන තිබීම තුළ මෙම ව්‍යාපෘතියේ මුල් සැලැසුම් ක්‍රියාත්මක කළ නොහැකි තත්ත්වයක් උද්ගතව ඇති බව කාරක සභාව නිරීක්ෂණය කළේය. |
| 5. | ***<u>අපද්‍රව්‍ය කළමනාකරණයට ජාතික ක්‍රියාකාරි යාන්ත්‍රණයක් සකස් කිරීම සඳහා පත් කළ කමිටුව</u>***<br>අපද්‍රව්‍ය කළමනාකරණයට පුළුල් ජාතික ක්‍රියාකාරි | එම ක්‍රියාකාරි සැලැස්මේ ප්‍රතිපාදන අවශ්‍ය කෙරෙන අංශ සඳහා අනුමැතිය ඉල්ලා තමන් ඉදිරිපත් කළ අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවට මෙතෙක් අනුමැතිය හිමි නොවූ බව ප්‍ර.ග.නි. සඳහන් කළේය. |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | **- ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) /ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම්**<br><br>**- කාරක සභාවේ නිරීක්ෂණ, නිර්දේශ / නියෝග** |
|---|---|---|
| | යාන්ත්‍රණයක් සකස් කිරීම සඳහා 2020 වර්ෂයේදී ජනාධිපති ලේකම් විසින් සියලු වගකිව යුතු අමාත්‍යාංශ නිලධාරීන් හා විශේෂඥයන්ගේ සහභාගීත්වයෙන් පත් කළ කමිටුව හා එහි කමිටු වාර්තාවේ සඳහන් ක්‍රියාකාරි සැලැස්ම ක්‍රියාත්මක කිරීම. | **<u>නිර්දේශ</u>**<br><br>ඉහත කී ජනාධිපති කමිටු වාර්තාව මත පදනම්ව, අදාළ යෝජනා ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය ප්‍රතිපාදන ලබාදීමේ හැකියාව පිළිබඳ සොයා බලන ලෙස කාරක සභාව මහා භාණ්ඩාගාරයේ නිලධාරීන්ට නියෝග කළේය. |
| 6. | ***<u>පොලික්ලෝරිනේටඩ් බයිෆීනයිල් (PCB) අපද්‍රව්‍ය උපකරණ පරිසර හිතකාමී ලෙස කළමනාකරණය හා බැහැරකිරීම</u>***<br><br>2015 සිට 2020 දක්වා වූ කාල පරිච්ඡේදය සඳහා, ගෝලීය පාරිසරික පදනම යටතේ, පොලික්ලෝරිනේටඩ් බයිෆීනයිල් (PCB) අපද්‍රව්‍ය හා පොලික්ලෝරිනේටඩ් අඩංගු උපකරණ පරිසර හිතකාමී ලෙස කළමනාකරණය හා බැහැරකිරීමේ ව්‍යාපෘතිය වෙනුවෙන් ප්‍රදාන ලෙස ඇ.ඩො. 4,725,000/-ලැබී ඇත. මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් 2021 දෙසැම්බර් 31 දින වන විට පරිසර අමාත්‍යාංශය විසින් දරා තිබූ සමුච්චිත වියදම රු. 124,501,957ක් වුවත් PCB පරිසර හිතකාමී ලෙස බැහැර කිරීම සම්පූර්ණ වී නොතිබීම හා PCB මඟින් දූෂිත උපකරණ | මෙම ව්‍යාපෘතියට අදාළව සියලු PCB අඩංගු උපකරණ සියල්ල එකතු කර අවසන් බවත්, ඒවා නිසි පරිදි බැහැර කිරීමට ක්‍රමවේදයක් සකසා ඇති බවත්, 2023 වසර වන විට මෙම අපද්‍රව්‍ය නිසි පරිදි බැහැර කිරීම අවසන් කිරීමට නියමිත බවත් ග.නි. ප්‍රකාශ කළේය. |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | **- ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) /ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම්**<br><br>**- කාරක සභාවේ නිරීක්ෂණ, නිර්දේශ / නියෝග** |
|---|---|---|
| | බැහැර කිරීමට නිසි මාර්ගෝපදේශ නිකුත් කිරීම නිරීක්ෂණය නොවීම. | |
| 7. | ***<u>ඝන අපද්‍රව්‍ය බැහැර කිරීමේ පහසුකම් ඉදිරිපත් කිරීමේ ව්‍යාපෘතිය</u>***<br><br>කොරියානු ආර්ථික සංවර්ධන සහයෝගිතා අරමුදල - (EDCF) ණය ගිවිසුම් අංක SRI-21 යටතේ ක්‍රියාත්මක වූ ඝන අපද්‍රව්‍ය බැහැර කිරීමේ පහසුකම් ඉදිරිපත් කිරීමේ ව්‍යාපෘතිය 2020 ජූලි දක්වාම සිවිල් කොන්ත්‍රාත්කරුවකු තෝරාගැනීමේ ප්‍රසම්පාදනය අවසන් නොවීම හා ඒ හේතුවෙන් අමාත්‍ය මණ්ඩල තීරණය මත 2020 ඔක්තෝබර් මස ව්‍යාපෘතිය අවසන් කර තිබීම හා ඊට විකල්ප හඳුනාගෙන නොතිබීම. | මෙහි සිවිල් ඉදිකිරීම් කොන්ත්‍රාත්කරුවන් ලෙස තෝරා ගැනීම සඳහා නියමිතව තිබුණේ කොරියානු කොන්ත්‍රාත්කරුවන් වූ නමුත් එහි බැඳුම්කරයේ ගැටළුවක් හේතුවෙන් ටෙන්ඩර් ප්‍රදානය ප්‍රමාද වූ බව ප්‍ර.ග.නි./ග.නි. ප්‍රකාශ කළේය. එසේම, අමාත්‍ය මණ්ඩල තීරණ ප්‍රකාරව මෙම ව්‍යාපෘතිය අවසන් කර, ජනාධිපති ලේකම් විසින් අමාත්‍යාංශ නිලධාරින් හා විශේෂඥයන්ගේ සහභාගීත්වයෙන් පත් කළ කමිටුවේ නිර්දේශ ලබා ගැනීම සිදු කළ බවත් ප්‍ර.ග.නි./ග.නි. සඳහන් කළේය. ඒ අනුව, මෙම කමිටු නිර්දේශ ප්‍රකාරව මෙම ව්‍යාපෘතිය සඳහා විකල්ප ක්‍රියාමාර්ග අනුගමනය කිරීමට බලාපොරොත්තු වන බව ප්‍ර.ග.නි./ග.නි. ප්‍රකාශ කළේය.<br><br>**<u>නිර්දේශ</u>**<br><br>මෙම ව්‍යාපෘතිය සම්බන්ධයෙන් ජනාධිපති ලේකම් විසින් පත් කළ විශේෂඥ කමිටු වාර්තාවෙහි නිර්දේශ පිළිබඳව හා මෙම ඝන අපද්‍රව්‍ය ව්‍යාපෘතිය සම්බන්ධයෙන් වන ප්‍රගතිය පිළිබඳ වාර්තාවක් ඉදිරිපත් කරන ලෙස කාරක සභාව ප්‍ර.ග.නි./ග.නි.ට නියෝග කළේය. |
| 8. | ***<u>කොම්පෝස්ට්වල ගුණත්වය</u>***<br><br>1980 අංක 47 දරන ජාතික පාරිසරික පනතේ 23(අ) | ඝන අපද්‍රව්‍ය කළමනාකරණය යටතේ කොම්පෝස්ට් නිපදවීම සිදු කරන්නේ එම අපද්‍රව්‍ය අවිධිමත්ව පරිසරයට බැහැර කිරීමෙන් සිදුවන පරිසර දූෂණය |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | - ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) /ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම්<br><br>- කාරක සභාවේ නිරීක්ෂණ, නිර්දේශ / නියෝග |
|---|---|---|
| | වගන්තිය අනුව 2008.01.25 දින නිකුත් කරන ලද 1533/16 දරන ගැසට් පත්‍රය යටතේ දිස්ත්‍රික්ක 24 තුළ 2021 වර්ෂය වන විට කොම්පෝස්ට් අංගන 152ක් ලියාපදිංචි කර ඇති අතර එම කොම්පෝස්ට් අංගනවල මාසික ධාරිතාවයෙන් මෙට්‍රික් ටොන් 10,052ක ප්‍රමාණයක් ඌන උපයෝජිත මට්ටමේ පැවතීම හා කොම්පෝස්ට් අංගන 84ක කොම්පෝස්ට්වල ගුණත්වය ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයේ ප්‍රමිතීන්ට අනුකූලව පරීක්ෂාවට ලක් නොවීම. | වැළැක්වීම සඳහා පමණක් බවත්, කෘෂිකර්මාන්තය සඳහා එම කොම්පෝස්ට් භාවිතා කරන්නේ නම් ඒවාට අමතර පෝෂක එකතු කිරීම සිදු කළ යුතු බවත් ග.නි. ප්‍රකාශ කළේය. ඒ සඳහා කෘෂිකර්ම දෙපාර්තමේන්තුව සම්බන්ධ විය යුතු බව සඳහන් කළ ග.නි. එවන් නියාමනයක් සිදු කිරීම තම වපසරියෙන් බැහැරව පවතින බවත් සඳහන් කළේය. එසේම, කොම්පෝස්ට්වල තත්ත්ව නියාමනයට පරිසර පනතේ විධිවිධාන සලසා නොමැති බවද කාරක සභාවේදී අනාවරණය විය.<br><br>**<u>නිර්දේශ</u>**<br><br>කෙසේ වෙතත්, ජාතික පරිසර ප්‍රතිපත්තියට අනුව ද මෙම කොම්පෝස්ට් තත්ත්ව නියාමන කර්තව්‍යය සඳහා කෘෂිකර්ම අමාත්‍යාංශය හා කෘෂිකර්ම දෙපාර්තමේන්තුව සම්බන්ධ විය යුතු බවත්, සියලුම සම්බන්ධීකරණ කටයුතු මෙමඟින් සිදු කළ යුතු බවත් කාරක සභාව අවධාරණය කළේය.<br><br>කොම්පෝස්ට් පොහොරවල ගුණාත්මකභාවය හා ප්‍රමිතිය පිළිබඳ කාරක සභාව මතු කළ ගැටළු සම්බන්ධයෙන් හා ඒ සම්බන්ධයෙන් අමාත්‍යාංශ මට්ටමින් ගත හැකි ක්‍රියාමාර්ග සම්බන්ධයෙන් වාර්තාවක් හා දැනට අක්‍රීය මට්ටමින් පවතින කොම්පෝස්ට් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් හෝ ඒ වෙනුවට ගනු ලබන විකල්ප ක්‍රියාමාර්ග |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | **- ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) /ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම්**<br><br>**- කාරක සභාවේ නිරීක්ෂණ, නිර්දේශ / නියෝග** |
|---|---|---|
| | | සම්බන්ධයෙන් වාර්තාවක් ඉදිරිපත් කරන ලෙස කාරක සභාව ප්‍ර.ග.නි./ග.නි.ට නියෝග කළේය. |
| 9. | ***සමුද්‍රීය පරිසර ආරක්ෂණය සම්බන්ධයෙන් වගකීමට බැඳෙන ආයතන අතර සම්බන්ධීකරණයක් නොමැති වීම***<br><br>සමුද්‍රීය පරිසර ආරක්ෂණය සම්බන්ධයෙන් වගකීමට බැඳෙන ප්‍රධාන ආයතන අතර සම්බන්ධීකරණයක් නොමැති වීම නිසා කාලීන හා ඵලදායි තීරණ ගැනීමට අපොහොසත් වීම | **නිර්දේශ**<br><br>සමුද්‍රීය පරිසර ආරක්ෂණය සම්බන්ධයෙන් වගකිව යුතු ආයතන අතර සම්බන්ධීකරණ යාන්ත්‍රණයක් නිර්මාණය කරන ලෙසට කාරක සභාව ප්‍ර.ග.නි./ග.නි.ට නිර්දේශ කළේය. |
| 10. | ***එක්ස්ප්‍රස් පර්ල් නෞකා අනතුර***<br><br>එක්ස්ප්‍රස් පර්ල් නෞකා අනතුරෙන් ලැබෙන වන්දිවලින්, හානියට පත් සමුද්‍රීය පරිසරය නැවත යථා තත්ත්වයට පත් කිරීමට ගෙන ඇති පියවර | මෙම අනතුරෙන් සිදුවූ පරිසර හානිය අධ්‍යයනය කර, සිදු වූ විපත හානිපූරණය සම්බන්ධයෙන් දිගුකාලීන සැලැසුම් අධීක්ෂණය සඳහා විශේෂඥ කමිටුවක් පත් කොට වාර්තාවක් කැඳවා ඇති බව ග.නි. ප්‍රකාශ කළේය. එසේම දූෂණයට ලක්වූ එක් එක් සමුද්‍රීය පරිසර අංග වෙනුවෙන් යථාවත් කිරීමේ සැලැසුම් අන්තර්ගත වාර්තාව සකස්වෙමින් පවතින බවද ඔහු සඳහන් කළේය. වෙරළ තීරය පිරිසිදු කිරීම සඳහා මිනිස්-දින 60,000 පමණ මේ වන විට ගත කර ඇති බවද, වෙරළ ආරක්ෂක බලකායට හා වෙරළාසන්න ධීවර ප්‍රජාව මේ සඳහා යොදා ගැනීම මඟින් ඔවුන්ට ආදායම් මාර්ගයක් ලබා දීමට හැකි වූ බවද ග.නි. සඳහන් කළේය. |

| | | |
|---|---|---|
| | **සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු** | **- ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) /ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම්**<br><br>**- කාරක සභාවේ නිරීක්ෂණ, නිර්දේශ / නියෝග** |
| **සුරාබදු දෙපාර්තමේන්තුව**<br><br>**විමර්ශනය කරන ලද දිනය - 2022 අප්‍රේල් 19** | | |
| ❖ **කැඳවන ලද ආයතන -**<br>මුදල් අමාත්‍යාංශය<br>සුරාබදු දෙපාර්තමේන්තුව | | |
| 01. | ***<u>දේශීය හා විදේශීය මත්පැන්වල ප්‍රමිතිය</u>***<br><br>මහජනතාවගේ සෞඛ්‍ය සුරක්ෂිත කිරීම සඳහා දේශීය වෙළෙඳපොළ තුළ ඇති දේශීය හා විදේශීය මත්පැන්වල ප්‍රමිතිය සහතික කිරීම සම්බන්ධයෙන් සුරාබදු දෙපාර්තමේන්තුව විසින් ගෙන ඇති පියවර | රජයේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුව සහ කාර්මික තාක්ෂණික ආයතනයේ සහාය ද ලබා ගනිමින් මත්පැන් වල ප්‍රමිතිය පවත්වා ගැනීම සඳහා දෙපාර්තමේන්තුව කටයුතු කරන බව ගණන් දීමේ නිලධාරියා (ග.නි) ප්‍රකාශ කළේය. මෙරට නිෂ්පාදිත දේශීය මත්පැන්, මෙරට නිෂ්පාදිත විදේශීය මත්පැන් (Country made foreign liquor) සහ බියර් සඳහා මේ වන විට ප්‍රමිතීන් සකස් කර අවසන් බවත්, ලෝකයේ ප්‍රථම වරට කෘත්‍රිම රා සඳහා ප්‍රමිතියක් සකස් කිරීමේ පරීක්ෂණය ආරම්භ කර ඇති බවත් ප්‍ර.ග.නි/ ග.නි ප්‍රකාශ කළේය.<br><br>මෙයට අමතරව සුරාබදු නිලධාරීන් පුහුණු කිරීම, නීති විරෝධි මත්පැන් වැටලීම, මත්පැන් නිවාරණ ගම්මාන ඇති කිරීම සහ මත්පැන් හා මත්ද්‍රව්‍ය භාවිතයෙන් සිදුවන හානි පිළිබඳ මහජනතාව දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීමද සිදු කරන බවත් ග.නි ප්‍රකාශ කළේය. |
| 02. | ***<u>මත්පැන්වල ප්‍රමිතිය පරීක්ෂා කිරීම සඳහා ආරම්භ කිරීමට බලාපොරොත්තු වෙන රසායනාගාරය</u>*** | රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් (COPA) ලබා දුන් නියෝගයක් අනුව මත්ද්‍රව්‍ය වල ප්‍රමිතිය පරීක්ෂා කිරීම සඳහා රසායනාගාරයක් 2021 වසරේ ස්ථාපනය |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | - ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) /ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම්<br><br>- කාරක සභාවේ නිරීක්ෂණ, නිර්දේශ / නියෝග |
|---|---|---|
| | මත්පැන්වල ප්‍රමිතිය පරීක්ෂා කිරීම සඳහා සුරාබදු දෙපාර්තමේන්තුව විසින් ආරම්භ කිරීමට බලාපොරොත්තු වෙන රසායනාගාරය | කිරීමට අපේක්ෂා කළද එය සිදු කිරීමට නොහැකි වූ බවත්, මෙම වර්ෂයේ (2022) එය ඉටු කිරීමට කටයුතු කරන බවත් ප්‍ර.ග.නි/ග.නි ප්‍රකාශ කළේය. එසේම මේ සඳහා වැයවන අධික පිරිවැය සපුරා ගැනීමේ දුෂ්කරතාවය මෙම ප්‍රමාදයට හේතු වූ බවද ඔහු ප්‍රකාශ කළේය. මුදල් අමාත්‍යාංශයේ අනුමැතිය ඇතිව සුරාබදු දෙපාර්තමේන්තුව සතු ත්‍යාග අරමුදලින් (Reward Fund) මේ සඳහා ප්‍රතිපාදන ලබා ගැනීමට අදහස් කරන බවද ප්‍ර.ග.නි/ග.නි වැඩිදුරටත් ප්‍රකාශ කළේය.<br><br>මෙම රසායනාගාරය ස්ථාපනය කිරීමෙන් ප්‍රමිතියෙන් යුතු මත්පැන් වෙළෙඳ පොළට නිකුත් කිරීමේ සහ නීතිවිරෝධි මත්පැන් සම්බන්ධ නඩු කටයුතු කඩිනම් කිරීමේ හැකියාව ලැබෙන බව ඔහු අනාවරණය කළේය. |
| 03. | ***<u>2022 වර්ෂයේ 1 වන කාර්තුවේ කාර්ය සාධනය</u>*** | 2021 සහ 2022 වර්ෂවල පළමු කාර්තුව සැසඳීමේ දී ආසන්න වශයෙන් පිළිවෙළින් රු. බිලියන 37 ක සහ 42 ක ආදායමක් ලබා ඇති බවත්, ඒ අනුව මෙම වර්ෂයේ ආදායමේ පැහැදිලි වර්ධනයක් දැකිය හැකි බවත් ග.නි පෙන්වා දුන්නේය. බදු අනුපාත වැඩි කිරීම මගින් ආදායම වැඩිවීමට යම් බලපෑමක් ඇති වුවද, නිෂ්පාදනයේ සහ ආදායමේ වර්ධන වේගය පිළිවෙළින් 9% සහ 17% කින් වැඩි වී ඇති බව ග.නි වැඩිදුරටත් සඳහන් කළේය.<br><br>මේ වන විට මෙරටට එතනෝල් ආනයනය කිරීම නතර කර ඇති බව |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | **- ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) /ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම්**<br><br>**- කාරක සභාවේ නිරීක්ෂණ, නිර්දේශ / නියෝග** |
|---|---|---|
| | | කාරක සභාවේ දී අනාවරණය විය. එසේම, වර්තමානයේ පවතින ඉන්ධන අර්බුදය නිසා රටේ පවතින ප්‍රවාහන දුෂ්කරතා හේතුවෙන් මත්පැන් නිෂ්පාදනය සඳහා අවශ්‍ය පරිපාක ස්ප්‍රීතු නිපදවීමට අවශ්‍ය උක්ගස් ප්‍රමාණවත් පරිදි නිෂ්පාදනාගාර වෙත නොලැබෙන බැවින් යම් අර්බුදකාරී තත්වයක් උද්ගත වී ඇති බවද මෙහිදී සඳහන් විය. එවැනි ගැටලුකාරී තත්වයන් ඇති නොවේ නම් මත්පැන් නිෂ්පාදනය සඳහා ප්‍රමාණවත් පරිදි පරිපාක ස්ප්‍රීතු මෙරට දී නිෂ්පාදනය කළ හැකි බව ද කාරක සභාවේ දී අනාවරණය විය. |
| 04. | ***<u>තනතුරු පුරප්පාඩු</u>***<br><br>2021.12.31 වන දිනට දෙපාර්තමේන්තුව තුළ සුරාබදු නියාමක තනතුරු 102 ක් ඇතුළුව පුරප්පාඩු 352 ක් පැවතීම | **<u>නිර්දේශ</u>**<br><br>සුරාබදු දෙපාර්තමේන්තුව, රාජ්‍ය ආදායමට වැඩිම දායකත්වයක් සපයන ප්‍රධාන රාජ්‍ය ආයතන තුනෙන් එකක් බව පෙන්වා දුන් කාරක සභාව රාජ්‍ය ආදායම වැඩි කර ගැනීම සඳහා සේවක පුරප්පාඩු පිරවීම අත්‍යවශ්‍ය කරුණක් බැවින් අදාළ පුරප්පාඩු පිරිවීම සඳහා කඩිනම් ක්‍රියාමාර්ග ගන්නා ලෙස ප්‍ර.ග.නි වෙත නියෝග කළේය.<br><br>එසේම වර්තමානයේ, නීතිවිරෝධි මත්පැන් අලෙවිය වැඩි වීමේ ප්‍රවනතාවයක් ඇති වීම පිළිබඳ කාරක සභවේ අවධානය යොමු විය.<br><br>දෙපාර්තමේන්තුවේ නිලධාරීන් සඳහා ඉලක්ක ලබා දෙමින් නීතිවිරෝධි |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | **- ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) /ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම්**<br><br>**- කාරක සභාවේ නිරීක්ෂණ, නිර්දේශ / නියෝග** |
|---|---|---|
| | | මත්පැන්/ මත්ද්‍රව්‍ය වැටලීම් කිරීමට ක්‍රියාකරන බවත් දෙපාර්තමේන්තුව තුළ පවතින නිලධාරී හිඟය නිසා මෙම කටයුතු ඉටු කර ගැනීමේ දුෂ්කරතා මතු වී ඇති බවත් ග.නි ප්‍රකාශ කළේය. |
| 05. | ***<u>පරිගණක දත්ත පද්ධතියේ වර්තමාන තත්වය</u>***<br><br>සුරාබදු දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා රේගුව හා දේශීය ආදායම් දෙපාර්තමේන්තුව එකිනෙකට සම්බන්ධ වන පරිගණක දත්ත පද්ධතියේ වර්තමාන තත්වය | දේශීය ආදායම් දෙපාර්තමේන්තුව සමඟ කාර්තු වශයෙන් දත්ත හුවමාරු කර ගන්නා බවත්, ශ්‍රී ලංකා රේගුව මගින් ආනයන අපනයන තොරතුරු ලබා ගැනීමට කටයුතු කරන බවත් ග.නි ප්‍රකාශ කළේය.<br><br>**<u>නිර්දේශ</u>**<br><br>පරිගණක දත්ත පද්ධතිය සකස් කිරීම සම්බන්ධයෙන් කාරක සභාව වෙත ඉදිරිපත් කර ඇති කාල රාමුව අනුව 2023 වර්ෂයේ ජනවාරි වන විට එහි කටයුතු අවසන් කිරීමට ක්‍රියාකරන ලෙසත් මේ සඳහා මොරටුව හෝ කොළඹ විශ්ව විද්‍යාලයේ සහාය ලබා ගැනීමට කටයුතු කරන ලෙසත් කාරක සභාව නිර්දේශ කළේය. |
| 06. | ***<u>ආරක්ෂිත ස්ටිකර් කළමනාකරණ පද්ධතිය</u>*** | මත්පැන් බෝතල් සහ මත්පැන් බෝතල් ආශ්‍රිත නිෂ්පාදන සඳහා ආරක්ෂිත ස්ටිකර් කළමනාකරණ පද්ධතිය සුරාබදු දෙපාර්තමේන්තුව මගින් මේ වන විට ක්‍රියාත්මක කිරීම පිළිබඳව කාරක සභාව සිය අවධානය යොමු කළේය.<br><br>ස්ටිකරයේ සත්‍යතාවය හඳුනා ගැනීම සම්බන්ධයෙන් මහජනතාවට භාවිත කළ |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | **- ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) /ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම්**<br><br>**- කාරක සභාවේ නිරීක්ෂණ, නිර්දේශ / නියෝග** |
|---|---|---|
| | | හැකි යෙදවුමක් (App) සකස් කිරීම මේ වන විට ආරම්භ කර ඇති බවත් කඩිනමින් එම කටයුතු අවසන් කිරීමට අපේක්ෂා කරන බවත් ප්‍ර.ග.නි/ ග.නි ප්‍රකාශ කළේය. එසේම, මෙම ස්ටිකර් කළමනාකරණ පද්ධතිය ක්‍රියාත්මක කිරීම ආරම්භ කිරීමත් සමඟ නිෂ්පාදනයේ සහ සුරාබදු ආදායමේ වැඩිවීමක් දැකිය හැකි බව ඔහු වැඩිදුරටත් පැහැදිලි කළේය. |
| 07. | ***<u>මත්පැන් අපනයනය මත සුරාබදු අවකරණය</u>*** | මත්පැන් අපනයනය මත අයකර ගනු ලබන බදු මුදලින් එම නිෂ්පාදන අපනයනය කිරීමේ දී 2021 වර්ෂයේ දී රු.3,689,638,848 ක සුරා බදු මුදලක් අවකරණය කර තිබීම කාරක සභාව නිරීක්ෂණය කළේය. එසේම, සුරාබදු අවකරණය පිළිබඳ තොරතුරු ගිණුම් අංශය තුළ පවත්වාගෙන ගොස් නොතිබීම හේතුවෙන් දළ ආදායම පිළිබඳ විස්තර නොමැති බවත්, ශුද්ධ බදු ආදායම පමණක් ගිණුම්ගත වන බවත් මෙහිදී අනාවරණය විය. එම නිෂ්පාදන අපනයනය කළ බව තහවුරු කිරීම සඳහා ඉහත කී ඒකාබද්ධ පරිගණක දත්ත පද්ධතියේ වැදගත්කම කාරක සභාව තවදුරටත් අවධාරණය කළේය.<br><br>මේ වන විට ශ්‍රී ලංකා රේගුව හා සම්බන්ධ (Link) වී අදාළ දත්ත ලබා ගන්නා බවත් ගිණුම් ලේඛනවල පවතින වැරදීම් සහ දුර්වලතා නිවැරදි කිරීමට උපදෙස් ලබා දී ඇති බවත් ග.නි ප්‍රකාශ කළේය.<br><br>කෙසේ වුව ද රට තුළ පවතින ඩොලර් අර්බුදයට පිළියම් ලෙස ශ්‍රී ලංකාව විසින් |

| | | |
|---|---|---|
| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | **- ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) /ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම්**<br><br>**- කාරක සභාවේ නිරීක්ෂණ, නිර්දේශ / නියෝග** |
| | | මත්පැන් අපනයනය කිරීම තවදුරත් ප්‍රවර්ධනය කිරීමේ වැදගත්කම පිළිබඳව කාරක සභාවේ අවධානය යොමු විය.<br><br>ආනයනික මත්පැන් සඳහා ලේබන පරීක්ෂා කිරීම් පිළිබඳවත්, විදේශ මත්පැන් සහ දේශීයව නිෂ්පාදනය කරන මත්පැන් වල රසායානාගාර පරීක්ෂා කිරීම් සිදු කිරීම පිළිබඳවත් කාරක සභාව විසින් විමසන ලදි.<br><br>මත්පැන් මෙරටට ආනයනය කරන අවස්ථාවේ දී අදාළ ආනයනික ලේබන පරීක්ෂා කරන බවත් සන්නාම අනුමැතියක් (Brand Approval) ලබා ගැනීමෙන් පමණක් එම මත්පැන් දේශීය වෙළඳ පොළෙහි අලෙවි කිරීමට අවසර ලබා දෙන බවත් ප්‍ර.ග.නි/ග.නි විසින් පැහැදිලි කරන ලදි.<br><br>එසේම දේශීයව නිෂ්පාදනය කරන විදේශීය මත්පැන් සාම්ප්‍රදායික ක්‍රමවේදයකින් තොරව නිෂ්පාදනය කරන්නේ නම් ඒවා Emulated Foreign liquor කාණ්ඩය යටතේ වෙළෙඳ පොළට නිකුත් කරන බවත් ඒ අනුව දේශීය නිෂ්පාදකයා සාම්ප්‍රදායික ක්‍රමයන්ට අනුගතව විදෙස් මත්පැන් නිෂ්පාදනය කිරීමේ නැඹුරුවක් දක්නට ලැබෙන බවත් ප්‍ර.ග.නි/ග.නි ප්‍රකාශ කළේය. |
| 08. | ***<u>පානීය නොවන මධ්‍යසාර ආනයනනයේ දී සිදුවන අක්‍රමිකතා</u>*** | පානීය නොවන මධ්‍යසාර මෙරටට ආනයනය කිරීමේ දී කිලෝග්‍රෑම්වලින් ගණනය කළද මෙරට ගණනය කිරීම් |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | **- ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) /ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම්**<br><br>**- කාරක සභාවේ නිරීක්ෂණ, නිර්දේශ / නියෝග** |
|---|---|---|
| | | සිදුකරනු ලබන්නේ පරිමාව මත පදනම්ව ලීටර්වලිනි. කෙසේ නමුත් පරිසර උෂ්ණත්වය අනුව පරිමාව වෙනස් වන අතර විදේශයන්හි ශීත දේශගුණය තුළ ඇති පරිමාවට වඩා මෙරට දී එම පරිමාව වැඩිවීමක් සිදු වන බවත් මෙම අතිරේක පරිමාවෙන් ආනයනකරු වංචනිකව ලාභ ලැබිය හැකි බවත් පෙන්වා දුන් කාරක සභාව ඒ පිළිබඳ අවධානය යොමු කරන ලෙස ප්‍ර.ග.නි වෙත උපදෙස් දෙන ලදි. |
| 09. | ***<u>රත්නපුර රා තැබෑරුමේ ටෙන්ඩරය</u>***<br><br>රත්නපුර රා අංක 01 තැබෑරුම සඳහා නියම කරන ලද ටෙන්ඩර මුදලට වඩා අඩු මුදලකට ටෙන්ඩර නොකැඳවා ටෙන්ඩරය ලබා දීම | සුරාබදු කොමසාරිස් ජනරාල්වරයා විසින් පත් කරන ලද කමිටුවක් විසින් ගනු ලැබූ තීරණයක් මත රු.28,000,000/- මුදලකට එම තැබෑරුම ලබා දුන් බව ප්‍ර.ග.නි/ග.නි ප්‍රකාශ කළේය. තවද, එම මුදලට හෝ ටෙන්ඩරය ලබා නොදුන්නේ නම් එම ප්‍රදේශයේ නීති විරෝධි මත් පැන් අලෙවිය වැඩිවන බවත්, රජයට එකී රු28,000,000/- ආදායම පවා අහිමි වන බවත් ඔහු වැඩිදුරටත් පැහැදිලි කළේය. |
| 10. | ***<u>බීඩි නිෂ්පාදනය සඳහා බදු අය කර ගැනීම</u>*** | ***<u>නිර්දේශ</u>***<br><br>බීඩි නිෂ්පාදනය සඳහා යම්කිසි බදු මුදලක් රජයට ගෙවීමට ඇතැම් බීඩි නිෂ්පාදකයින් කැමැත්ත පළ කර ඇති බව කාරක සභාවේ දී අනාවරණය විය. ඒ අනුව, එම බදු මුදල් රජයට අයකර ගත හැකි වැඩපිළිවෙළක් සකස් කිරීම පිළිබඳ අවධානය යොමු කරන ලෙස කාරක සභාව නියෝග කළේය. |
| 11. | ***<u>සුරාබදු ආදායම් ගණනය කිරීමේ ක්‍රියාවලිය නිවැරදි කිරීම</u>*** | දේශීය ආදායම් දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා රේගුව සහ සුරාබදු දෙපාර්තමේන්තුව එකිනෙකට සම්බන්ධ |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | - ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) /ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම්<br><br>- කාරක සභාවේ නිරීක්ෂණ, නිර්දේශ / නියෝග |
|---|---|---|
| | ***<u>සඳහා පරිගණක මෘදුකාංග පද්ධතිය</u>***<br>සුරාබදු ආදායම් ගණනය කිරීමේ ක්‍රියාවලිය නිවැරදි කිරීම සඳහා පරිගණක මෘදුකාංග පද්ධතියක් ක්‍රියාත්මක කිරීමට දෙපාර්තමේන්තුව විසින් 2016 වර්ෂයේ සිට 2018 වර්ෂය දක්වා අයවැය හා පරිපූරක ප්‍රතිපාදන මගින් රු.මිලියන 87.2ක් වෙන් කර තිබුණද එම ව්‍යාපෘතිය ක්‍රියාත්මක නොවීම | කරන පරිගණක දත්ත පද්ධතිය ක්‍රියාත්මක කිරීමට සමගාමීව මෙම වැඩසටහන ක්‍රියාත්මක කරනු ලබන බව ප්‍ර.ග.නි/ග.නි පැහැදිලි කළේය. |
| 12. | ***<u>මත්පැන් නිෂ්පාදන සමාගම් විසින් වෙළෙඳපොළ ඒකාධිකාරියක් ඇති කිරීම වැළැක්වීම</u>***<br><br>ඇතැම් මත්පැන් නිෂ්පාදන සමාගම් විසින් වෙළෙඳපොළ ඒකාධිකාරියක් ඇති කිරීමට කටයුතු කිරීම වැළැක්වීමට දෙපාර්තමේන්තුව විසින් මේ වන විට ගත් ක්‍රියාමාර්ග | සුරාබදු දෙපාර්තමේන්තුව විසින් මේ සම්බන්ධව විශේෂ අධ්‍යයනයක් සිදු කර ඒ සඳහා යෝජනාවලියක් මුදල් අමාත්‍යාංශය වෙත ලබා දුන් බවත් මෙම තත්වය වළක්වාලීම සඳහා අවශ්‍ය චක්‍රලේඛ නිකුත් කිරීමට කටයුතු කරන බවත් ප්‍ර.ග.නි/ග.නි ප්‍රකාශ කළේය. |
| 13. | ***<u>මත්පැන් වල සැර බැලීමේ උපකරණ කට්ටල සහ මිනුම් සරා මිලදී නොගැනීම</u>***<br><br>ප්‍රසම්පාදන සැලැස්මේ ඇතුළත් වූ නමුත් මේ දක්වා මත්පැන් වල සැර බැලීමේ උපකරණ කට්ටල 814 ක් සහ මිනුම් සරා 138 ක් මිලදී නොගැනීම | වර්තමානයේ රට තුළ පවතින තත්ත්වය මත මෙම උපකරණ මිලදී ගැනීමේ දුෂ්කරතාවයක් පවතින බව ප්‍ර.ග.නි/ග.නි ප්‍රකාශ කළේය.කෙසේ නමුත් මීට පෙර මිලදී ගත් උපකරණ නියමිත ප්‍රමිතීන්ට අනුව අලුත්වැඩියා කරමින් සිටින බවත් මේ වන විට සෑම නිෂ්පාදනාගාරයකම සැර බැලීම සහ ප්‍රමිතිගත කිරීම් සිදු වන |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | **- ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) /ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම්**<br><br>**- කාරක සභාවේ නිරීක්ෂණ, නිර්දේශ / නියෝග** |
|---|---|---|
| | | බවත් ප්‍ර.ග.නි/ග.නි වැඩිදුරටත් ප්‍රකාශ කළේය. |
| 14. | ***<u>රත්නපුර අංක 1 සහ 2 රා තැබෑරුම්වලින් රා සාම්පල් පරීක්ෂා කර නොතිබීම</u>***<br><br>පළාත් සහකාර සුරාබදු කොමසාරිස් සහ සුරාබදු අධිකාරීන් විසින් අදාළ පළාත තුළ වෙළෙඳාම පිණිස තබා ඇති රා බෝතල්වලින් සාම්පල තුන් මසකට වරක්වත් රජයේ රස පරීක්ෂක වෙතින් පරික්ෂා කර ගත යුතු වුවත් රත්නපුර අංක 1 සහ 2 රා තැබෑරුම්වලින් 2017 ඔක්තෝබර් මාසයෙන් පසු 2020 වර්ෂය වන තෙක්ම එසේ පරීක්ෂා කර නොතිබීම | මෙම රා තැබෑරුම් සම්බන්ධයෙන් යම් අඩුපාඩු තිබූ බව පිළිගන්නා බවත් මේ වන විට සුරාබදු කොමසාරිස්වරයා නිකුත් කරන ලද චක්‍රලේඛයක් අනුව මාස තුනකට වරක් රා නියැදිවල (sample) අදාළ පරීක්ෂා කිරීම් සිදු කරන බවත් ප්‍ර.ග.නි/ග.නි ප්‍රකාශ කළේය.<br><br>කෙසේ නමුත්, රස පරීක්ෂා වාර්තා ලැබීමට පෙර එම රා අලෙවිය සිදුවන බැවින් ඇතැම් විට ප්‍රමිතියෙන් තොර රා පාරිභෝගිකයා අතට පත්වීමට ඉඩ ඇති බව පැහැදිලි කළ කාරක සභාව, රා වල ප්‍රමිතිය නියාමනය කිරීමේ දුර්වලතා පවතින බව පෙන්වා දුන්නේය.<br><br>මෙම තත්වය පිළිගත් ප්‍ර.ග.නි/ග.නි විසින් ඉදි කිරීමට අපේෂිත මධ්‍යම සුරාබදු රසායානාගාරය මගින් මෙම තත්වය වළක්වා ගැනීමට හැකි බවත් ඒ සඳහා එම රසායනාගාරය ඉතා ඉක්මනින් ඉදිකිරීමේ අවශ්‍යතාවයේ වැදගත්කමත් පෙන්වා දෙන ලදි. |
| 15. | ***<u>පානීය නොවන ස්ප්‍රීතු ආනයනය සඳහා තාවකාලික බලපත්‍රයක් නිකුත් කර තිබීම</u>***<br><br>භාණ්ඩ අපනයනය හා ප්‍රවාහනය සඳහා සුරාබදු දෙපාර්තමේන්තුවේ බලපත්‍රයක් නොමැති පුද්ගලික සමාගමක් | එම ස්ප්‍රීතු රේගුවෙන් නිදහස් කර ගැනීමට එම තාවකාලික බලපත්‍රය ලබා දීමට කටයුතු කළ බවත්, ඒ සඳහා රුපියල් 500,000/- දඩ මුදලක් සහ අදාළ බදු අයකර ගත් බවත් ප්‍ර.ග.නි/ග.නි ප්‍රකාශ කළේය. |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | - ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) /ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම්<br><br>- කාරක සභාවේ නිරීක්ෂණ, නිර්දේශ / නියෝග |
|---|---|---|
| | විසින් රු.5,168,570/- ක වටිනාකමකින් යුත් පානීය නොවන ස්ප්‍රීතු ආනයනය සඳහා තාවකාලික බලපත්‍රයක් නිකුත් කර තිබීම | |
| **වෙළෙඳ අමාත්‍යාංශය**<br><br>**විමර්ශනය කරන ලද දිනය - 2022 මැයි 04** | | |
| ❖ **කැඳවන ලද ආයතන -**<br>වෙළෙඳ අමාත්‍යාංශය | | |
| 01. | ***<u>දත්ත පද්ධතියක් පවත්වාගෙන යාම</u>***<br><br>ජාතික වෙළෙඳ ප්‍රතිපත්තියක් සැකසීම, අපනයන දිරිමත් කිරීම, වෙළෙඳපළ මිල පාලනය තුලින් ජීවන වියදම පහළ මට්ටමක පවත්වා ගෙන යාම, ආහාර සුරක්ෂිතතාව තහවුරු කිරීම සඳහා රටට අවශ්‍ය ආහාර ද්‍රව්‍යවල ආරක්ෂිත තොග (Buffer Stock) පවත්වාගෙන යාම, වෙළෙඳපළ නියාමනය සඳහා අමාත්‍යාංශය යටතේ ඇති ආයතනවලට අදාළ දත්ත පද්ධතියක් පවත්වාගෙන යාම. | අමාත්‍ය මණ්ඩල අනුකමිටුවක් මගින් පත් කළ විද්වත් කමිටුවක් මගින් ජාතික වෙළෙඳ ප්‍රතිපත්තිය සැකසීම ආරම්භ කර ඇති බවද, මාස 2ක පමණ කාලයක් තුළ ජාතික වෙළෙඳ ප්‍රතිපත්තිය ඉදිරිපත් කළ හැකි බවද, මෙහිදී ප්‍ර.ග.නි. ප්‍රකාශ කළේය.<br><br>ආහාර ද්‍රව්‍යවල ප්‍රමාණවත් ආරක්ෂිත තොග (Buffer Stock) පවත්වාගෙන යාමට භාණ්ඩාගාරයෙන් ලබාදුන් රු.මිලියන 200ක ප්‍රතිපාදන මගින් සමුපකාර තොග වෙළෙඳ සංස්ථාව (සතොස) හරහා සහල් හා සීනි බෙදා දුන් බවද ප්‍ර.ග.නි. අනාවරණය කළේය.<br><br>එසේම, වෙළෙඳ අමාත්‍යාංශය හා ශ්‍රී ලංකා රේගුව අතර මිල තීරණය කිරීම සඳහා තොරතුරු හුවමාරු කර ගැනීමට දත්ත පද්ධතියක් පවතින බවද, අමාත්‍යතුමාගේ ප්‍රධානත්වයෙන් ආහාර සුරක්ෂිතතා |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | **- ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) /ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම්**<br><br>**- කාරක සභාවේ නිරීක්ෂණ, නිර්දේශ / නියෝග** |
|---|---|---|
| | | කමිටුවක් කැඳවා ඇති බවද ප්‍ර.ග.නි. තවදුරටත් ප්‍රකාශ කළේය.<br><br><u>නිර්දේශ</u><br><br>- රට තුළ සතියකටවත් ප්‍රමාණවත් වන පරිදි සහල් ඇතුළු අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍යවල සංචිතයක් පවත්වා ගතයුතු බව.<br><br>- ඒ සඳහා ක්‍රමවත්ව ගබඩා පවත්වා ගතයුතු බව.<br><br>- පවත්වා ගත යුතු ආහාර සංචිත සඳහා අවශ්‍ය ප්‍රතිපාදන භාණ්ඩාගාරයෙන් ඉල්ලුම් කිරීම කළ යුතු බව.<br><br>- වර්තමානයේ රටේ පවතින ආර්ථික අර්බුදය කඩිනමින් විසඳීම සඳහා අමාත්‍යාංශය විසින් ඉතා ඉක්මනින් රජයේ මැදිහත්වීම සහිත ජාතික වෙළෙඳ ප්‍රතිපත්තියක් සකස් කළ යුතු බව.<br>- නිවැරදි තීරණ ගැනීමට අමාත්‍යාංශය යටතේ ඇති ආයතන සම්බන්ධ කරමින් යාවත්කාලීන දත්ත පද්ධතියක් ස්ථාපනය කළ යුතු බව.<br><br>- ආහාර සුරක්ෂිතතාවය හා මිල පාලනය පිළිබඳ මෙන්ම අත්‍යවශ්‍ය කණ්ඩායම් වලට ආහාර සැපයුම / බෙදා හැරීම තහවුරු කෙරෙන වැඩ පිළිවෙලක් සකස් කර, ඒ පිළිබඳ |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | - ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) /ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම්<br><br>- කාරක සභාවේ නිරීක්ෂණ, නිර්දේශ / නියෝග |
|---|---|---|
| | | මසක් තුළ කාරක සභාවට වාර්තාවක් ලබා දිය යුතු බව නියෝග කිරීම.<br><br>- ආහාර සුරක්ෂිතභාවය පිළිබඳ කමිටුව සතියකට වරක්වත් රැස්විය යුතු බවත් සතිපතා වාර්තා ලබාගෙන, ජනතාවට ආහාර හිඟයක් ඇති නොවන අයුරින් කටයුතු කළ යුතු බව. |
| 02. | <u>***කාර්ය මණ්ඩලය***</u><br><br>2022 මාර්තු 22 දිනට අමාත්‍යාංශය විසින් ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලයට අනුයුක්ත කරන ලද සංවර්ධන නිලධාරීන් 116ක අතිරික්තයක් පැවතීම. | රාජ්‍ය සේවා අමාත්‍යාංශ චක්‍රලේඛයට අනුව අනුයුක්ත කිරීමෙන් පසුව කාර්ය මණ්ඩලය අනුමත වන පසුබිමක මෙම කාර්ය මණ්ඩලය අතිරික්තයක් ලෙස හඳුනාගෙන තිබුණද සත්‍ය ලෙසම එම පිරිස අතිරික්තයක් නොවන බවද ඔවුන්ට රාජකාරි ලැයිස්තුවක් ලබා දී ඔවුන්ගේ කාර්යයන් අධීක්ෂණයකට ලක් කරන බවද ප්‍ර.ග.නි. ප්‍රකාශ කළේය. |
| 03. | <u>***වාහන අමාත්‍යාංශය වෙත පවරාගෙන නොතිබීම***</u><br><br>2021.09.28 දිනැති අමප/21/1543/313/053 අංක දරන අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව අමාත්‍යාංශය වෙත විධිමත්ව පවරා ගැනීමට අනුමැතිය ලද වාහන ඇතුළු අමාත්‍යාංශය විසින් පරිහරණය කරනු ලබන වාහන 24න් වෙනත් රජයේ ආයතන නමින් ලියාපදිංචි කර තිබුණු වාහන | වාහන පවරා ගැනීමට මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවට අයදුම් කර ඇති බව ප්‍ර.ග.නි. ප්‍රකාශ කළේය.<br><br><u>**නිර්දේශ**</u><br><br>- මෙම වාහන අමාත්‍යාංශයට පවරා ගැනීමට කඩිනමින් කටයුතු කරන ලෙස කාරක සභාව නියෝග කළේය. |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | **- ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) /ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම්**<br><br>**- කාරක සභාවේ නිරීක්ෂණ, නිර්දේශ / නියෝග** |
|---|---|---|
| | 18ක් 2022.03.31 දින වන විටත් අමාත්‍යාංශය වෙත පවරාගෙන නොතිබීම. | |
| 04. | ***<u>ආරක්ෂිත සහල් සංචිතයක් පවත්වා ගැනීමට ක්‍රියා කර නොතිබීම</u>***<br><br>2021 වර්ෂයේදී ශ්‍රී ලංකාව තුළ පවත්වා ගත යුතු මෙට්‍රික් ටොන් 8000 ක ආරක්ෂිත සහල් සංචිතය සඳහා රු.මිලියන 200ක ප්‍රතිපාදන දෙපාර්තමේන්තුව වෙත සපයා තිබුණද 2021 ඔක්තෝබර් දක්වා මෙම ප්‍රතිපාදන උපයෝගී කර නොගැනීම හේතුවෙන් මෙම ප්‍රතිපාදන රාජ්‍ය වාණිජ (විවිධ) නීතිගත සංස්ථාව වෙත මාරු කිරීම හා 2017 අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව මෙට්‍රික් ටොන් 100,000 ක ආරක්ෂිත සහල් සංචිතයක් රට තුළ පවත්වා ගැනීමට අමාත්‍යාංශය විසින් ක්‍රියා කර නොතිබීම. | සහල් ආනයන කටයුතු සඳහා රාජ්‍ය වාණිජ (විවිධ) නීතිගත සංස්ථාව වෙත අමාත්‍ය මණ්ඩල අනුමැතිය මත ප්‍රතිපාදන මාරු කර ඇති බව ප්‍ර.ග.නි. ප්‍රකාශ කළේය. කෙසේවුවද, අමාත්‍යාංශයට වෙන්වූ ප්‍රතිපාදන මහා භාණ්ඩාගාරයේ අනුමැතියකින් තොරව රාජ්‍ය වාණිජ (විවිධ) නීතිගත සංස්ථාව වෙත මාරු කිරීමෙන් මූල්‍ය විනය කඩවී ඇති බව කාරක සභාවේ අදහස විය. |
| 05. | ***<u>රාජ්‍ය වාණිජ (විවිධ) නීතිගත සංස්ථාව මගින් ක්‍රියාත්මක වන Q Shop සංකල්පය</u>***<br><br>• 2021 වර්ෂය අවසන් වන විට Q Shop වෙළෙඳසැල් 20ක් ඉදිකිරීම වෙනුවෙන් අමාත්‍යාංශය විසින් 2021 | බහාලුම් පෙට්ටිවල හිඟතාවය මෙම ව්‍යාපෘතිය අඩාලවීමට හේතුවූ බව ප්‍ර.ග.නි. ප්‍රකාශ කළේය. මිලදී නොගත් බහාලුම් පෙට්ටි සඳහා මුදල් ප්‍රතිපූරණය අත්හිටුවා ඇති බවද මෙම ව්‍යාපෘතිය සම්බන්ධයෙන් රාජ්‍ය වාණිජ (විවිධ) නීතිගත සංස්ථාව සමග සමාලෝචනයක් සිදුකරන බවද ප්‍ර.ග.නි. සඳහන් කළේය. |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | - ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) /ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම්<br><br>- කාරක සභාවේ නිරීක්ෂණ, නිර්දේශ / නියෝග |
|---|---|---|
| | වර්ෂයේදී රු.34,319,291/- ක මුදලක් ප්‍රතිපූරණය කළද, 2022.03.28 වන විට වෙළෙඳසැල් 08ක් පමණක් ස්ථාපනය කර තිබීම,<br><br>• බහාලුම් පෙට්ටි (Container) නවීකරණය කර ඉදිකිරීමට සැලසුම් කර, එම පෙට්ටි 20ක් සඳහා අමාත්‍යාංශය විසින් 2021.01.26 දින රු. 7,200,000/-ක් රාජ්‍ය වාණිජ (විවිධ) නීතිගත සංස්ථාව වෙත නිදහස් කර තිබුණද, බහාලුම් මිලදී ගැනීම තහවුරු කර ගැනීමක් හෝ මෙම කාර්යය පිළිබඳ පසුවිපරමක් අමාත්‍යාංශය විසින් සිදු නොකිරීම,<br><br>• රාජ්‍ය වාණිජ (විවිධ) නීතිගත සංස්ථාව, මධ්‍යම උපදේශන ඉංජිනේරුමය කාර්යාංශය වෙත ලබා දුන් Q Shop අලෙවිසැල් ඉදිකිරීමේ කොන්ත්‍රාත්තුව ලබා දීමේදී ලිඛිත ගිවිසුමකට එළඹ නොතිබීම,<br><br>• අමප/20/1909/313/035 හා 2020.12.22 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය වන එක් | <u>නිර්දේශ</u><br><br>- අත්‍යවශ්‍ය භාණ්ඩ වරලත් අලෙවි නියෝජිතයන් හරහා හෝ රටපුරා බෙදා හැරීමේ ක්‍රමවේදයක් ඇති කළ යුතු බව, සමූපකාර හරහා ණය සහන යටතේ ලැබෙන සහල් වැනි භාණ්ඩ පාලන මිලකට ලබාදිය යුතු බව.<br><br>- දැනට ස්ථාපිත කර ඇති Q Shop 8න් ලාබ ලබන ඒකක පමණක් ක්‍රියාත්මක කරන ලෙසද, මිලදී නොගත් බහාලුම්වල මුදල් නැවත අය කර ගන්නා ලෙස.<br><br>- තවද, ණය සහන යටතේ ලැබෙන සහල් සුපිරි වෙළෙඳසැල් හරහා බෙදා හැරීමට ගත් තීරණය පිළිබඳව කාරක සභාව සිය එකඟතාවය පළ නොකරන බව.<br><br>- මෙම ණය යෝජනා ක්‍රමය යටතේ ගෙන්වනු ලබන සහල් සමූපකාර සමිති මගින් පාලන මිලක් යටතේ පාරිභෝගිකයන්ට ලබාදෙන ලෙස. |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | - ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) /ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම්<br><br>- කාරක සභාවේ නිරීක්ෂණ, නිර්දේශ / නියෝග |
|---|---|---|
| | අලෙවි සැලක ඇස්තමේන්තුගත පිරිවැය රු. 2,500,000/- ක් වුවද, ඒ මුදල ඉක්මවා අලෙවි සැල් 5ක් ඉදිකර තිබුණු අතර, ඒ සඳහා අමතර පිරිවැය රු. 10,872,604/-ක් දරා තිබීම, | |
| 06. | ***<u>සමූපකාර තොග වෙළෙඳ සංස්ථාවට අයත් ගබඩා 13ක් නවීකරණය කිරීම</u>***<br><br>රු. 225,000,000/- ක ඇස්තමේන්තුවක් සහිත මෙම ව්‍යාපෘතිය සඳහා 2021 දී අමාත්‍යාංශය විසින් රු.50,000,000/-ක ප්‍රතිපාදන ලබාදී තිබුණි. සමූපකාර තොග වෙළෙඳ සංස්ථාව විසින් ගබඩා 13 ක් නවීකරණය සඳහා රු. 82,525,681/-ක් වැය කර තිබුණු අතර, අමාත්‍යාංශය විසින් 2020.12.31 දිනට රු. 62,490,367/-ක වියදම ප්‍රතිපූරණය කර තිබුණි. | 2020.03.18 වන විටත් ගබඩා 06ක නවීකරණ කටයුතු අවසන් වී අනෙකුත් ගබඩා 07හි නවීකරණ ප්‍රගතිය 05% සිට 95% ක් වූ අතර මෙම ගබඩා 07හි මුදල් එම නවීකරණයන් අවසන් වන තුරු ගෙවා නොමැති බව ප්‍ර.ග.නි. ප්‍රකාශ කළේය.<br><br>2021.03.07 දින මෙම ව්‍යාපෘතිය පිළිබඳ අමාත්‍යාංශය විසින් ප්‍රගති සමාලෝචනයක් කර තිබුණු අතර, ප්‍රතිපාදන ලබා දී වසරකට අධික කාලයක් ගත වන තුරුත් ගබඩා නවීකරණය අවසන් නොවීම කාරක සභාව නිරීක්ෂණය කළේය.<br><br><u>නිර්දේශ</u><br><br>- මෙම ගබඩා නවීකරණය සම්බන්ධයෙන් පූර්ණ වාර්තාවක් කාරක සභාවට ලබා දෙන ලෙස කාරක සභාව ප්‍ර.ග.නි. වෙත නියෝග කළේය. |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | - ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) /ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම් <br><br> - කාරක සභාවේ නිරීක්ෂණ, නිර්දේශ / නියෝග |
|---|---|---|
| 07. | ***<u>අමාත්‍යාංශය විසින් 2021 වර්ෂයේදී ලී බඩු හා උපකරණ මිලදී ගැනීමේ පටිපාටියේ දෝෂ</u>*** <br><br> අමාත්‍යාංශය විසින් 2021 වර්ෂයේදී ලී බඩු හා උපකරණ මිලදී ගැනීමේදී ප්‍රසම්පාදන සංග්‍රහයට අනුව විධිමත් ඇස්තමේන්තුවක් සකස් කර නොතිබීම, පිරිවිතර සකස් කර නොතිබීම, රු. මිලියන 03 ඉක්මවූ ඉහත ප්‍රසම්පාදනය සඳහා වෙළෙඳපොළ මිල සැඳහුම් ක්‍රමය අනුගමනය කිරීම, වැඩිම මිල ගණනට ආයතනයකින් උපකරණ මිලදී ගැනීම නිසා අමාත්‍යාංශය වෙත රු. 814,680/- ක අමතර පිරිවැයක් දැරීමට සිදුවීම, රු.4,380,559/-ක උපකරණ මිලදී ගත් ආයතනය අමාත්‍යාංශයේ ලියාපදිංචි සැපයුම්කරුවෙකු නොවීම, ප්‍රසම්පාදන ක්‍රියා පටිපාටියට බැහැරව ශ්‍රවණාගාරයට පුටු මිලදී ගැනීමට රු. 3,289,50/- ක් වැයවීම. | රට තුළ එවකට පැවති කොවිඩ් ඇඳිරිනීති තත්වය මත, ඒ වන විට විවෘත ව තිබූ සැපයුම්කරුවන්ගෙන් මෙලෙස මිලදී ගැනීමට සිදුවූ බව ප්‍ර.ග.නි. ප්‍රකාශ කළේය. <br><br> **<u>නිර්දේශ</u>** <br><br> - ටෙන්ඩර් පටිපාටියට අනුගත නොවේ නම් එය සද්භාවයෙන් ආයතනයේ යහපත පිණිස පමණක් සිදුවිය යුතු බව කාරක සභාව මෙහිදී අවධාරණය කළේය. |
| 08. | ***<u>වෙළෙඳ අමාත්‍යාංශ කාර්යාලයෙහි අභ්‍යන්තර</u>*** | මේ පිළිබඳ කාරක සභාව සිය අප්‍රසාදය පළ කළේය. |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | - ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) /ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම්<br><br>- කාරක සභාවේ නිරීක්ෂණ, නිර්දේශ / නියෝග |
|---|---|---|
| | ***<u>නිර්මානකරණය හා කාර්යාල වෙන් කිරීම.</u>***<br><br>මෙම කාර්යයේදී රු. 22,000,000/- ක් වූ ප්‍රතිපාදන සීමාව ඉක්මවා අමාත්‍යාංශය විසින් රු.35,032,625/- ක ඇස්තමේන්තුවක් සකසා, රු. මිලියන 35 ඉක්මවූ ඉහත කාර්යය සඳහා ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයට පටහැනිව ලියාපදිංචි නොවුණු සැපයුම්කරුවන්ගෙන් මිල ගණන් කැඳවා සහ විකල්ප ලංසු ඉදිරිපත් කිරීමට ලංසු ලේඛන වල සඳහනක් නොවූවද ආයතන 2ක් විකල්ප ලංසු ඉදිරිපත් කර තිබුණි.<br><br>එබැවින්, ලංසු ඇගයීමේදී එවැනි විකල්ප ලංසු නොසැලකිය යුතු වුවද අඩු ලංසු ඉදිරිපත් කළ ආයතන තිබියදී ලංසු සුරක්ෂණයක් හා කාර්යසාධන සුරක්ෂණයක් නොතිබුණ රු. 14,019,655/- ක විකල්ප ලංසුවට කොන්ත්‍රාත්තුව ප්‍රදානය කර ඇත. | |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | **- ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) /ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම්**<br><br>**- කාරක සභාවේ නිරීක්ෂණ, නිර්දේශ / නියෝග** |
|---|---|---|
| 09. | ***<u>අමාත්‍යවරයාගේ සහ අමාත්‍යවරයාගේ සහාය කාර්ය මණ්ඩල සඳහා නිල වාහන</u>***<br><br>2010.05.14 දිනැති ජනාධිපති චක්‍රලේඛය ප්‍රකාරව අමාත්‍යවරයාගේ සහ අමාත්‍යවරයාගේ සහාය කාර්ය මණ්ඩල සඳහා භාවිත කළ හැකි උපරිම නිල වාහන සංඛ්‍යාව 08ක් වුවද නිල වාහන 11ක් යොදවා තිබීම. | මෙම වාහන එක් වරකදී අනුයුක්ත කළ වාහන නොව වරින්වර අනුයුක්ත කළ වාහනවල එකතුවක් බව ප්‍ර.ග.නි. ප්‍රකාශ කළේය. |
| 10. | ***<u>අපනයන සංවර්ධන නිලධාරීන් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස වෙත යොමු කිරීම</u>***<br><br>අමාත්‍යාංශය වෙත අනුයුක්ත කළ අපනයන සංවර්ධන නිලධාරීන් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස වෙත යොමු කිරීම සම්බන්ධයෙන් විධිමත් මිනිස් බල සැලැස්මක් නොමැතිවීම නිසා 2022.03.22 වන විට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 107ක පුරප්පාඩු පැවතියද එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයකට එක් නිලධාරියෙකුට වැඩි ප්‍රමාණයක් අනුයුක්ත කර තිබීම. | <u>**නිර්දේශ**</u><br><br>- මෙම අපනයන සංවර්ධන නිලධාරීන් අනුයුක්ත කිරීම පිළිබඳ අධීක්ෂණය කර කාරක සභාවට වාර්තාවක් ලබා දෙන ලෙස කාරක සභාව ප්‍ර.ග.නි. වෙත නියෝග කළේය. |

| | | |
|---|---|---|
| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | **- ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) /ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම්**<br><br>**- කාරක සභාවේ නිරීක්ෂණ, නිර්දේශ / නියෝග** |
| **බලශක්ති අමාත්‍යාංශය**<br>**විමර්ශනය කරන ලද දිනය - 2022 මැයි 05** | | |
| ❖ කැඳවන ලද ආයතන -<br>බලශක්ති අමාත්‍යාංශය | | |
| 01 | ***කාර්යය මණ්ඩලය*** | 2020 වර්ෂය අවසානය වන විට අමාත්‍යාංශයේ අනුමත කාර්ය මණ්ඩලය 90 ක් වූ අතර තත්‍ය කාර්ය මණ්ඩලය 72 ක් විය. මෙම පුරප්පාඩු අතර තාක්ෂණික නිලධාරීන්ගේ පුරප්පාඩු පැවතීම හේතුවෙන් තාක්ෂණික වාර්තා ලබා දීමට අමාත්‍යාංශය අසමත් වී ඇති බව කාරක සභාව හමුවේ අනාවරණය විය.<br><br>තාක්ෂණික නිලධාරීන් සම්බන්ධයෙන් වන පුරප්පාඩු සලකා බැලීමේදී මේ වන විට ප්‍රධාන ඉංජිනේරු තනතුර හැර අනෙකුත් මාණ්ඩලික නිලධාරී තනතුරු සඳහා බඳවා ගැනීම් අවසන් කර ඇති බව ප්‍ර.ග.නි /ග.නි ප්‍රකාශ කළේය. |
| 02 | ***සපුගස්කන්ද තෙල් පිරිපහදුව නවීකරණය කිරීමේ වර්තමාන තත්වය*** | මේ සම්බන්ධයෙන් 2010 වර්ෂයේ දී කළ ශක්‍යතා අධ්‍යයනයක් අනුව මෙම තෙල් පිරිපහදුව අලුත්වැඩියා කොට දිනකට බැරල් 70,000 ක් පමණ සැපයීමට ඩොලර් බිලියනයකට වඩා වැය වන බව පෙනී ගිය බවත්, ඒ අනුව 2019 දී කළ පූර්ව ශක්‍යතා අධ්‍යයනයකට අනුව පවතින පිරිපහදුව වැඩිදියුණු කිරීමට (Upgrade) ඩොලර් මිලියන 100-150 ක් අතර වැය වන බවත් ප්‍ර.ග.නි/ග.නි ප්‍රකාශ කළේය. |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | - ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) /ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම්<br><br>- කාරක සභාවේ නිරීක්ෂණ, නිර්දේශ / නියෝග |
|---|---|---|
| | | ශ්‍රී ලංකාවේ ඛනිජ තෙල් පරිභෝජනයෙන් ශ්‍රී ලංකාව තුළ පිරිපහදු කිරීම මගින් ලබාගනු ලබන්නේ 30% කට වඩා අඩු ප්‍රමාණයක් බවත් ඉතිරිය පිරිපහදු කළ තෙල් ලෙස ආනයනය කරන බවත් මෙහිදී අනාවරණය විය.<br><br>පිරිපහදු කරන ලද තෙල් ආනයනයට වඩා ලංකාව තුළ තෙල් පිරිපහදු කිරීම වඩා ලාභදායි බව අනාවරණය විය.<br><br><u>නිර්දේශ</u><br><br>- සපුගස්කන්ද තෙල් පිරිපහදුව නවීකරණයේදී ඉටු කළ යුතු ඉදිරි වැඩ කටයුතු, අදාළ වගකීම් දරන්නන්, සහ ඒ සඳහා ගතවන කාලය (දින වකවානු සහිතව) ඇතුළත් වාර්තාවක් කාරක සභාව වෙත ලබා දෙන ලෙස නියෝග කළේය. |
| 03 | <u>*ඉදිකිරීමට අපේක්ෂිත නව තෙල් පිරිපහදුව ස්ථාපිත කිරීම*</u> | <u>නිර්දේශ</u><br>- මේ සම්බන්ධයෙන් අදාළ පියවර සහ ඒ සඳහා ගතවන කාල වකවානු ඇතුළත් වාර්තාවක් කාරක සභාව වෙත ලබා දෙන ලෙස කාරක සභාව නියෝග කළේය. |
| 04 | <u>*අබලන්ව පවතින නළ පද්ධතිය පිළිසකර කිරීමේ වර්තමාන තත්වය*</u> | මේ සම්බන්ධයෙන් 2019 වර්ෂයේ දී ටෙන්ඩරයක් අනුමත වී තිබුණද ඒ සඳහා අධික මුදලක් වැය වන බැවින් ලංකා ඛනිජ තෙල් තොග ගබඩා පර්යන්ත සමාගමේ දායකත්වය මත එය ක්‍රියාත්මක |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | - ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) /ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම්<br><br>- කාරක සභාවේ නිරීක්ෂණ, නිර්දේශ / නියෝග |
|---|---|---|
| | | කිරීම සඳහා යෝජනා වී ඇති බව මෙහිදී අනාවරණය විය. වරායේ සිට කොළොන්නාව දක්වා ඇති එක් නළ පද්ධතියක් මේ වන විට සම්පූර්ණයෙන්ම අලුත්වැඩියා කර ඇති බවත් තවත් නළ පද්ධති 2ක් අලුත්වැඩියා කිරීමට නියමිත බවත් ප්‍ර.ග.නි/.ග.නි ප්‍රකාශ කළේය. |
| 05 | ***<u>මන්නාරම් ද්‍රෝණියේ තෙල් ගවේෂණය පිළිබඳ කටයුතුවල ප්‍රගතිය</u>*** | ශ්‍රී ලංකාව, ඉන්දිවේ Cairn සමාගම සමඟ 2008 දී ඇති කර ගනු ලැබූ ගිවිසුමක් (Production Sharing Agreement) අනුව 2011 වසරේ දී තෙල් ළිං 3 ක කැණීම් සිදු කළ අතර ඉන් ළිං 2 ක ගෑස් ඇති බව හඳුනාගත් බව ප්‍ර.ග.නි/.ග.නි ප්‍රකාශ කළේය. මේ සඳහා අදාළ සමාගම විසින් ඩොලර් මිලියන 240 ක් ගවේෂණ කටයුතු සඳහා වැය කර ඇති බවත් ගිවිසුම අත්සන් කිරීමේ දී දීමනාවක් ලෙස (Signature Bonus) ඩොලර් මිලියන 1ක් ශ්‍රී ලංකා රජයට ගෙවා ඇති බවත්, අනාවරණය කළේය. මෙම ගිවිසුම ප්‍රකාරව ගවේෂණ කටයුතු වලට අදාළ සියලු දත්ත ශ්‍රී ලංකා රජයට අයත් බව සඳහන් කළේය.<br><br>2013 -2015 කාලයේදී ලොව පුරා තෙල් මිල පහළ බැසීම හේතුවෙන් ගවේෂණ කටයුතු නතර වූ බව ප්‍රකාශ කළේය. නැවත වරක් ගෑස් ගවේෂණය සංවර්ධන කිරීමට 2017 වසරේදී අභිලාශය ප්‍රකාශ කිරීම් සඳහා ඉල්ලීම් Expression of Interest (EOI) කැඳවූ අවස්ථාවේ ඒ සඳහා උනන්දුව ඇති ආයෝජන සමාගම් 7 ක් පමණ ඉල්ලුම් කර ඇති බවත් ප්‍ර.ග.නි/.ග.නි ප්‍රකාශ කළේය. |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | **- ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) /ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම්**<br><br>**- කාරක සභාවේ නිරීක්ෂණ, නිර්දේශ / නියෝග** |
|---|---|---|
| | | කෙසේ වුව ද ලංකාවෙන් ලබා ගන්නා ගෑස් ලංකා රජය විසින් මිලදී ගන්නා බවට ප්‍රතිපත්තිමය තීන්දුවක් මේ දක්වා නොගැනීම ආයෝජකයින් ලංකාව තුළ තෙල් ගවේෂණ ව්‍යාපෘති සඳහා සම්බන්ධ නොවීමට ප්‍රධාන වශයෙන් හේතු වී ඇති බව ප්‍ර.ග.නි/.ග.නි ප්‍රකාශ කළේය.<br><br>එසේම, මේ වන විට ද ඛනිජ තෙල් සංවර්ධන අධිකාරිය සඳහා බඳවා ගැනීමේ පටිපාටිය අනුමත වී නොමැති බවද මේ හේතුවෙන් වැඩකටයුතු ප්‍රමාදව පවතින බවද මෙහිදී අනාවරණය විය. ඒ අනුව කඩිනමින් අවශ්‍ය කාර්ය මණ්ඩලය බඳවා ගැනීම අතවශ්‍ය කරුණක් බවත්, කාර්ය මණ්ඩලය සඳහා අනුමැතිය ලබා ගැනීම කඩිනමින් සිදුවිය යුතු බවත් කාරක සභාව අවධාරණය කළේය. |
| 06 | ***<u>තෙල් ප්‍රවාහනය සඳහා දුම්රිය මාර්ගය පද්ධතියක් භාවිත කිරීම</u>***<br><br>සපුගස්කන්ද තෙල් පිරිපහදුව, මුතුරාජවෙල සහ කොළොන්නාව තෙල් ගබඩා පර්යන්ත අතර නළ පද්ධති එකිනෙකට සම්බන්ධ (Link) නොවන බැවින් තෙල් ප්‍රවාහනය සඳහා විශාල පිරිවැයක් දැරීමට සිදුවන බවත්, දුම්රිය මාර්ගය පද්ධතියක් භාවිත කිරීමෙන් මේ සඳහා වැයවන පිරිවැය අවම කර ගත | තෙල් ප්‍රවාහනය සඳහා මුතුරාජවෙල සහ දුම්රිය මාර්ගය සම්බන්ධ කිරීම පිළිබඳ මේ වන විට සාකච්ඡා කරමින් සිටින බවත්, මුතුරාජවෙල සහ කොළොන්නාව සම්බන්ධ කළ හැකි නළ පද්ධතියක් ඉදි කිරිමට විශාල වියදමක් දැරීමට සිදුවන බවත් ප්‍ර.ග.නි/.ග.නි ප්‍රකාශ කළේය. කොළොන්නාවේ සිට දුම්රිය මාර්ගය භාවිතා කර තෙල් ප්‍රවාහනය කළ හැකි පරිදි කොළොන්නාව සහ මුතුරාජවෙල ගබඩා පර්යන්ත වලට තුලනාත්මකව තෙල් ගොඩබෑම සිදුකරන බව ප්‍ර.ග.නි/.ග.නි ප්‍රකාශ කළේය. මේ නිසා තෙල් පිට පළාත් සඳහා බෙදාහැරීමේ |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | - ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) /ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම් <br> - කාරක සභාවේ නිරීක්ෂණ, නිර්දේශ / නියෝග |
|---|---|---|
| | හැකි බවත් පෙන්වා දුන් කාරක සභාව, ඒ සම්බන්ධයෙන් ගෙන ඇති ක්‍රියාමාර්ග පිළිබඳ විමසීය. | ප්‍රමාණය වැඩි කිරීමට සහ මුතුරාජවෙල සිට බවුසර මගින් තෙල් බෙදාහැරීම අවම කිරීමට හැකි වී ඇති බවත් ප්‍ර.ග.නි/.ග.නි පැහැදිලි කළේය. |
| 07 | ***<u>ඉන්ධන පිරවුම්හල්වලින් කුලිය ලබා නොගැනීම</u>*** <br><br> සංස්ථාව සතු ඉන්ධන පිරවුම්හල්වලින් කුලිය ලෙස ආදායමක් ලබා නොගැනීම | **<u>නිර්දේශ</u>** <br><br> - සංස්ථාව සතු ඉන්ධන පිරවුම්හල්වලින් කුලිය ලෙස ආදායමක් ලබා ගැනීමට හැකි බව 2013 දි තීරණය කර තිබියදීත්, එසේ ආදායම ලබා නොගැනීම සම්බන්ධයෙන් වාර්තාවක් 2022.06.10 දිනට පෙර කාරක සභාව වෙත ලබා දෙන ලෙස කාරක සභාව නියෝග කළේය. |
| **බලශක්ති අමාත්‍යාංශය** <br><br> **විමර්ශනය කරන ලද දිනය - 2022 ජූනි 22** | | |
| ❖ කැඳවන ලද ආයතන - <br> බලශක්ති අමාත්‍යාංශය | | |
| 01. | ***<u>ශ්‍රී ලංකා ඛනිජ තෙල් සංවර්ධන අධිකාරියේ සභාපති විසින් සිදු කළ පරිගණක දෘෂ්‍ය ඉදිරිපත් කිරීම</u>*** | ඛනිජ තෙල් හා ගෑස් සමාගම් විසින් ඛනිජ තෙල් ගවේෂණයේ දී පොළොව මට්ටමෙන් පහළ (below ground) සහ පොළොව මට්ටමෙන් ඉහළ (above ground) යන දෙයාකාරයෙන් අවදානම (risks) පිළිබඳ සලකා බලන බව ශ්‍රී ලංකා ඛනිජ තෙල් සංවර්ධන අධිකාරියේ සභාපති පැහැදිලි කළේය. පොළොව මට්ටමෙන් ඉහළ අවදානම් ක්ෂේත්‍රය තුළදී ප්‍රතිපත්තිය, නියාමනය, රාජ්‍ය මූල්‍ය |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | - ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) /ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම්<br><br>- කාරක සභාවේ නිරීක්ෂණ, නිර්දේශ / නියෝග |
|---|---|---|
| | | පාලන තන්ත්‍රය, වෙළෙඳපළ සහ ස්ථාවරත්වය යන කරුණු පිළිබඳ සලකා බලන බව ගණන් දීමේ නිලධාරී (ග.නි) තවදුරටත් සඳහන් කළේය. |
| 02. | <u>**ශ්‍රී ලංකාව ඛනිජතෙල් කලාපයක් ලෙස තරඟකාරී කිරීම**</u><br><br>ශ්‍රී ලංකා ඛනිජ තෙල් සංවර්ධන අධිකාරිය විසින් පොළොව මතුපිට අවදානම අවම කිරීමට සහ අනාගතයේදී ශ්‍රී ලංකාව ඛනිජතෙල් කලාපයක් ලෙස වඩාත් තරඟකාරී කිරීම සඳහා නව දත්ත ලබා ගැනීම, ස්වභාවික වායු පිළිබඳ ජාතික ප්‍රතිපත්තියක් හඳුන්වා දීම, 2021 අංක 21 දරන ඛනිජ තෙල් සම්පත් පනත පැනවීම, අක්වෙරළ බිම් කොටස් ප්‍රමාණයෙන් අඩු කිරීම සහ ශ්‍රී ලංකාවේ සියලුම අක්වෙරළ ද්‍රෝණි සඳහා ඒකාබද්ධ ගවේෂණ අධ්‍යයන හඳුන්වා දීම වැනි පියවර ගෙන ඇති බව මෙහිදී සඳහන් විය.<br><br>ජාත්‍යන්තර වෙළෙඳපොළට ප්‍රවේශ විය හැකි පරිදි ඛනිජ තෙල් සම්පත් පනත 2021 වසෙර්දී ඉදිරිපත් කිරීමෙන් පසු, ගවේෂණ අධ්‍යනයන්ගෙන් | |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | **- ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) /ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම**<br><br>**- කාරක සභාවේ නිරීක්ෂණ, නිර්දේශ / නියෝග** |
|---|---|---|
| | ලබා ගන්නා ලද දත්ත විදේශ සමාගම්වලට ලබා ගැනීමට අවස්ථාව දෙන බවත්, ශ්‍රී ලංකාව විසින් මේ වන විට ඩොලර් මිලියන 10 කට ආසන්න දත්ත විකුණා ඇති බවත් එමගින් ඛනිජ තෙල් ගවේෂණයට ආයෝජකයන් කැඳවීමට පියවර ගත හැකි බවත් මෙහිදී අනාවරණය විය. | |
| 03. | ***<u>ජාත්‍යන්තර සමාගම් ගිවිසුම් වලට එළඹීමේදී වාණිජමය වටිනාකම තක්සේරු කරන ආකාරය</u>***<br><br>ඛනිජ තෙල් හෝ ගෑස් ව්‍යාපෘති සඳහා ආයෝජනය කරන ජාත්‍යන්තර සමාගම් ගිවිසුම් වලට එළඹීමේදී වාණිජමය වටිනාකම තක්සේරු කරන ආකාරය සහ එවැනි ගිවිසුම් වලින් ලංකාවට සිදුවන බලපෑම පිළිබඳ මෙහිදී කාරක සභාව විමසීය. එසේම මෙම ගිවිසුම් කොන්දේසිවල ස්ථායිතාව පිළිබඳවද මෙහිදී සාකච්ඡා විය. | එවැනි ජාත්‍යන්තර සමාගම් වර්තමානයේ පවතින මිල ගණන් මත ගිවිසුම් ගත නොවන බවත්, ඔවුන් සලකා බලනුයේ මුළු ව්‍යාපෘතිය සඳහාම පදනම් කරගත් අභ්‍යන්තර ප්‍රතිලාභ අනුපාතය (Internal Rate of Return - IRR) බවත්, ග.නි ප්‍රකාශ කළේය. එසේම යෝජනා කරනු ලබන ගිවිසුම් පවතින නීතින්ට අනුගත, ජාත්‍යන්තර සම්ප්‍රදායන්ට අනුකූල සහ සාධාරණ ගිවිසුම් බවත් ග.නි ප්‍රකාශ කළේය. එසේම දැනට ගෑස් ගවේෂණ කටයුතු ඇරඹීම සඳහා ආයෝජකයන් සමඟ ගිවිසුම්ගත වීමේ හැකියාව සොයා බලන බවත්, අනතුරුව නිෂ්පාදන කටයුතු ඇරඹීමට සාකච්ඡා කළ යුතු බවත් ග.නි සඳහන් කළේය. |
| 04. | ***<u>ශ්‍රී ලංකා ඛනිජ තෙල් සංවර්ධන අධිකාරිය සඳහා කාර්ය මණ්ඩලය</u>***<br><br>ශ්‍රී ලංකා ඛනිජ තෙල් සංවර්ධන අධිකාරිය සඳහා කාර්ය | **<u>නිර්දේශ</u>**<br><br>- F.R 71-හැකි ඉක්මනින් (23.06.2022) මහා භාණ්ඩාගාරයේ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත යොමු කරන |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | **- ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) /ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම්**<br><br>**- කාරක සභාවේ නිරීක්ෂණ, නිර්දේශ / නියෝග** |
|---|---|---|
| | මණ්ඩලය ප්‍රමාණවත් නොවීම සහ කාර්ය මණ්ඩලයට පත් කිරීමට අවශ්‍ය මුදල් රෙගුලාසි (F.R 71) ලේඛනය මේ වන විටත් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ලබා දීමට කටයුතු කර නොතිබීම | ලෙසද අධිකාරියේ වැඩකටයුතු ස්ථාපනය කිරීම සඳහා ගත වන කාල වකවානු ඇතුළත් වාර්තාවක් 2022 ජූලි 10 ට පෙර කාරක සභාව වෙත ලබා දෙන ලෙස ද ප්‍ර.ග.නි වෙත නියෝග කළේය.<br><br>ශ්‍රී ලංකා ඛනිජ තෙල් සංවර්ධන අධිකාරියේ පරිපාලන හා මූල්‍ය කටයුතු සඳහා අමාත්‍යාංශයේ නිලධාරීන් දෙදෙනෙකු තාවකාලිකව නිදහස් කර ඇති බව සහ කාර්ය මණ්ඩලය බඳවා ගන්නා තෙක් අභ්‍යාසලාභි උපාධිධාරීන් තාවකාලික පදනම මත බඳවා ගැනීමට කටයුතු කරන බව ප්‍ර.ග.නි ප්‍රකාශ කළේය.<br><br>ශ්‍රී ලංකාවේ ගෑස් හා ඛනිජතෙල් ගවේෂණ සම්බන්ධ දත්ත ලෝක වෙළෙඳපොළ තුළ අලෙවි වන බැවින් ජාත්‍යන්තර පිළිගැනීමක් ඇති වී ඇති බවත්, මේ වන විට ලංකාව තුළ ගෑස් හා ඛනිජ තෙල් නිෂ්පාදනයට අවශ්‍ය මහ සැලකිය යුතු මට්ටමකින් පිළියෙළ කර ඇති බවත්, මේ වසර අවසානය වන විට ශිවිසුම්ගත වීමට අපේක්ෂා කරන බවත් ග.නි ප්‍රකාශ කළේය. |
| 05. | ***ලංකාව තුළ ගෑස් පරිභෝජනය***<br><br>ලංකාව තුළ ගෑස් පරිභෝජනය විදුලිය, ප්‍රවාහනය, ගෘහස්ත සහ කර්මාන්ත යන ක්ෂේත්‍රවල | **නිර්දේශ**<br><br>ගෑස් ගවේෂණය අවසන් වූ පසු ලංකාව තුළ පරිභෝජනයට ගැනීමේ හැකියාව සොයා බලා ඒ සම්බන්ධයෙන් අවශ්‍ය |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | - ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) /ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම්<br><br>- කාරක සභාවේ නිරීක්ෂණ, නිර්දේශ / නියෝග |
|---|---|---|
| | භාවිත කරන අතර මින් වැඩි වශයෙන් භාවිතයට ගනු ලබන්නේ විදුලි උත්පාදනය සඳහා වේ. එසේම, ආනයනය කරන ලද එල්එන්ජී (Liqufied Natural Gas) භාවිත කිරීමේ දී ගෑස් ලබා ගැනීම සඳහා, දියරයක් ලෙස ප්‍රවාහනය කළ යුතු බැවින් දියරකරණය කිරීම, (Liquidizer) ප්‍රවාහනට සහ නැවත ගෑස් බවට පත් කිරීම සඳහා (Re Gasification) විශාල වශයෙන් මුදල් වැය වන බව | පියවර ගන්නා ලෙස ද කාරක සභාව නිර්දේශ කළේය.<br><br>විදුලිබල මණ්ඩලය මේ වන විට විදුලිබල සහ බලශක්ති අමාත්‍යාංශය යටතේ පවතින බැවින් ඒ සඳහා මෙම ආයතන දෙක ඒකාබද්ධ වී ශ්‍රී ලංකාව තුළ නිෂ්පාදනය කළ හැකි ගෑස්, විදුලිබල මණ්ඩලය විසින් ලබා ගැනීම සම්බන්ධයෙන් ප්‍රතිපත්තියක් සකස් කිරීමේ වැදගත් කම කාරක සභාව විසින් පෙන්වා දෙන ලදි. එසේම එමගින් ලංකාව තුළ ගෑස් කැණීම් සිදු කිරීමට උනන්දුවක් දක්වන විදේශීය ආයෝජකයින්ට ශ්‍රී ලංකාවේ නිෂ්පාදනය කරන ගෑස් ලංකා රජය විසින් මිලදී ගන්නා බවට සහතික වීමේ අවස්ථාව හිමිවන බවද කාරක සභාව විසින් පෙන්වා දුන්නේය. |
| 06. | ***New Fortress Energy ගිවිසුම*** | **නිර්දේශ**<br><br>- ශ්‍රී ලංකාව තුළ දේශීය ඛනිජතෙල් කර්මාන්තයේ අනාගතය සුරක්ෂිත කිරීමට New Fortress Energy ගිවිසුමට සිදු කළ යුතු සංශෝධන පිළිබඳ යෝජනා මෙන්ම මෙම ගිවිසුමේ පවතින වාසි හා අවාසි ඇතුළත් වාර්තාවක් කාරක සභාව වෙත ලබා දෙන ලෙස කාරක සභාව ප්‍ර.ග.නි වෙත නියෝග කළේය. |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | **- ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) /ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම්**<br><br>**- කාරක සභාවේ නිරීක්ෂණ, නිර්දේශ / නියෝග** |
|---|---|---|
| | | ගිවිසුමට අදාළව සිදුවන ආර්ථික බලපෑම, වියදම හා පවතින අවධානම පිළිබඳ කරුණු මනාව තක්සේරු කළ යුතු බවද මෙහිදී අවධාරණය කෙරිණි. |
| 07. | ***<u>ස්වභාවික වායු ප්‍රයෝජ්‍යකරණය පිළිබඳ ප්‍රධාන මෙහෙයුම් කමිටුව (The Gas Utilization Master Plan Committee)</u>*** | <u>නිර්දේශ</u><br><br>- අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන "The Gas Utilization Master Plan Committee" යන කමිටුව සක්‍රිය කර, ඒ අනුව අදාළ ආයතන ක්‍රියාත්මක කිරීමට කටයුතු කරන ලෙස කාරක සභාව නියෝග කළ අතර, මෙම කමිටුවෙහි සමාජිකයන්ගේ නම්, එහි විෂය පථය සහ අවසන් කාර්ය සටහන් ඇතුළු විස්තරාත්මක වාර්තාවක් කාරක සභාව වෙත මසක් තුළ ලබා දීමට ද ප්‍ර.ග.නි වෙත නියෝග කළේය. |
| 08. | ***<u>ගෑස් කැණීම් කිරීම සඳහා ආයෝජකයින් සමඟ ගිවිසුම් ගත වීම</u>*** | <u>නිර්දේශ</u><br><br>- ගෑස් කැණීම් කිරීම සඳහා ආයෝජකයින් සමඟ ගිවිසුම් ගත වීමට ගතවන කාලය පිළිබඳ අවධානය යොමු කළ කාරක සභාව, ලංකාව තුළ ගෑස් ගවේෂණය සහ කැණීම් සිදු කිරීමට අදාළ දින වකවානු සහිත මාර්ග සිතියම (Road Map), ඒ සඳහා යොදා ගනු ලබන ආදායම් ආකෘතිය (Revenue Model), ගෑස් ගවේෂණය |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | - ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) /ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම්<br><br>- කාරක සභාවේ නිරීක්ෂණ, නිර්දේශ / නියෝග |
|---|---|---|
| | | සම්බන්ධයෙන් මෙතෙක් මතු වී ඇති හා ගෑස් පරිභෝජනයට ගත හැකි අවස්ථාව වන තෙක් මතු වේ යැයි අපේක්ෂා කරන ගැටළු ඇතුළත් වාර්තාවක් 2022 නොවැම්බර් මස 1 වැනි දිනට පෙර කාරක සභාව වෙත ලබා දීමට ද ප්‍ර.ග.නි වෙත නියෝග කළේය. |
| 09. | <u>***පෞද්ගලික ඉන්ධන පිරවුම්හල් සහ ඛනිජතෙල් සංස්ථාව සතු ඉන්ධන පිරවුම්හල්වලින් කුලිය ලබා ගැනීමේ අඩුලුහුඬුකම්***</u> | ඛනිජතෙල් සංස්ථාව සතු ඉන්ධන පිරවුම්හල් 11 කින් පමණ කුලිය අය කිරීම පිළිබඳවද මෙහිදී ප්‍රශ්න මතු කළ අතර මෙම කුලී අයකිරීමේ ක්‍රියාවලිය විධිමත් කිරීමේ අවශ්‍යතාවය කාරක සභාවේ දී අවධාරණය කෙරිණි.<br><br>මෙහිදී අදහස් දැක්වූ ප්‍ර.ග.නි/ග.නි ඛනිජ තෙල් සංස්ථාව සතු සියලුම ඉන්ධන පිරවුම්හල්වලින් අයවිය යුතු කුලිය ලබා ගැනීමට 2022 ජුලි මස සිට කටයුතු කරන බව ප්‍රකාශ කළේය. |
| 10. | <u>***ඛනිජ තෙල් විකිණීම වෙනුවෙන් ලබා දෙන කොමිස් මුදල හේතුවෙන් සිදුවන අලාභය***</u><br><br>ඛනිජ තෙල් විකිණීම වෙනුවෙන් ලබා දෙන කොමිස් මුදල (Dealer Commission) උපරිම මිල ඉක්මවා තිබියදී වර්තමානයේ පවතින වෙළෙඳ පොළ වටිනාකමට අනුව | මෙම මුදල අයකර ගැනීමේ හැකියාවක් තිබේ නම් එසේ කිරීම යෝග්‍ය බවද අවධාරණය කළේය.<br><br>මෙම ගැටලුවට පිළියමක් ලෙස උපරිම සහ අවම මිලක් (Upper Cap, Lower Cap) හඳුන්වා දීමට යෝජනා කළද ඊට විරුද්ධව විකුණුම්කරුවන් විසින් අධිකරණය වෙතින් තහනම් නියෝගයක් ලබා ගෙන ඇති බවත් මෙම නඩු කටයුතු අවසන් වී නොමැති බවත් ප්‍ර.ග.නි/ග.නි |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | **- ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) /ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම්**<br><br>**- කාරක සභාවේ නිරීක්ෂණ, නිර්දේශ / නියෝග** |
|---|---|---|
| | කොමිස් මුදල ලබා දීම සහ වැඩි මුදලක් ගෙවීම හේතුවෙන් ලංකා ඛනිජ තෙල් සංස්ථාවට රුපියල් බිලියන 3 කට අධික අලාභයක් සිදු වීම | ප්‍රකාශ කළේය. තවද මෙම කොමිස් මුදල සඳහා ප්‍රතිශතයක් ලෙස නොව ස්ථාවර මිලක් නියම කිරීම පිළිබඳව නීතිපති වෙතින් උපදෙස් ලබා ගැනීමට කටයුතු කරන බවත් හෙතෙම ප්‍රකාශ කළේය.<br><br><u>නිර්දේශ</u><br><br>- අධිකරණ කටයුතු වලදී සංස්ථාව වෙනුවෙන් සර්ව සම්පූර්ණ හා නිවැරදි තොරතුරු අධිකරණයට ඉදිරිපත් කිරීමට කටයුතු කරන ලෙස කාරක සභාව ප්‍ර.ග.නි/ග.නි වෙත නියෝග කළේය. |
| **කෘෂිකර්ම අමාත්‍යාංශය**<br><br>**විමර්ශනය කරන ලද දිනය - 2022 ජූනි 07** | | |
| ❖ **කැඳවන ලද ආයතන -**<br>කෘෂිකර්ම අමාත්‍යාංශය | | |
| 01. | <u>*රසායනික පොහොර භාවිතය අත්හිටුවීම*</u><br><br>රසායනික පොහොර භාවිතය අත්හිටුවීමෙන් පසුව නිෂ්පාදනය මෙන්ම වගා කරන ලද බිම් ප්‍රමාණයද සැලකිය යුතු ප්‍රමාණයකින් අඩුවීම. | 2021 වර්ෂයේ සමස්ත සහල් නිෂ්පාදනය මෙට්‍රික් ටොන් ලක්ෂ 33 ක් පමණ වුවත්, 2022 වර්ෂයේ සහල් නිෂ්පාදනය මෙට්‍රික් ටොන් ලක්ෂ 16ක් පමණ වේයැයි උපකල්පනය කර ඇති බව කෘෂිකර්ම අමාත්‍යාංශයේ ප්‍ර.ග.නි. ප්‍රකාශ කළේය. මෙය 2021 වර්ෂයේ සමස්ත සහල් නිෂ්පාදනයට සාපේක්ෂව 50%ක පමණ අඩුවීමක් බවද ඔහු ප්‍රකාශ කළේය. |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | **- ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) /ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම්**<br><br>**- කාරක සභාවේ නිරීක්ෂණ, නිර්දේශ / නියෝග** |
|---|---|---|
| | | ශ්‍රී ලංකාවේ වාර්ෂික සහල් අවශ්‍යතාවය මෙට්‍රික් ටොන් ලක්ෂ 24ක් පමණ වන බැවින් 2022 වර්ෂයේ සහල් අවශ්‍යතාවයෙන් මෙට්‍රික් ටොන් ලක්ෂ 8ක පමණ අඩුවක් ඇති විය හැකි බව ද ප්‍රකාශ කළේය. |
| 02. | ***<u>කෘෂිකර්ම අමාත්‍යාංශය සතුව නිවැරදි දත්ත නොමැතිවීම</u>***<br><br>කෘෂිකර්ම අමාත්‍යාංශය සතුව නිවැරදි දත්ත නොමැතිවීම හා කෘෂිකර්ම පර්යේෂණ නිලධාරීන් මගින් නිවැරදි තොරතුරු ලබා ගැනීමට කටයුතු නොකිරීම. | අමාත්‍යාංශය සතු දත්ත 100%ක් නිවැරදි නොවන බව පිළිගන්නා බව ප්‍රකාශ කළ ප්‍ර.ග.නි., අමාත්‍යාංශය ඇස්තමේන්තු කරන සම්පූර්ණ බිම් ප්‍රමාණය වගා නොකිරීමත්, පොහොර සහනාධාරය ලබා ගැනීම සඳහා ඇතැම් ගොවීන් ව්‍යාජ තොරතුරු ඉදිරිපත් කර තිබීම නිසා ඊට අනුව අස්වැන්න ගණනය කිරීමත් මෙම තත්ත්වයට හේතුවී ඇති බව ප්‍රකාශ කළේය.<br><br>මෙම ප්‍රශ්නය නිවැරදි කිරීම සඳහා කටයුතු කරමින් පවතින බව ප්‍රකාශ කළ ප්‍ර.ග.නි., මේ වනවිට "GEO ගොවියා" නමින් පරිගණක යෙදුමක් (APP) හඳුන්වා දී ඇති බවත්, එළඹෙන මහ කන්නයට පෙර වගා බිම් පිළිබඳ නිවැරදි දත්ත ලබා ගැනීමට බලාපොරොත්තු වන බවත් ප්‍රකාශ කළේය.<br><br>9000 ක් පමණ වන කෘෂිකර්ම පර්යේෂණ නිලධාරීන්ගෙන් වැඩි පිරිසකට ක්ෂේත්‍රය පිළිබඳව මූලික දැනුම නොමැති බවත්, අදාළ ඩිප්ලෝමා පාඨමාලාව සපුරා |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | **- ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) /ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම්**<br><br>**- කාරක සභාවේ නිරීක්ෂණ, නිර්දේශ / නියෝග** |
|---|---|---|
| | | ඇත්තේ 1200 ක පමණ පිරිසක් බවත් මෙහිදී අනාවරණය විය.<br><br>**<u>නිර්දේශ</u>**<br><br>- ගොවිජන සේවා දෙපාර්තමේන්තුව ඇතුළු අදාළ සියලුම ආයතන සමග ඒකාබද්ධව කෘෂිකර්මයට අදාළ තොරතුරු ලබා ගැනීම සම්බන්ධයෙන් විධිමත් වැඩපිළිවෙලක් සකස් කර මසක් ඇතුළත කාරක සභාව හමුවට ලිඛිතව ඉදිරිපත් කරන ලෙස කාරක සභාව විසින් කෘෂිකර්ම අමාත්‍යාංශයේ ප්‍ර.ග.නි. ට නියෝග කළේය. |
| 03. | ***<u>ආහාර අර්බුදයට මුහුණදීම සඳහා පියවර</u>***<br><br>වත්මන් ආර්ථික අර්බුදය හමුවේ නුදුරු අනාගතයේ ඇතිවේ යැයි අනතුරු ඇඟවීම් කර ඇති ආහාර අර්බුදයට මුහුණදීම සඳහා අමාත්‍යාංශය දැනටමත් ගෙන ඇති ක්‍රියාමාර්ග සහ ඉදිරියේදී ගැනීමට අපේක්ෂා කරන පියවර | කඩිනම් ක්‍රියාමාර්ගයක් ලෙස යල කන්නයේ අස්වැන්න වැඩිකර ගැනීම සඳහා අවශ්‍ය පොහොර, කෘමිනාශක හා වල් නාශක ආදිය ලබාදීමට කටයුතු කළ බවත්, කාබනික පොහොර වලට අමතරව යූරියා ලබාදීම සඳහා මේ වනවිට කටයුතු කරගෙන යන බවත්, යූරියා මෙට්‍රික් ටොන් 65,000 න් ඇණවුම් කර ඇති බවත් ප්‍ර.ග.නි. ප්‍රකාශ කළේය. |
| 04. | ***<u>කාබනික පොහොර ප්‍රමිතිය සහ සැපයුම් කරුවන්ට ගෙවන මුදල</u>***<br><br>යල කන්නය සඳහා ගොවීන්ට ලබා දුන් කාබනික පොහොර | කාබනික පොහොර සඳහා මුදල් ගෙවනු ලබන්නේ එහි අඩංගු නයිට්‍රජන් සංයුතියට අනුව බවත්, කාබනික පොහොර කිලෝ ග්‍රෑමයක් සඳහා ගෙවන ලද අවම මුදල |

| | **සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු** | **- ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) /ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම්**<br><br>**- කාරක සභාවේ නිරීක්ෂණ, නිර්දේශ / නියෝග** |
|---|---|---|
| | ප්‍රමිතියෙන් තොර බවට ගොවීන්ගෙන් චෝදනා එල්ල වන බව ප්‍රකාශ කළ කාරක සභාව කාබනික පොහොර කිලෝග්‍රෑම් එකක් සඳහා සැපයුම් කරුවන්ට ගෙවන මුදල පිළිබඳවද සිය අවධානය යොමු කළේය. | රුපියල් 41ක් බවත් ප්‍ර.ග.නි./ ග.නි. ප්‍රකාශ කළේය.<br><br>**<u>නිර්දේශ</u>**<br><br>- පවතින තත්වය යටතේ වගා කටයුතු සඳහා ජනතාව තුළ විශාල උනන්දුවක් දක්නට ලැබෙන බැවින් ඒ සඳහා අවශ්‍ය බීජ සහ ප්‍රමිතියෙන් යුත් පොහොර සැපයීමට අවශ්‍ය කටයුතු සම්පාදනය කිරීම<br><br>- මෙම අර්බුදය හමුවේ විවිධ සංවිධාන මගින්ද වගා වැඩ සටහන් ක්‍රියාත්මක කරන බැවින් එම සංවිධාන අමාත්‍යාංශය තුළ ලියාපදිංචි කිරීමේ වැඩ පිළිවෙළක් සකස් කිරීමට.<br><br>ආහාර අර්බුදයට කෙටි කාලීන පිළියම් ලෙස පහත සඳහන් පියවර මේ වන විට ගෙන ඇති බව ප්‍ර.ග.නි. ප්‍රකාශ කළේය.<br><br>- මෙම වර්ෂයේ පාරිභෝජනයට හිඟ වේ යැයි ඇස්තමේන්තු කර ඇති සහල් ප්‍රමාණය ආනයනය කිරීමට කටයුතු කරන ලෙස වෙළෙඳ අමාත්‍යාංශය දැනුවත් කිරීම.<br><br>- “එක්ව වවමු - රට දිනවමු” තේමාව යටතේ කඩිනම් වගා සංග්‍රාමයක් දියත් කිරීම. |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | **- ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) /ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම්**<br><br>**- කාරක සභාවේ නිරීක්ෂණ, නිර්දේශ / නියෝග** |
|---|---|---|
| 05. | ***<u>වගා කිරීම සඳහා රජය සතු ඉඩම් ලබාදීම.</u>*** | රජයට අයත් වගා නොකළ, වන ජීවී හා වන සංරක්ෂණ නොවන, වාරි පහසුකම් සහිත ඉඩම් වගා කිරීම සඳහා ජනතාවට ලබාදීමට බලාපොරොත්තු වන බව ප්‍ර.ග.නි. ප්‍රකාශ කළේය.<br><br><u>නිර්දේශ</u><br>- වගා කිරීම සඳහා ඉඩම් ලබාදීමේදී තනි පුද්ගලයින්ට නොව ග්‍රාමීය කමිටු/ ප්‍රාදේශීය කමිටු අනුව ලබාදීම වඩාත් යෝග්‍ය බව<br><br>- දක්ෂිණ අධිවේගී මාර්ගය දෙපස තිබෙන අක්කර දහස් ගණනක රක්ෂිත ඉඩම් මඤ්ඤොක්කා, බතල, ගහල වැනි වගාවන් සඳහා යොදා ගැනීමට<br><br>- මෙම වැඩ සටහන නිසි කාල රාමුවකට හා සැලසුමකට අනුව පෙළගැස්වීම හා පසු විපරම් කිරීම. |
| 06. | ***<u>තිරිඟු පිටි හිඟයක් සඳහා විකල්පය</u>***<br><br>තිරිඟු පිටි හිඟයක් ඇති වුවහොත් සහල් සඳහා ඇති ඉල්ලුම ඉහළ යා හැකි බැවින් ඒ සඳහා ඇති විකල්පය | හිඟ සහල් ප්‍රමාණය ආනයනය කිරීමේ කටයුතු වෙළෙඳ අමාත්‍යාංශය විසින් සැළසුම් සහගතව කර ගෙන යනු ලබන බවත්, තිරිඟු පිටි හිඟයක් ඇති වුවහොත් ඊට විකල්පයක් ලෙස මඤ්ඤොක්කා, බතල වැනි වගාවන් ප්‍රවර්ධනය කරන බවත් ප්‍ර.ග.නි. ප්‍රකාශ කළේය. |
| 7 | ***<u>ජනතාව දැනුවත් කිරීම</u>*** | <u>නිර්දේශ</u><br><br>- කෘෂිකර්ම අමාත්‍යාංශය පිළිබඳව මහජන විශ්වාසය කඩවී ඇති බැවින් |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | **- ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) /ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම්**<br><br>**- කාරක සභාවේ නිරීක්ෂණ, නිර්දේශ / නියෝග** |
|---|---|---|
| | | මෙම අර්බුදකාරී අවස්ථාවේ අමාත්‍යාංශය විසින් ක්‍රියාත්මක කරනු ලබන වැඩ පිළිවෙළ හා එහි ප්‍රගතිය සම්බන්ධයෙන් දෙසතියකට වරක් හෝ මාධ්‍ය මගින් ජනතාව දැනුවත් කිරීමට කටයුතු කිරීම. |
| 8 | ***<u>මහ කන්නය සඳහා බිත්තර වී</u>***<br><br>මහ කන්නය සඳහා අවශ්‍ය බිත්තර වී ප්‍රමාණය සපයා ගැනීම | සමස්ත වගා වපසරිය අනුව එක් කන්නයකට බිත්තර වී බුසල් ලක්ෂ 40ක් පමණ අවශ්‍ය වුවත්, වී වගාවේදී වසර 4කට වරක් බීජ මාරු කිරීම සිදු කිරීම ප්‍රමාණවත් බැවින් මුළු වගා වපසරියෙන් 25% ක් සඳහා පමණක් බිත්තර වී සැපයිය යුතු බව ප්‍ර.ග.නි. ප්‍රකාශ කළේය. ඒ අනුව මහ කන්නය සඳහා බිත්තර වී බුසල් ලක්ෂ 10ක් අවශ්‍ය බවත්, කෘෂිකර්ම දෙපාර්තමේන්තුව සතුව බුසල් 80, 000 ක ප්‍රමාණයක් පවතින බවත්, ඉතිරි ප්‍රමාණය වෙනත් පාර්ශවයන්ගෙන් ලබා ගැනීමට හැකියාව ඇති බවත් ප්‍රකාශ කළේය.<br><br>**<u>නිර්දේශ</u>**<br><br>- ගොවිජන කේන්ද්‍ර අනුව මහ කන්නය සඳහා බිත්තර වී ලබා දෙන ක්‍රමවේදය මසක් ඇතුළත කාරක සභාවට ලිඛිතව ඉදිරිපත් කිරීමට ප්‍ර.ග.නි. වෙත නිර්දේශ කිරීම. |
| 9 | ***<u>බීජ ආනයනය සඳහා අවශ්‍ය ප්‍රතිපාදන සපයා ගැනීම</u>*** | දෙමුහුන් බීජ ආනයනය සඳහා ඩොලර් මිලියන 10ක පමණ මුදලක් අවශ්‍ය වන බවත්, එම මුදල ලබාගැනීම සඳහා සහයෝගය ලබා දෙන ලෙසත් කෘෂිකර්ම අමාත්‍යාංශයේ ප්‍ර.ග.නි. කාරක සභාවෙන් ඉල්ලීමක් කළේය. |

| | | |
|---|---|---|
| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | **- ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) /ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම්**<br><br>**- කාරක සභාවේ නිරීක්ෂණ, නිර්දේශ / නියෝග** |
| | | <u>නිර්දේශ</u><br><br>- මෙය ඉතා අත්‍යාවශ්‍ය කරුණක් බැවින් කාරක සභාවේ නිර්දේශය මත මේ සඳහා අවශ්‍යය ප්‍රතිපාදන ප්‍රමුඛතා පදනම මත ලබාගැනීමට භාණ්ඩාගාර ලේකම් වෙත ඉල්ලීමක් ඉදිරිපත් කරන ලෙස ප්‍ර.ග.නි වෙත නියෝග කළේය. |
| **ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුව**<br><br>**විමර්ශනය කරන ලද දිනය - 2022 ජූනි 08** | | |
| ❖ **කැඳවන ලද ආයතන -**<br>මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය,<br>ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුව | | |
| 01. | <u>*ආනයනය සඳහා බලපත්‍ර ලබා දීම*</u><br><br>නිර්දේශිත කාලය ඉක්මවූ වාහන, කොටස් කර ගෙන්වනු ලබන වාහන සහ මත්පැන් නිෂ්පාදනය සඳහා වන ස්ප්‍රිතු ආදිය සඳහා බලපත්‍ර ලබා දීමේ ප්‍රතිපත්තිය | නිර්දේශිත කාලය ඉක්මවූ වාහන හා කොටස් ආනයනය සඳහා බලපත්‍ර නිකුත් කිරීමට මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව සමග සම්බන්ධීකරණයෙන් නිසි ක්‍රමවේදයක් සැකසීමට එම දෙපාර්තමේන්තුව සමග සාකච්ඡා කරමින් පැවතියද වාහන ආනයනය මේ වන විට සම්පූර්ණයෙන් නවත්වා ඇති බැවින් එම කටයුතුද නැවතී ඇති බවත්, මත්පැන් නිෂ්පාදනය සඳහා වන ස්ප්‍රිතු/ මත්පැන් ආනයනය 2020 වර්ෂයේ සිට නවත්වා ඇති බවත් මෙහිදී අනාවරණය විය. |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | **- ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) /ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම්**<br><br>**- කාරක සභාවේ නිරීක්ෂණ, නිර්දේශ / නියෝග** |
|---|---|---|
| | | එසේම ඖෂධ නිෂ්පාදනය හා වෙනත් කර්මාන්ත වැනි විශේෂ අවශ්‍යතා සඳහා ස්ප්‍රිතු/මත්පැන් ආනයනය කිරීමට සුරාබදු දෙපාර්තමේන්තුවේ නිර්දේශ අනුව බලපත්‍ර නිකුත් කරන බවත් ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුවේ ග.නි ප්‍රකාශ කළාය.<br><br>**<u>නිර්දේශ</u>**<br><br>- 2018-2020 දක්වා කාලය තුළ දෙපාර්තමේන්තුව මගින් මත්පැන්/ ස්ප්‍රිතු ආනයනය කිරීම සඳහා බලපත්‍ර ලබා දීමේ ක්‍රමවේදය, බලපත්‍ර ලබා දී ඇති ක්‍රමවේදය, බලපත්‍ර ලබා දී ඇති කාණ්ඩ, බලපත්‍ර ලබා දී ඇති සමාගම්, මාසයකට ආනයනය කරනු ලබන ප්‍රමාණ පිළිබඳ විස්තරාත්මක වාර්තාවක් මසක් තුළ ප්‍ර.ග.නි/ ග..නි විසින් කාරක සභාවට ඉදිරිපත් කිරිම<br><br>- මත්පැන්/ස්ප්‍රිතු බලපත්‍ර ලබා දීමේ ක්‍රියාවලිය අවභාවිත කිරීම වැළැක්වීම සඳහා නිසි ප්‍රතිපත්තියක් ප්‍ර.ග.නි/ ග.නි විසින් සකස් කිරීම<br><br>- ඖෂධ නිෂ්පාදනය සඳහා ගෙන්වන ස්ප්‍රිතු එම කාර්යය සඳහාම යොදා ගන්නේද යන්න සම්බන්ධයෙන් නිසි පසු විපරමක් / සුපරික්ෂාවක් ප්‍ර.ග.නි/ ග.නි විසින් හඳුන්වා දීම |

| | | |
|---|---|---|
| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | **- ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) /ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම්**<br><br>**- කාරක සභාවේ නිරීක්ෂණ, නිර්දේශ / නියෝග** |
| | | - වාහන හා කොටස් හා ස්ප්‍රිතු ආනයනය සඳහා බලපත්‍ර ලබා දීමේදී නිසි පිළිගත් ප්‍රතිපත්තියක් ප්‍ර.ග.නි/ ග.නි විසින් මාස 4ක් තුළ සකස් කර කාරක සභාවට වාර්තාවක් ඉදිරිපත් කිරීම හා ස්ප්‍රිතු සඳහා ආනයන බලපත්‍ර ලබා දීමේ ක්‍රමවේදය සැකසීමේදී සුරාබදු දෙපාර්තමේන්තුව සමග සම්බන්ධීකරණයෙන් එම කටයුත්ත සිදු කිරීම |
| 02. | ***<u>ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුවේ පරිගණක පද්ධතිය</u>***<br><br>බලපත්‍ර නිකුත් කිරීමේ කාර්යක්ෂමතාව වැඩි දියුණු කිරීම හා ශ්‍රී ලංකා රේගුව, මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව, විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව හා සුරාබදු දෙපාර්තමේන්තුව ඇතුළු මූලික වශයෙන් වැදගත් වන ආයතන 5ක් සමග දෙපාර්තමේන්තුවේ පරිගණක පද්ධතිය සම්බන්ධ කොට තොරතුරු හුවමාරු කර ගැනීම සඳහා දෙපාර්තමේන්තුවේ පරිගණක පද්ධතියේ ක්‍රියාකාරිත්වය වැඩි දියුණු කිරීම | මෙම පරිගණක පද්ධතිය සකස් කිරීම සඳහා ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය (ICTA) සමග ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුව ගිවිසුම්ගත වී වෙනත් බාහිර ආයතනයක් හරහා (outsource) එම පද්ධතිය සකස් කරවා ගෙන ඇති බවත්, එම පද්ධතිය භාවිත කිරීමේදී විශාල වශයෙන් වැරදි සිදු වන බවත්, පරිශීලක හිතකාමී (user friendly) නොවන බැවින් එම පද්ධතිය අත්හැර දැමූ බවත් ග.නි ප්‍රකාශ කළාය. එමෙන්ම, පද්ධතිය තම දෙපාර්තමේන්තුව වෙත භාර දීමෙන් පසු ඇතිවූ ගැටළු/දුෂ්කරතා පිළිබඳව ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය වෙත දන්වා සිටියද |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | - ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) /ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම්<br><br>- කාරක සභාවේ නිරීක්ෂණ, නිර්දේශ / නියෝග |
|---|---|---|
| | | අවශ්‍ය වැඩිදියුණු කිරීම් සිදු වී නොමැති බවද ඇය වැඩිදුරටත් ප්‍රකාශ කළාය.<br><br>එමෙන්ම, මේ වන විට එස්තෝනියානු රජයෙන් තොරතුරු පද්ධතියක් ස්ථාපිත කිරීම සඳහා ප්‍රදානයක් ලැබීමට නියමිත බවත්, ඒ සඳහා විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ නිර්දේශ ඉල්ලා ඇති බවත් ඇය සඳහන් කළාය .<br><br>**<u>නිර්දේශ</u>**<br><br>- භාණ්ඩ ආනයන හා අපනයන ක්‍රියාවලියේදී සිදු වන වංචා, දූෂණ හා අක්‍රමිකතා වැලැක්වීම සඳහා අදාළ ආයතන අතර ඒකාබද්ධ තොරතුරු පද්ධතියක් අනිවාර්යයෙන් ක්‍රියාත්මක කිරීම<br><br>- ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුව, මෙම පද්ධතිය මගින් ඒකාබද්ධ කිරීමට අපේක්ෂිත ආයතන හා ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය 2022 ජුනි මස 16 වැනි දින කාරක සභාව හමුවට කැඳවීමට<br><br>- එදින මෙම පද්ධතියේ උද්ගත වී ඇති ගැටළු/ දුර්වලතා හඳුනා ගෙන එම පද්ධතිය වැඩි දියුණු කිරීමට ගත හැකි |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | **- ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) /ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම්**<br><br>**- කාරක සභාවේ නිරීක්ෂණ, නිර්දේශ / නියෝග** |
|---|---|---|
| | | පියවර සම්බන්ධයෙන් සාකච්ඡා කිරීමට |
| 03. | ***ඖෂධ හා සුවඳ විලවුන් සඳහා බලපත්‍ර නිකුත් කිරීමේ ක්‍රමවේදය*** | ඖෂධ හා සුවඳ විලවුන් ආනයනය කිරීම සඳහා බලපත්‍ර නිකුත් කිරීමට ප්‍රතිපත්තියක් දැනට සකසා ඇති බවත්, සංයෝජිත වර්ගීකරණ කාණ්ඩ අංක 3304, 3303 හා 3302 යටතේ ජාතික ඖෂධ නියාමන අධිකාරිය ඇතුළු අදාළ ආයතනවලින් නිර්දේශ ලබා ගෙන එම බලපත්‍ර නිකුත් කරන බව ග.නි ප්‍රකාශ කළාය. |
| 04. | ***කරුංකා ආනයනය හා අපනයනය කිරීම*** | නිදහස් වෙළඳ ගිවිසුම් පහසුකම අපනයනකරුවන් විසින් අවභාවිත කිරීම නිසා කරුංකා ආනයනය සඳහා බලපත්‍ර නිකුත් කිරීම 2020 වසරේ සිට තහනම් කර ඇති බව ග.නි ප්‍රකාශ කළාය. |
| 05. | ***ත්‍යාග යෝජනා ක්‍රමය යටතේ ආනයනය කරනු ලබන වාහන පසුව විවිධ පාර්ශ්ව වෙත පැවරීම***<br><br>ත්‍යාග යෝජනා ක්‍රමය යටතේ ආනයනය කරනු ලබන වාහන පසුව විවිධ පාර්ශ්ව වෙත පැවරීම යටතේ 2011 හා 2012 වසරවල ආනයනය කරන ලද වාහන 589 ක් විය. ඒ අතුරින් (අ) පළමු ලියාපදිංචියේ සිට වාහනය වෙනත් අයෙකුගේ | බලපත්‍ර නිකුත් කිරීමේදී ත්‍යාග යෝජනා ක්‍රමය යටතේ ආනයනය කරන ලද වාහන වසර 5ක් ඉකුත් වන තුරු අන්සතු කළ නොහැකි බවට හා ඉන් පසුව වුවද අන්සතු කිරීමකදී නියමිත බදු ගෙවීමට යටත් විය යුතු බවට කොන්දේසියක් පනවා ඇති බව ග.නි ප්‍රකාශ කළාය.<br><br>**<u>නිර්දේශ</u>**<br><br>- මෙලෙස ත්‍යාග ක්‍රමය යටතේ ආනයනය කරන වාහන සඳහා බලපත්‍ර නිකුත් කිරීමෙන් පසුව එම |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | **- ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) /ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම්**<br><br>**- කාරක සභාවේ නිරීක්ෂණ, නිර්දේශ / නියෝග** |
|---|---|---|
| | නමින්ම ලියාපදිංචි වී ඇති අවස්ථා 159ක්,<br>(ආ) පළමු ලියාපදිංචියෙන් පසු වසර 5ක් ඉකුත් වීමට පෙර වාහන වෙනත් අයෙකුට විකිණීම හෝ පැවරීමේ අවස්ථා 34ක්,<br>(ඇ) 2012.09.30 දින වන විට ආනයනය කරන ලද වාහනවලින් මෙතෙක් ලියාපදිංචි නොකළ වාහන 115 ක්<br>(ඈ) වාහනයේ ලියාපදිංචි අයිතිය හිමි බලපත්‍රලාභියාගේ නමින්ම වාහන පැවරීමේ කොන්දේසිය ඉවත් කර ඇති වාහන 27ක් පැවතුනි.<br>නිවැරදි ලෙස කොන්දේසි සහිතව බලපත්‍රලාභියාගේ නමින්ම නිවැරදිව ලියාපදිංචි කර ඇති වාහන ගණන 254 ක් විය.<br><br>***<u>ත්‍යාග යෝජනා ක්‍රමය යටතේ වාහන ආනයනය කිරීමේ දී සම්බන්ධ වන ආයතන අතර සම්බන්ධීකරණයක් නොමැති වීම</u>***<br>ත්‍යාග යෝජනා ක්‍රමය යටතේ වාහන ආනයනය කිරීම සඳහා බලපත්‍ර නිකුත් කරනු ලබන ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුව, එම වාහන ආනයනය සිදු කරනු ලබන | ක්‍රියාදාමය පසුවිපරම්/නියාමනය සඳහා වැඩපිළිවෙළක් ප්‍ර.ග.නි/ ග.නි විසින් සකස් කරන ලෙස<br><br>- එම වාහන ආනයනය කිරීමෙන් පසු යම් අක්‍රමිකතාවයක් සිදු වී ඇත්නම් නියමිත බදු ප්‍රමාණය අය කර ගැනීමට හෝ වෙනත් සුදුසු පියවරක් ගැනීමට අදාළ ආයතන සමග සම්බන්ධීකරණයෙන් වැඩපිළිවෙළක් ප්‍ර.ග.නි/ ග.නි විසින් මාසයක් තුළ සකස් කොට කාරක සභාවට වාර්තාවක් ඉදිරිපත් කරන ලෙස |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | - ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) /ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම්<br><br>- කාරක සභාවේ නිරීක්ෂණ, නිර්දේශ / නියෝග |
|---|---|---|
| | රේගු දෙපාර්තමේන්තුව හා එම වාහන ලියාපදිංචි කරනු ලබන මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව අතර මනා සම්බන්ධීකරණයක් තිබිය යුතු වුවත්, එම සම්බන්ධීකරණය නොමැති වීම | |
| 06. | ***ප්‍රමිතියට පටහැනිව වාහන ආනයන සිදු කරන ආනයනකරුවන් ගැසට් පත්‍රය මගින් ප්‍රකාශයට පත් නොකිරීම***<br><br>1978 අංක 28 දරන පනතින් සංශෝධිත 1969 අංක 1 දරන ආනයන හා අපනයන පාලන පනතේ 11ඊ වගන්තිය ප්‍රකාරව ප්‍රමිතියට පටහැනිව ආනයන සිදු කරන ආනයනකරුවන් ගැසට් පත්‍රය මගින් ප්‍රකාශයට පත් නොකිරීම | එම රෙගුලාසි නීති කෙටුම්පත් සම්පාදක විසින් සකස් කර ඇති බවත්, ඉතා ඉක්මනින් ඒවා ගැසට් කළ හැකි වනු ඇති බවත් ග.නි ප්‍රකාශ කළාය.<br><br>**<u>නිර්දේශ</u>**<br><br>- ප්‍රමිතියට පටහැනිව ආනයන සිදු කරන ආනයනකරුවන් ගැසට් මගින් ප්‍රකාශයට පත් කිරීම ප්‍රමාණවත් නොවන බැවින් ඒ වෙනුවට එම ආනයනකරුවන්ගේ ලියාපදිංචිය අවලංගු කිරීමට ප්‍ර.ග.නි/ ග.නි විසින් කටයුතු කිරීම<br><br>- ප්‍රමිතියට පටහැනිව ආනයනය කරන ආනයනකරුවන්ගේ ලියාපදිංචිය අවලංගු කිරීම සඳහා අවශ්‍ය නීතිමය ප්‍රතිපාදන සම්මත කිරීම සඳහා ප්‍ර.ග.නි/ ග.නි විසින් මාස 3ක් තුළ කටයුතු කර කාරක සභාවට වාර්තාවක් ඉදිරිපත් කිරීම |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | - ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) /ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම්<br><br>- කාරක සභාවේ නිරීක්ෂණ, නිර්දේශ / නියෝග |
|---|---|---|
| 07. | ***<u>මෝටර් කාර් රථ 33ක් වැරදි රේගු සංයෝජිත වර්ගීකරණ අංක යටතේ ආනයනය කිරීම හේතුවෙන් රු. මිලියන 114.6ක රේගු බදු අහිමි වීම</u>***<br><br>2015 සැප්තැම්බර් 21 දිනැති අංක 1933/13 දරන ගැසට් පත්‍රයේ ප්‍රතිපාදනවලට අනුව හා සංවර්ධන උපායමාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යාංශයේ අමාත්‍යවරයා හා රාජ්‍ය අමාත්‍යවරයා විසින් ආනයන හා අපනයන පාලකවරයා වෙත දෙන ලද උපදෙස්වලට පරිබාහිරව 2017 වර්ෂයේදී පාවිච්චි කළ මෝටර් කාර් රථ 33ක් වැරදි රේගු සංයෝජිත වර්ගීකරණ අංක යටතේ ආනයනය කිරීම හේතුවෙන් රු. මිලියන 114.6ක රේගු බදු අහිමි වීම .<br><br>ඒ යටතේ ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුව විසින් 30%ක බද්දක් අය කරනු ලබන රේගු සංයෝජිත වර්ගීකරණ අංක යටතේ Mazda RX 8 මාදිලියේ වාහන 33ක් ආනයනය කිරීම සඳහා බලපත්‍ර | ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුව විසින් නියමිත රේගු සංයෝජිත වර්ගීකරණ අංක යටතේ බදු නියම කර තිබුණද, ශ්‍රී ලංකා රේගුවේදී රේගු සංයෝජිත වර්ගීකරණ අංක වෙනස් වී ඇති බවත්, මෙම සිදුවීම පිළිබඳ මේ වන විට අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව මගින් පරීක්ෂණයක් පැවැත්වෙන බවද ග.නි ප්‍රකාශ කළාය.<br><br><u>**නිර්දේශ**</u><br><br>- ශ්‍රී ලංකා රේගුව තමන් ඉදිරියේ දිස් වන වාහනයට බදු අය කිරීම සිදු කරන බව නිරීක්ෂණය කළ කාරක සභාව, ආනයන බලපත්‍රය අනුව නියමිත වාහනයට ගෙන්වා තිබේදැයි ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුව මගින් පරීක්ෂාවට ලක් කිරීම<br><br>- මේ සම්බන්ධයෙන් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ පැමිණිල්ල ඉදිරිපත් කර වසරකට වඩා වැඩි කාලයක් ගත වී ඇති බැවින් රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව මගින් විමසීමක් කළ බව දන්වා අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව මගින් මේ සම්බන්ධයෙන් පැවැත්වෙන විමර්ශනයේ ප්‍රගතිය විමසීම හා එම පරීක්ෂණ කටයුතු අවසන් වූ වහාම |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | - ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) /ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම්<br><br>- කාරක සභාවේ නිරීක්ෂණ, නිර්දේශ / නියෝග |
|---|---|---|
| | නිකුත් කර ඇත. එනමුත් එම වාහනවල එන්ජිමේ වෙනස්කම් මත 15%ක බදු අය කළ යුතු රේගු සංයෝජිත වර්ගීකරණ අංක යටතේ රේගුව විසින් වාහන නිදහස් කර ඇත. එම බලපත්‍ර ලබා ගත් Mazda RX 8 වාහනයක් සඳහා රු. ලක්ෂ 35ක් බදු ගෙවිය යුතු වේ. මෙලෙස එන්ජිමේ වර්ගය ප්‍රකාශයට පත් කළ වාහන නොව වෙනත් එන්ජිමක් සහිත වාහන ආනයනය කිරීම හේතුවෙන් රේගුව මගින් එක් වාහනයක් සඳහා රු. ලක්ෂ 35ක් වෙනුවට රු. ලක්ෂ 1.5ක් පමණක් අය කර තිබීම | ප්‍ර.ග.නි/ ග.නි විසින් කාරක සභාව වෙත වාර්තාවක් ඉදිරිපත් කිරීම |
| 08. | ***ඖෂධ නියැදි බලපත්‍ර ලබා ගැනීමකින් තොරව ආනයනය කර තිබීම හා නියැදි වෙළඳපොලට නිකුත් කිරීමේ හැකියාව***<br><br>2015 අංක 05 දරන ජාතික ඖෂධ නියාමන අධිකාරී පනත අනුව ඖෂධ නියැදියක් පමණක් ආනයනය කිරීමකදී වුවද ආනයන බලපත්‍රයක් ලබා ගත යුතු වුවත්, සමාගම් 3ක් රු. 11,753,264ක් වටිනා ඖෂධ | නියැදියක් පමණක් “ Not for sale, sample only” යන්න අසුරනයේ සටහන් කිරීම නිසා වෙළඳපොලට නිකුත් කිරීමේ හැකියාවක් නොමැති බව ග.නි ප්‍රකාශ කළාය. |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | - ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) /ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම්<br><br>- කාරක සභාවේ නිරීක්ෂණ, නිර්දේශ / නියෝග |
|---|---|---|
| | නියැදි එසේ බලපත්‍ර ලබා ගැනීමකින් තොරව ආනයනය කර තිබීම හා මෙම නියැදි වෙළඳපොලට නිකුත් කිරිමේ හැකියාව | |
| 09. | ***<u>වලංගු කාලය ඉක්මවූ ඖෂධ ආනයනය කිරීම</u>***<br><br>• ඖෂධ ආනයනය සඳහා ලබා දී තිබූ ලියාපදිංචි සහතිකයේ වලංගු කාලයද ඉක්මවූ රු 964,897.ක් වටිනා කල් ඉකුත් වූ ඖෂධ ආනයනය කිරීම<br><br>***<u>ආයු කාලය 75%ට අඩු ඖෂධ ගාස්තුවක් අය කර නිදහස් කිරීම</u>***<br><br>• ඖෂධ ආනයනය කිරීමේදී 75%ක ආයු කාලයක් ඉදිරියට තිබිය යුතු වුවද ආයු කාලය 75%ට අඩු ඖෂධ සඳහා ගාස්තුවක් අය කර නිදහස් කිරීම | 75%ට අඩු ආයු කාලයක් සහිත ඖෂධ ප්‍රදාන ලෙස ලැබෙන බවත්, ඇතැම් අවස්ථාවලදී හදිසි අවශ්‍යතා සඳහා එබඳු ඖෂධ ආනයනය කිරීමට සිදු වන බවත් ග.නි ප්‍රකාශ කළාය.<br><br>ආයු කාලය 75%-65% දක්වා ඇති ඖෂධ ජාතික ඖෂධ නියාමන අධිකාරියේ නිර්දේශය සහිතව නිදහස් කරන බවද, 50%-40% දක්වා ආයු කාලය ඇති ඖෂධ සඳහා දඩයක් නියම කිරීමෙන් පසු නිදහස් කරන බවද, ආයු කාලය 40%ට අඩු නම් එම ඖෂධ සෞඛ්‍ය අමාත්‍යාංශයේ ලේකම්ගේ හා ජාතික ඖෂධ නියාමන අධිකාරියේ නිර්දේශ සහිතව නිදහස් කරනු ලබන බවද ග.නි ප්‍රකාශ කළාය.<br><br>**<u>නිර්දේශ</u>**<br><br>- 2018-2021 දක්වා කාලය තුළ 75% ට අඩුවෙන් ආයු කාලය සහිත ඖෂධ ආනයනය කර ඇති ප්‍රමාණ දත්ත සහිත වාර්තාවක් (ප්‍රමාණාත්මකව හා ප්‍රතිශතාත්මකව) මාසයක් තුළ ප්‍ර.ග.නි/ ග.නි විසින් කාරක සභාවට ඉදිරිපත් කිරීම |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | **- ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) /ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම්**<br><br>**- කාරක සභාවේ නිරීක්ෂණ, නිර්දේශ / නියෝග** |
|---|---|---|
| 10. | ***<u>සන අපද්‍රව්‍ය අඩංගු බහාළුම්, බලපත්‍ර ලබා ගැනීමකින් තොරව ආනයනය කිරීම</u>***<br><br>1969 අංක 01 දරන ආනයන හා අපනයන පාලන පනතේ 04 වැනි වගන්තියේ (3) වැනි උපවගන්තිය සහ 14 වන වගන්තිය සමග කියවිය යුතු එම පනතේ 26 වැනි වගන්තිය යටතේ අමාත්‍යවරයා විසින් කරනු ලබන නියෝගයන් සම්බන්ධව 2017 නොවැම්බර් 09 දිනැති අංක 2044/40 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය මගින් සඳහන් කර ඇති භාණ්ඩ ආනයනය කිරීමේදී ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුවේ බලපත්‍රයක් ලබා ගත යුතු වේ. එනමුත් ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ ලියාපදිංචි වූ සමාගමක් විසින් 2017 හා 2018 වර්ෂවල ආනයනය කර තිබූ මිල, රක්ෂණය හා ගැල්කුලී (මි.ර.ගැ) වටිනාකම රු. 19,760,224ක් වූ ඝන අපද්‍රව්‍ය කිලෝග්‍රෑම් 2,131,325ක් අඩංගු බහාළුම් 102ක් සඳහා එලෙස | ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුවේ අධිකාරය පවතින්නේ බලපත්‍ර ලබා ගන්නා ආනයන භාණ්ඩ සම්බන්ධයෙන් පමණක් බවත්, මෙම කරුණ ආනයන හා අපනයන දෙපාර්තමේන්තුවේ අධිකාරයෙන් පරිබාහිර කර්තව්‍යයක් බවත් ග.නි ප්‍රකාශ කළාය.<br><br><u>**නිර්දේශ**</u><br><br>- ආනයන බලපත්‍ර ලබා ගත යුතු භාණ්ඩ නීති විරෝධී අන්දමින් මෙරටට ආනයනය කිරීම වැළැක්වීමේ නිසි වැඩපිළිවෙලක් සකස් කිරීම |

| | **සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු** | **- ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) /ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම්**<br><br>**- කාරක සභාවේ නිරීක්ෂණ, නිර්දේශ / නියෝග** |
|---|---|---|
| | බලපත්‍ර ලබා ගැනීමකින් තොරව කටයුතු කිරීම<br><br>එසේම, මෙසේ ආනයනය කොට ඇත්තේ ආරෝග්‍යශාලා අබලි ද්‍රව්‍ය (hospital waste) වන ඇඳන් හා මෙට්ට වැනි ද්‍රව්‍ය බවද මෙහිදී අනාවරණය විය. | |
| 11 | ***<u>බලපත්‍ර ලබා ගැනීමකින් තොරව පොහොර තොගයක් ආනයනය කර තිබීම හා අමතර ගාස්තුවක් අය කිරීමකින් තොරව එම පොහොර තොගය නිදහස් කිරීම</u>***<br><br>රජයේ හෝ පෞද්ගලික පොහොර සමාගම් පොහොර ආනයනය සඳහා බලපත්‍ර ලබා ගත යුතු බවද, එසේ බලපත්‍ර ලබා ගැනීමකින් තොරව ආනයනය කර තිබේ නම් ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුව විසින් 5%ක අමතර ගාස්තුවක් අය කර එම ද්‍රව්‍ය සඳහා බලපත්‍ර නිකුත් කළ යුතු වේ.<br><br>එසේ බලපත්‍ර ලබා ගැනීමකින් තොරව 2021 ඔක්තෝබර් මාසයේදී රජය සතු පොහොර | භාණ්ඩ තොගය මෙරටට ළඟා වී රේගු සටහන්කර (cusdec) නිකුත් කිරීමෙන් පසු බලපත්‍ර නිකුත් කිරීමේ හැකියාවක් නොමැති බවත්, මෙම පොහොර සහනාධාර ක්‍රමයක් යටතේ ආනයනය කරන ලද තොගයක් බවත් වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා ප්‍රකාශ කළේය.<br><br>**<u>නිර්දේශ</u>**<br><br>- කෙසේ වුවද, මෙවැනි සිදුවීම් ඉදිරියේදී සිදු නොවිය යුතු බව අවධාරණය කළ කාරක සභාව, මෙම කරුණ රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේදී විගණන විමසුමකට ලක් වූ කරුණක් බව අවධානයට ගෙන, මෙම සිදුවීම ඉදිරියට පූර්වාදර්ශයක් නොවිය යුතු බවත්, මෙවැනි ක්‍රියා ඉදිරියේදී නැවත සිදු නොකරන ලෙසත් ප්‍ර.ග.නි/ ග.නි විසින් පොහොර සමාගමට දන්වා යැවීම |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | - ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) /ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම්<br><br>- කාරක සභාවේ නිරීක්ෂණ, නිර්දේශ / නියෝග |
|---|---|---|
| | සමාගමක් විසින් පොහොර තොගයක් ආනයනය කර තිබීම, ආනයනය කළ පොහොර සඳහා රේගුව විසින් 5%ක අමතර ගාස්තුවක් අය කිරීමකින් තොරව එම පොහොර තොගය නිදහස් කිරීම හා එසේ බලපත්‍රයක් නොමැතිව පොහොර ආනයනය කිරීම නිසා අතිරේක ගාස්තුව වශයෙන් අය කළ යුතුව තිබූ රු. 86,907,433 ක ආදායම රජයට අහිමි වීම | |
| 12 | ***<u>බලපත්‍ර මත අය කරන අතිරේක ගාස්තුව මත බදු පනත ප්‍රකාරව බදු අය නොකිරීම සහ බදු නිදහස් භාණ්ඩ ලෙස හඳුනා ගත් භාණ්ඩ සඳහා VAT අය නොකිරීම</u>***<br><br>• ආනයන හා අපනයන පාලන පනත ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන බලපත්‍ර මත සමාලෝචිත වර්ෂය සඳහා අය කරන අතිරේක ගාස්තුව වන රු. 547,980,916ක් වෙනුවෙන් 2002 අංක 14 | ව්‍යවස්ථාපිත නීතිය යටතේ අය කරනු ලබන අතිරේක ගාස්තු හා බලපත්‍ර ගාස්තු එකතු කළ අගය මත බද්දෙන් නිදහස් බව දේශීය ආදායම් දෙපාර්තමේන්තුව ලිඛිතව දන්වා ඇති බව ග.නි ප්‍රකාශ කළාය.<br><br><u>නිර්දේශ</u><br><br>- ව්‍යවස්ථාපිත නීතිය යටතේ අය කරනු ලබන බලපත්‍ර ගාස්තු හා අතිරේක ගාස්තු එකතු කළ අගය මත බදුවලින් නිදහස් බවට සඳහන් කරමින් දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද ලිපියේ පිටපතක් ප්‍ර.ග.නි/ ග.නි විසින් සති 2ක් තුළ කාරක සභාවට ඉදිරිපත් කිරීම |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | - ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) /ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම්<br><br>- කාරක සභාවේ නිරීක්ෂණ, නිර්දේශ / නියෝග |
|---|---|---|
| | දරන එකතු කළ අගය මත බදු පනත ප්‍රකාරව බදු අය නොකිරීමෙන් රු . 43,838,47ක් රජයට අහිමි වීම<br>• Sri Lanka Customs national imports tariff guide පදනම් කරගෙන ශ්‍රී ලංකා රේගුව මගින් බදු නිදහස් භාණ්ඩ ලෙස හඳුනා ගත් භාණ්ඩ සඳහා වන බලපත්‍ර ආදායම මත එකතු කළ අගය මත බදු (VAT) අය නොකිරීම නිසාද රජයට ලැබිය යුතු ආදායම් අහිමි වීම | |
| **විදේශ සම්පත් දෙපාර්තමේන්තුව**<br><br>**විමර්ශනය කරන ලද දිනය - 2022 ජූනි 09** | | |
| ❖ **කැඳවන ලද ආයතන -**<br>මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය,<br>විදේශ සම්පත් දෙපාර්තමේන්තුව | | |
| 01 | ***විදේශ ව්‍යාපෘති සඳහා වගකීමට බැඳීමේ ගාස්තු***<br><br>• 2020 හා 2021 වර්ෂවල විදේශ ව්‍යාපෘති සඳහා වගකීමට බැඳීමේ ගාස්තු (commitment fee) ලෙස | විදේශ සම්පත් දෙපාර්තමේන්තුව විසින් මෙම ව්‍යාපෘති අනුමත කිරීමේ ක්‍රියාවලිය සිදු නොකරන බවත්, ව්‍යාපෘති සඳහා මූල්‍ය ප්‍රතිපාදන සපයා ගැනීමේ යාන්ත්‍රණය මෙහෙයවීම පමණක් සිදු කරන බවත් සඳහන් කළේය. එසේම අවුරුදු කිහිපයක් පුරා පවතින ව්‍යාපෘති සඳහා ක්‍රමිකව මුදල් |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | - ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) /ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම්<br><br>- කාරක සභාවේ නිරීක්ෂණ, නිර්දේශ / නියෝග |
|---|---|---|
| | පිළිවෙළින් රු. බිලියන 4ක් හා රු. බිලියන 1.8ක් බැගින් ගෙවා ඇති බවත් නිසි ව්‍යාපෘති කළමනාකරණ ක්‍රියාදාමයක් මඟින් මෙම තත්ත්වය මඟහරවා ගත හැකි බවත් කාරක සභාවේ අදහස විය.<br><br>***<u>ව්‍යාපෘති නවතා දැමීම හේතුවෙන්ද රජයට විශාල පාඩුවක් සිදු වීම</u>***<br><br>• ඇතැම් ව්‍යාපෘති කිසිදු තර්කානුකූල පදනමකින් තොරව අතරමඟ නවතා දැමීම හේතුවෙන්ද රජයට විශාල පාඩුවක් සිදු වීම. | ගෙවීම (disburse) සිදු කරන බවද, මෙම මුදල් වියදම් කිරීමට අදාළව මුදල් ප්‍රවාහ සටහනක් (cash flow) සකස් කරන බවද, වියදම් වුණු මුදලට පොළිය (interest) ගෙවිය යුතු බවද, වියදම් නොකළ මුදල (undisbursed money) සඳහා එම වර්ෂයට අදාළ වගකීමට බැඳීමේ ගාස්තු (commitment fee) ගෙවිය යුතු බවද ග.නි. පැහැදිලි කළේය. ඒ අනුව ව්‍යාපෘතිය සඳහා අනුග්‍රහය දක්වන දායක රාජ්‍යයන් විසින් ලබාදෙන දායකත්වය වෙනුවෙන් අදාළ කාල පරාසය පුරාවට වගකීමට බැඳීමේ ගාස්තු ගෙවීමට සිදු වන අතර ව්‍යාපෘතිය නියමිත කාල රාමුවෙන් බැහැරව කඩිනම් කිරීම සිදු කළ නොහැකි බවද මෙහිදී අනාවරණය විය.<br><br>කෙසේ වෙතත්, විවිධ හේතූන් මත සිදු වන ව්‍යාපෘති ප්‍රමාදයන් මඟහරවා ගැනීම සඳහා මුදල් අමාත්‍යාංශය විසින් අංක MOFPE&PD/ERD/2020/1 හා 2020.02.12 දින දරන "Ensuring Project Readiness for Effective Disbursement of Foreign/Local Financing and Strengthening the Project Management" නමින් චක්‍රලේඛයක් නිකුත් කරන ලද බව ග.නි. ප්‍රකාශ කළේය. ඒ අනුව රේඛීය අමාත්‍යාංශය විසින් ව්‍යාපෘතියක් සඳහා අමාත්‍ය මණ්ඩල පත්‍රිකාව ඉදිරිපත් කිරීමට පෙර ව්‍යාපෘතිය ප්‍රමාද විය හැකි කරුණු පුරෝකථනය කර |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | - ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) /ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම්<br><br>- කාරක සභාවේ නිරීක්ෂණ, නිර්දේශ / නියෝග |
|---|---|---|
| | | තිබිය යුතු බවද, එයින් ව්‍යාපෘතිය ප්‍රමාදවීම හේතුවෙන් සිදුවන වගකීමට බැදීමේ ගාස්තු එකතු වීම අවම කර ගත හැකි බවද හෙතෙම ප්‍රකාශ කළේය. |
| 02 | ***<u>ජාතික ඇගැයුම් ප්‍රතිපත්තියක (National Evaluation Policy) ඇති වැදගත්කම</u>*** | විදෙස් ණය නිසි අයුරින් කළමනාකරණය කරගැනීමට මෙවන් ප්‍රතිපත්තියක ඇති වැදගත්කම පැහැදිලි කළ කාරක සභාව ජාතික ඇගයීමේ ප්‍රතිපත්තියක් සැකසීම පිළිබඳව සිය අවධානය යොමු කරන ලෙසට ප්‍ර.ග.නි.ට නියෝග කළේය. |
| 03. | ***<u>අතරමඟ නවතා දැමුණු සැහැල්ලු දුම්රිය සංක්‍රමණ ව්‍යාපෘතිය</u>***<br>රු. බිලියන 5ක මුදලක් වියදම් කර අතරමඟ නවතා දැමුණු සැහැල්ලු දුම්රිය සංක්‍රමණ ව්‍යාපෘතිය හේතුවෙන් අමතර රු. බිලියන 5ක දඩ මුදලක්ද සමඟින් රු. බිලියන 10ක පාඩුවක් ශ්‍රී ලංකා රජයට දැරීමට සිදුව තිබීම. | ඇ.ඩො. බිලියන 1.85ක ණය ආධාර හා ශ්‍රී ලංකා රජය දැරූ වියදම්ද සමඟ මුළු වටිනාකම ඇ.ඩො. බිලියන 2.2ක් වන, වසර 40ක කාලයක් සඳහා ජපන් රජයේ ණය සහනාධාර මත ක්‍රියාත්මක වීමට නියමිතව තිබූ මෙම සැහැල්ලු දුම්රිය ව්‍යාපෘතිය ක්‍රියාත්මක වෙමින් පවතින කාලය තුළ අතිගරු ජනාධිපතිතුමාගේ නියෝගයක් පරිදි නතර කිරීම සඳහා ජනාධිපති ලේකම් කාර්යාලය හරහා රේඛීය අමාත්‍යාංශයට උපදෙස් ලැබී තිබූ බව ප්‍ර.ග.නි./ග.නි. සඳහන් කළේය. ඒ අනුව සිදුවූ දීර්ඝ අමාත්‍ය මණ්ඩලීය සාකච්ඡාවන්ගෙන් අනතුරුව ව්‍යාපෘතිය නතර කිරීමට තීරණය කළ අමාත්‍ය මණ්ඩලය, මෙම ණය ගිවිසුම අවසන් කිරීමේ කටයුතු ඇරඹීම සඳහා තම දෙපාර්තමේන්තුවට උපදෙස් දුන් බව ග.නි. අනාවරණය කළේය. |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | **- ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) /ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම්**<br><br>**- කාරක සභාවේ නිරීක්ෂණ, නිර්දේශ / නියෝග** |
|---|---|---|
| | | සැහැල්ලු දුම්රිය ව්‍යාපෘතිය නවතා දැමීමේ කාරණයට තුඩු දුන් වාතාවරණය පිළිබඳ විස්තරයක් කළ ග.නි., වර්ෂ 2017/2018 වූ එම කාලය වන විට රටේ ණය බර දිගින් දිගටම උග්‍ර වන බව පැහැදිලි වූ හෙයින් විදේශ සම්පත් දෙපාර්තමේන්තුව, මහ බැංකුව හා ලෝක බැංකුව හා එක්ව මධ්‍යම කාලීන ණය කළමනාකරණ උපායමාර්ගික සැලැසුමක් සකස් කළ බව ප්‍රකාශ කළේය. එ ් අනුව, 2020.05.13 දින ‘Foreign Resource Mobilization 2020-2025’ යන නමින් අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවක් නිකුත් කළ බව සඳහන් කළ ප්‍ර.ග.නි./ග.නි. එහිදී වර්තමානයේ උද්ගතව ඇති ආර්ථික අර්බුදය පුරෝකථනය කළ බව සඳහන් කළේය. මෙකී කරුණුද මත පදනම්ව, ඉහත ව්‍යාපෘතිය ඉදිරියට පවත්වාගෙන යාම අපහසු බව අමාත්‍ය මණ්ඩලය තීරණය කරන්නට ඇති බව ග.නි. සඳහන් කළේය.<br><br>කෙසේ වෙතත්, ඉහත ව්‍යාපෘති සඳහා ගිවිසුම්ගත වීමට පෙර මෙවැනි තත්ත්වයන් උද්ගත වන බව පුරෝකථනය කළේ නම් රජයට සිදුවූ විශාල පාඩුව සේම රාජ්‍ය තාන්ත්‍රික සබඳතා පළුදු වීමද වළකාගත හැකිව තිබූ බව කාරක සභාව පෙන්වා දුන්නේය. |
| 04. | ***ණය ගිවිසුම්වලට එළැඹ ක්‍රියාත්මක කරන ව්‍යාපෘති*** | මෙහිදී ග.නි. ප්‍රකාශ කළේ අප රටට වසර 10ක පමණ කාලයක් සඳහා නිශ්චිතව |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | **- ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) /ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම්**<br><br>**- කාරක සභාවේ නිරීක්ෂණ, නිර්දේශ / නියෝග** |
|---|---|---|
| | අප රට ණය ගිවිසුම්වලට එළැඹ ක්‍රියාත්මක කරන්නේ ජාතික භෞතික සැලැස්මට අනුකූල, රටට අත්‍යවශ්‍ය ව්‍යාපෘතිමද යන්න පිළිබඳව විමසා බැලීම. | හඳුනාගත් සංවර්ධන සැලැස්මක් නොමැතිවීම විශාල අඩුපාඩුවක් බවයි. මේ අවස්ථාවේදී ආසියානු සංවර්ධන බැංකුව හා ලෝක බැංකුව වැනි ආයතන හා එක්ව එවන් වසර 10ක නිශ්චිත සංවර්ධන සැලැස්මක් සකසා, එය පාර්ලිමේන්තුවේ සම්මත කර, එය ක්‍රියාවට නැගිය හැකි නම් අද අප මුහුණ දී ඇති අර්බුදයට විසඳුම් සැපයිය හැකි බව ග.නි. වැඩිදුරටත් ප්‍රකාශ කළේය. මෙහිදී අදහස් දැක්වූ ප්‍ර.ග.නි. ප්‍රකාශ කළේ වසර 10ක සංවර්ධන සැලැස්මක් පමණක් නොව රජය වෙනස්වීමේදී දේශපාලන ප්‍රතිපත්ති මත වෙනස් නොවන සාර්ව ආර්ථික ප්‍රතිපත්තියක් අප රටට අවශ්‍ය වන බවයි.<br><br>**<u>නිර්දේශ</u>**<br><br>- වසර 10ක් සඳහා නිශ්චිතව හඳුනාගත් ජාතික සංවර්ධන වැඩසටහනක් පිළියෙළ කිරීමේ කටයුතු දෙපාර්තමේන්තුවේ මූලිකත්වයෙන් ආරම්භ කර, සැලැසුම් සකස් කර හැකි ඉක්මනින් වාර්තා කරන ලෙස කාරක සභාව ප්‍ර.ග.නි./ග.නි.ට නියෝග කළේය. |
| 05 | ***<u>දේශපාලන අධිකාරිය හා රාජ්‍ය සේවය අතර සංවරණ හා තුලන සහිත සමබර සම්බන්ධතාවයක් සහිත ක්‍රමයක් ඇති කිරීමේ වැදගත්කම</u>*** | මෙවැනි කරුණු අන්තර්ගත කරමින් පනත් කිහිපයක් සම්පාදනය කිරීමට සූදානම් වන බවත්, නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සම්පාදන ක්‍රියාවලියේදී මහජන මූල්‍ය පිළිබඳ පරිච්ඡේදයක් ඊට ඇතුළත් |

| | | |
|---|---|---|
| | **සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු** | **- ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) /ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම්**<br><br>**- කාරක සභාවේ නිරීක්ෂණ, නිර්දේශ / නියෝග** |
| | | කිරීමට බලාපොරොත්තු වන බවත් ප්‍ර.ග.නි. ප්‍රකාශ කළේය.<br><br><u>නිර්දේශ</u><br><br>- මේ සම්බන්ධයෙන් සාධනීය පියවර ඇතුළත් රාමුවක් (framework) හැකි ඉක්මනින් කාරක සභාවේ නිර්දේශ සඳහා ඉදිරිපත් කරන ලෙසට කාරක සභාව ප්‍ර.ග.නි.ට නියෝග කළේය. |

**ශ්‍රී ලංකාව වර්තමානයේ මුහුණ දෙමින් සිටින මන්දපෝෂණ තත්වය අඩු කිරීම හා ආහාර අර්බුදය විසඳීම සඳහා ගත හැකි ක්‍රියාමාර්ග පිළිබඳව සොයා බැලීම සඳහා වූ විශේෂ කාරක සභා රැස්වීම.**

**විමර්ශනය කරන ලද දිනය - 2022 ජූනි 10**

❖ **කැඳවන ලද ආයතන -**

කෘෂිකර්ම අමාත්‍යාංශය,
වෙළෙඳ, වාණිජ හා ආහාර සුරක්ෂිතතා අමාත්‍යාංශය,
කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව,
වී අලෙවි මණ්ඩලය, ජාතික පොහොර ලේකම් කාර්යාලය,
හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය,
ආහාර කොමසාරිස් දෙපාර්තමේන්තුව, සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව,
වාණිජ දෙපාර්තමේන්තුව, ලංකා සතොස ලිමිටඩ්,
සමුපකාර තොග වෙළෙඳ සංස්ථාව, පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය,
ශ්‍රී ලංකා රාජ්‍ය වාණිජ (විවිධ) නීතිගත සංස්ථාව,
ජාතික සමුපකාර සංවර්ධන ආයතනය

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | - ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) /ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම් <br><br> - කාරක සභාවේ නිරීක්ෂණ, නිර්දේශ / නියෝග |
|---|---|---|
| 01 | ***<u>ආහාර අර්බුදයට විසඳුම් සෙවීම සඳහා ආයතන අතර සම්බන්ධීකරණය</u>*** <br><br> ආහාර අර්බුදයට විසඳුම් සෙවීම සඳහා පශු සම්පත්, වැවිලි කර්මාන්ත, පොල් කර්මාන්ත හා ධීවර කර්මාන්ත වැනි සියලු අමාත්‍යාංශ හා අනෙකුත් ආයතන අතර සම්බන්ධීකරණයක් අවශ්‍ය බව හා එම ආයතන සම්බන්ධීකරණය සඳහා මේ වන විට ගෙන ඇති ක්‍රියාමාර්ග. | ආහාර ගැටළුව සම්බන්ධයෙන් පශු සම්පත් ක්ෂේත්‍රය හා කෘෂිකර්ම ක්ෂේත්‍රය අතර අඛණ්ඩව සාකච්ඡා පැවැත්වෙන බව හා, වෙළෙඳ, වාණිජ හා ආහාර සුරක්ෂිතතා අමාත්‍යාංශයේ ලේකම්තුමා සමඟ ද මේ පිළිබඳ සාකච්ඡා කර ඇති බව කෘෂිකර්ම අමාත්‍යාංශයේ ප්‍ර.ග.නි. කාරක සභාව හමුවේ ප්‍රකාශ කළේය. <br><br> **<u>නිර්දේශ</u>** <br><br> - ආහාර සුරක්ෂිතතාවය සඳහා අමාත්‍ය මණ්ඩල අනු කමිටුවක් හා නිලධාරීන්ගේ අනු කමිටුවක් පත් කළ යුතු බව <br><br> - මෙම කමිටු පත් කොට අදාළ ආයතන එකතු වී මෙම ආහාර අර්බුදයට පිළියම් සොයන ලෙස කාරක සභාව ප්‍රධාන ගණන් දීමේ නිලධාරීන් වෙත උපදෙස් දුන්නේය. <br><br> ගරු නිමල් සිරිපාල ද සිල්වා අමාත්‍යතුමාගේ ප්‍රධානත්වයෙන් ආහාර සුරක්ෂිතතා කමිටුවක් පත්කර ඇති බවත්, එම කමිටුව අඛණ්ඩව රැස්වන බවත් ඊට ගරු කෘෂිකර්ම අමාත්‍යතුමා, වැවිලි කර්මාන්ත අමාත්‍යතුමා හා අදාළ අනෙකුත් අමාත්‍යාංශවල අමාත්‍යවරුන් ඇතුළු නිලධාරීන්ද සහභාගී වන බවත් කෘෂිකර්ම අමාත්‍යාංශයේ ප්‍ර.ග.නි. ප්‍රකාශ කළේය. තවද, කෘෂිකර්ම අමාත්‍යාංශය විසින් මීළඟ ජනවාරි මාසය දක්වා වූ |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | **- ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) /ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම්**<br><br>**- කාරක සභාවේ නිරීක්ෂණ, නිර්දේශ / නියෝග** |
|---|---|---|
| | | පෝෂණ අවශ්‍යතාවය (කාබෝහයිඩ්‍රේට, ප්‍රෝටීන) සපුරා ගැනීම පිළිබඳව දියත් කර ඇති වැඩසටහන විද්‍යුත් තැපැල මාර්ගයෙන් ඉදිරියේදී ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට බෙදාහැරීමට කටයුතු කරන බවද හෙතෙම ප්‍රකාශ කළේය.<br><br><u>නිර්දේශ</u><br><br>- රට තුළ ආහාර සුරක්ෂිතතාවය තහවුරු කිරීම සඳහා, අදාළ සියලු අමාත්‍යාංශ සමඟ ඒකාබද්ධව මේ වන විට ගෙන ඇති ක්‍රියාමාර්ග හා ඉදිරියේදී ක්‍රියාත්මක කිරීමට නියමිත වැඩපිළිවෙළ කාරක සභාව වෙත යොමු කරන ලෙස කෘෂිකර්ම අමාත්‍යාංශයේ සහ වෙළෙඳ, වාණිජ හා ආහාර සුරක්ෂිතතා අමාත්‍යාංශයේ ප්‍ර.ග.නි. වෙත කාරක සභාව නියෝග කළේය. |
| 02 | <u>*විකල්ප ක්‍රමවේද හරහා ආහාර ද්‍රව්‍ය ආනයනය හා බෙදා හැරීම කාර්යක්ෂමව සිදු කිරීම*</u> | <u>නිර්දේශ</u><br><br>- රජය ගෙන ඇති ප්‍රතිපත්තිමය තීරණයට අනුව මේ වන විට විවෘත ගිණුම් ක්‍රමය (Open Account System) හරහා භාණ්ඩ ආනයනය ගැටළුකාරී වී ඇති හෙයින්, රට තුළ වගා කළ නොහැකි ආහාර ද්‍රව්‍ය ආනයනය කිරීම පිළිබඳව වෙනත් විකල්ප මාර්ග වෙත යොමු විය යුතු බව |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | **- ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) /ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම්**<br><br>**- කාරක සභාවේ නිරීක්ෂණ, නිර්දේශ / නියෝග** |
|---|---|---|
| | | - වෙළෙඳ, වාණිජ හා ආහාර සුරක්ෂිතතා අමාත්‍යාංශය යටතේ පවත්නාවූ සමුපකාර තොග වෙළඳ සංස්ථාව (ස.තො.ස.) , විවිධ සේවා සමුපකාර සමිති වැනි ආයතන හරහා පාරිභෝගිකයා වෙත සාධාරණ මිල ගණන් යටතේ ආහාර ද්‍රව්‍ය බෙදා හැරීමට විධිමත් යාන්ත්‍රණයක් සැකසීමේ අවශ්‍යතාවයද කාරක සභාව මතු කළේය.<br><br>වෙළෙඳ අමාත්‍යාංශය විසින් මෙම ආහාර අර්බුදයට මුහුණ දීම සඳහා, කෘෂිකර්ම අමාත්‍යාංශය හා සම්බන්ධීකරණයෙන් අත්‍යවශ්‍ය අහාර ද්‍රව්‍ය ආරක්ෂිත තොගයක් පවත්වා ගෙන යන බවත් ප්‍රාදේශීය මට්ටමින් මිලදී ගන්නා වූ ආහාර නිෂ්පාදන ගබඩා කර, බෙදා හැරීමට අවශ්‍ය කටයුතු සිදුකරන බවත් වෙළෙඳ, වාණිජ හා ආහාර සුරක්ෂිතතා අමාත්‍යාංශයේ ප්‍ර.ග.නි. ප්‍රකාශ කළේය. තවද, ඉන්දියානු ණය යෝජනා ක්‍රමය මෙන්ම අනෙකුත් රටවල ණය අධාර ක්‍රම ප්‍රවර්ධනය කිරීම සඳහා වාණිජ දෙපාර්තමේන්තුව, විදේශ කටයුතු අමාත්‍යාංශය හා එක්ව කටයුතු කරන බව ඔහු වැඩිදුරටත් ප්‍රකාශ කළේය.<br><br>විදේශගත ශ්‍රී ලාංකික සංගම්වලින් ආධාර ලබා දීමට විමසීම් ලැබෙන බවත්, එලෙස අධාර ලෙස ලැබෙන අත්‍යවශ්‍ය අහාර ද්‍රව්‍ය සෘජුවම ආහාර කොමසාරිස්වරයාගේ නමින් ගෙන්වාගෙන බෙදාහැරීමට අවශ්‍ය |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | **- ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) /ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම්**<br><br>**- කාරක සභාවේ නිරීක්ෂණ, නිර්දේශ / නියෝග** |
|---|---|---|
| | | පියවර ගන්නා බවත් ප්‍ර.ග.නි. ප්‍රකාශ කළේය. ඉන්දියානු ණය ආධාර යටතේ අත්‍යවශ්‍ය අහාර ද්‍රව්‍ය මිලදී ගැනීමට ඇ.ඩො.මි. 180 ක් වෙන්වී ඇති බව හා ඇ.ඩො.මි. 265 ක ඉල්ලීමක් අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍ය මිලදී ගැනීම සඳහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කර ඇති බවත් වෙළෙඳ, වාණිජ හා ආහාර සුරක්ෂිතතා අමාත්‍යාංශයේ ප්‍ර.ග.නි. වැඩිදුරටත් ප්‍රකාශ කළේය.<br><br>තවද, අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍ය කඩිනමින් ආනයනය කිරීමට පවත්නා ක්‍රමවේදයන්ගෙන් බැහැරව කටයුතු කිරීම සඳහා මහ බැංකු අධිපතිතුමා සමඟ සාකච්ඡා කළ බව වෙළෙඳ, වාණිජ හා ආහාර සුරක්ෂිතතා අමාත්‍යාංශයේ ප්‍ර.ග.නි. ප්‍රකාශ කළේය. ඒ අනුව, ආනයනකරුවන්ගෙන් මුදල් ලබා ගැනීමේ ක්‍රමවේදය හා ආනයනය කරනු ලබන ආහාර ද්‍රව්‍ය ප්‍රමාණයන්ට යටත්ව අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍ය ආනයනයට එකඟතාවය ලැබුණු බවද හෙතෙම සඳහන් කළේය. |
| 03 | ***සාර්ක් ආහාර බැංකුව (SAARC Food Bank) හරහා ආහාර (සහල්) ලබා ගැනීමේ හැකියාව*** | මේ වන විට විදේශ කටයුතු අමාත්‍යාංශය, සාර්ක් මහ ලේකම්වරයා සමඟ ඒ පිළිබඳව සාකච්ඡා කර ඇති බවත්, ඒ අනුව ඉදිරියේදී අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගෙන සාර්ක් ආහාර බැංකුව හරහා කඩිනමින් සහල් ලබා ගැනීම සඳහා |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | **- ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) /ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම්**<br><br>**- කාරක සභාවේ නිරීක්ෂණ, නිර්දේශ / නියෝග** |
|---|---|---|
| | | කටයුතු කරන බවත් ආහාර කොමසාරිස් දෙපාර්තමේන්තුවේ ග.නි. කාරක සභාව හමුවේ ප්‍රකාශ කළේය |
| **04** | ***ලෝක ආහාර වැඩසටහන (World Food Programe) හරහා ආහාර පරිත්‍යාග ලබා ගැනීමේ හැකියාව*** | යම් කිසි රටක ආහාර අර්බුදයක් පවතින අවස්ථාවකදී ලෝක ආහාර වැඩසටහන (World Food Programe) හරහා ආහාර පරිත්‍යාග ලබා ගැනීමේ හැකියාව පිළිබඳව ද කාරක සභාව සිය අවධානය යොමු කළේය. විකල්ප ප්‍රෝටීන ප්‍රභවයක් ලෙස බිම්මල් වගාව ව්‍යාප්ත කිරීම සඳහා ලෝක ආහාර වැඩසටහන සමඟ සාකච්ඡා කළ බවත්, ඒ සඳහා මේ වන විට ඔවුන්ගේ සහයෝගය ලබා දීමට එකඟ වී ඇති බවත් කෘෂිකර්ම අමාත්‍යාංශයේ ප්‍ර.ග.නි. ප්‍රකාශ කළේය. |
| **05** | ***ඉන්දියානු තමිල්නාඩු මහ ඇමතිතුමා විසින් මෑතකදී ලබා දුන් අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍ය පරිත්‍යාගය බෙදාහැරීමේ ක්‍රමවේදය*** | එලෙස පරිත්‍යාග ලෙස ලැබීමට නියමිත සහල් මෙ.ටො. 40,000න් මෙතෙක් ලැබුණු සහල් මෙ.ටො. 9000ක් මේ වන විට බෙදා හැර ඇති බවත්, එහිදී 2019 වර්ෂයේ ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ දත්ත අනුව, දිස්ත්‍රික්ක 25න් දිස්ත්‍රික්ක 08ක අඩු ආදායම්ලාභී තෝරා ගත් පවුල් සඳහා මෙම සහල් බෙදාදුන් බවත් ආහාර කොමසාරිස් දෙපාර්තමේන්තුවේ ග.නි. අනාවරණය කළේය. එසේම, ඖෂධ ලෙස ලැබුණු පරිත්‍යාග සෞඛ්‍ය අමාත්‍යාංශයට ලබා දුන් බවද හෙතෙම ප්‍රකාශ කළේය |

| | | |
|---|---|---|
| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | **- ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) /ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම්**<br><br>**- කාරක සභාවේ නිරීක්ෂණ, නිර්දේශ / නියෝග** |
| | | <u>නිර්දේශ</u><br><br>- කිරිපිටි වැනි අහාර බෙදා හැරීමේදී , අදාළ පවුල් නිවැරදිව හඳුනා ගැනීමට සෞඛ්‍ය අමාත්‍යාංශය හෝ අනෙකුත් අදාළ අමාත්‍යාංශවල මාර්ගෝපදේශ ලබාගෙන නිර්ණායක සකසා නිවැරදි ඉලක්කගත පුද්ගලයින්/කණ්ඩායම් (Target Groups) වෙත එම පරිත්‍යාගයන් ලබා දීමට කටයුතු කරන ලෙස වෙළෙඳ, වාණිජ හා ආහාර සුරක්ෂිතතා අමාත්‍යාංශයේ ප්‍ර.ග.නි./ග.නි. වෙත කාරක සභාව නියෝග කළේය.<br>- තවද, විශේෂයෙන්ම ත්‍රිපෝෂ, කිරිපිටි වැනි ආහාර ද්‍රව්‍ය අවු.05ට අඩු ළමුන්, ගර්භනී මව්වරුන් හා කිරිදෙන මව්වරුන් සඳහා සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාල හරහා (MOH) බෙදා දීම සුදුසු බවත්, ඒ සඳහා සියලු සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාල (MOH) මගින් (චක්‍රලේඛ නිකුත් කර) මන්දපෝෂණයෙන් හා සාගින්නෙන් පෙළෙන්නන් ඇතුළු සියලු ඉලක්කගත කණ්ඩායම්වල දත්ත ලබා ගැනීම සඳහා අවශ්‍ය පියවර ගන්නා ලෙසත් වෙළෙඳ, වාණිජ හා ආහාර සුරක්ෂිතතා අමාත්‍යාංශයේ ප්‍ර.ග.නි./ග.නි. වෙත කාරක සභාව නියෝග කළේය. |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | **- ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) /ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම්**<br><br>**- කාරක සභාවේ නිරීක්ෂණ, නිර්දේශ / නියෝග** |
|---|---|---|
| 06 | ***<u>ආහාර අර්බුදය විසඳීම සඳහා විශේෂ කාර්ය සාධක බලකායක් පිහිටුවා ගැනීම</u>*** | <u>නිර්දේශ</u><br><br>- මෙම ආහාර අර්බුදය විසඳීම සඳහා විශේෂ කාර්ය සාධක බලකායක් පිහිටුවා ගැනීමට කටයුතු කරන ලෙසද, ආරක්ෂක අමාත්‍යාංශය, ජනතාව හා අනෙකුත් සියලු අදාළ ආයතන ඒ සඳහා සම්බන්ධ කරගන්නා ලෙසද වෙළෙඳ, වාණිජ හා ආහාර සුරක්ෂිතතා අමාත්‍යාංශයේ හා කෘෂිකර්ම අමාත්‍යාංශයේ ප්‍ර.ග.නි. වෙත කාරක සභාව නියෝග කළේය.<br><br>ගරු ජනාධිපතිතුමා සමඟ පැවති සාකච්ඡාවේදී ද විශේෂ කාර්ය බලකායක් පිහිටුවීමට යෝජනා වූ බව හා ගරු අග්‍රාමාත්‍යතුමාද මේ සම්බන්ධයෙන් දැනුවත් කළ බව ප්‍ර.ග.නි. ප්‍රකාශ කළ අතර, දැනටමත් සියලු අංශ ඒකාබද්ධ කර විශේෂ කාර්ය සාධක බලකායක් පිහිටුවීමේ කටයුතු සිදුවෙමින් පවතින බව කෘෂිකර්ම අමාත්‍යාංශයේ ප්‍ර.ග.නි. ප්‍රකාශ කළේය. |
| 07 | ***<u>භාණ්ඩ බෙදා හැරීමේ ක්‍රියාවලිය කාර්යක්ෂම කිරීම</u>***<br><br>වෙළෙඳ, වාණිජ හා ආහාර සුරක්ෂිතතා අමාත්‍යාංශය, විවිධ සේවා සමුපකාර සමිති සමඟ එක්ව, භාණ්ඩවල මිල හා ප්‍රමාණයන් පිළිබඳ නිර්ණායක ස්ථාපිත කරමින්, භාණ්ඩ බෙදා | ශ්‍රී ලංකා රාජ්‍ය වාණිජ (විවිධ) නීතිගත සංස්ථාව යටතේ ආනයනය කරනු ලබන සහල් ස.තො.ස ආයතනය හරහා බෙදා හරිනු ලබන බවත්, ස.තො.ස. ආයතනය තුළ ස්ථාපිත ඉන්ධන පිරවුම්හල හරහා භාණ්ඩ බෙදා හැරීමේ ලොරිවලට අවශ්‍ය ඉන්ධන ලබා දෙනු ලබන බවත් වෙළෙඳ, වාණිජ හා ආහාර සුරක්ෂිතතා අමාත්‍යාංශයේ ප්‍ර.ග.නි./ග.නි. ප්‍රකාශ |

| | **සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු** | **- ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) /ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම්**<br><br>**- කාරක සභාවේ නිරීක්ෂණ, නිර්දේශ / නියෝග** |
|---|---|---|
| | හැරීමේ ක්‍රියාවලිය කාර්යක්ෂම කිරීම | කළේය. අත්‍යවශ්‍ය සේවාවන් සඳහා ප්‍රවාහනය සැපයීමට ස.තො.ස. ආයතනයේ ස්ථාපිත ඉන්ධන පිරවුම්හල සඳහා අඛණ්ඩව ඉන්ධන සපයා ගැනීමේ ගැටළු පවතින බවද කාරක සභාව හමුවේ අනාවරණය විය.<br><br><u>නිර්දේශ</u><br><br>- ඉදිරියේදී ලෝක වෙළෙඳපළේ බනිජ තෙල් මිල තවත් ඉහළ යා හැකි බව පෙන්වා දුන් කාරක සභාව, තෙල් මිල ඉහළ යාමත් සමග අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍ය වල සැපයුම් ජාලය පවත්වා ගන්නා ආකාරය පිළිබඳ සැලසුමක් ඉදිරිපත් කරන ලෙස වෙළෙඳ, වාණිජ හා ආහාර සුරක්ෂිතතා අමාත්‍යාංශයේ ප්‍ර.ග.නි./ග.නි වෙත උපදෙස් දුන්නේය.<br><br>- ඉන්දීය ණය යෝජනා ක්‍රමය හරහා ලැබෙන භාණ්ඩ සඳහා මිල පාලනය කිරීමේ හැකියාවක් පවතී නම් මිල පාලනය සඳහා කටයුතු කරන ලෙස කාරක සභාව වෙළෙඳ, වාණිජ හා ආහාර සුරක්ෂිතතා අමාත්‍යාංශයේ ප්‍ර.ග.නි. /ග.නි. වෙත නියෝග කළේය.<br><br>- වර්තමානය තුළ උද්ගත වී ඇති ආහාර අර්බුදය විසඳීම සඳහා |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | **- ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) /ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම්**<br><br>**- කාරක සභාවේ නිරීක්ෂණ, නිර්දේශ / නියෝග** |
|---|---|---|
| | | අග්‍රාමාත්‍ය ලේකම්වරයාගේ ප්‍රධානත්වයෙන් හා පශු සම්පත්, වැවිලි, ධීවර, සෞඛ්‍ය, මාධ්‍ය, ප්‍රවාහනය හා අනෙකුත් අදාළ සියලු අමාත්‍යාංශ ඒකාබද්ධව ආහාර සුරක්ෂිතතාව පිළිබඳ අමාත්‍ය මණ්ඩල අනු කමිටුවක් පත් කිරීමට අවශ්‍ය පියවර ගන්නා ලෙස ප්‍ර.ග.නි. වෙත කාරක සභාව නිර්දේශ කළ අතර, එම කමිටුව ඉදිරියේදී කාරක සභාවට කැඳවන බවද අවධාරණය කළේය.<br><br>- ආහාර ද්‍රව්‍ය වල මිල අධීක්ෂණය කිරීම සඳහා පාරිභෝගික කටයුතු අධිකාරිය, ශ්‍රී ලංකා රේගුව සහ අදාළ රාජ්‍ය ආයතනවල සම්බන්ධීකරණයෙන් මිල කමිටුවක් (Pricing Committee) පත් කර ගැනීමටද අවශ්‍ය පියවර ගන්නා ලෙස කාරක සභාව වෙළෙඳ, වාණිජ හා ආහාර සුරක්ෂිතතා අමාත්‍යාංශයේ හා කෘෂිකර්ම අමාත්‍යාංශයේ ප්‍ර.ග.නි. /ග.නි. වෙත නියෝග කළේය. |

| | | |
|---|---|---|
| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | **- ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) /ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම්**<br><br>**- කාරක සභාවේ නිරීක්ෂණ, නිර්දේශ / නියෝග** |
| **ශ්‍රී ලංකාවේ අධ්‍යාපන පද්ධතිය මත ක්‍රියාත්මක කිරීමට නියමිත අනාගත අධ්‍යාපන සැලසුම් සහ අධ්‍යාපන පද්ධතිය මත කොවිඩ් වසංගතයේ බලපෑම සහ පවතින ආර්ථික අර්බුදයේ බලපෑම පිටුදැකීම සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග විමර්ශනය කිරීමේ විශේෂ රැස්වීම.**<br><br>**විමර්ශනය කරන ලද දිනය - 2022 ජූනි 15** | | |
| ❖ **කැඳවන ලද ආයතන -**<br>අධ්‍යාපන අමාත්‍යාංශය,<br>ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව,<br>විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව, ජාතික අධ්‍යාපන ආයතනය | | |
| 01 | ***<u>කොවිඩ් වසංගතයේ සහ පවතින ආර්ථික අර්බුදය අධ්‍යාපන ක්ෂේත්‍රයට බලපා ඇති ආකාරය</u>*** | • විෂය නිර්දේශ නියමිත පරිදි ආවරණය කිරීම, හා පාසැල් සිසුන්ට ආහාර සැපයීම පවතින ආර්ථික අර්බුදය හේතුවෙන් අභියෝගාත්මක වී ඇති බව අධ්‍යාපන අමාත්‍යාංශ ප්‍ර.ග.නි. කාරක සභාව වෙත ප්‍රකාශ කළේය. තවද සිසුන්ගේ පැමිණීම අවම වී ඇති බවද, ගුරුවරුන්ට පැමිණීමේ දුෂ්කරතා ඇති බව ද, මාර්ගගත අධ්‍යාපනයට අවශ්‍ය යටිතල පහසුකම් ප්‍රමාණවත් නොවන බව ද හෙතෙම ප්‍රකාශ කළේය. එසේම. අධ්‍යාපන අමාත්‍යාංශයට වෙන් කර ඇති වැය ශීර්ෂවල මුදල් ප්‍රමාණවත් නොවන බව ප්‍ර.ග.නි. වැඩිදුරටත් ප්‍රකාශ කළේය. |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | **- ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) /ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම්**<br><br>**- කාරක සභාවේ නිරීක්ෂණ, නිර්දේශ / නියෝග** |
|---|---|---|
| | | • රජයේ මුදල් ප්‍රභවයන්ට පරිබාහිරව අමාත්‍යාංශයේ වර්තමාන ප්‍රමුඛතා වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට එක්සත් ජාතීන්ගේ ළමා අරමුදල (UNICEF), ආසියානු සංවර්ධන බැංකුව (ADB) සහ ලෝක බැංකුව (World Bank) යන ආයතන සමග ද්විපාර්ශ්වීය හා බහුපාර්ශ්වීය ව්‍යාපෘති ප්‍රතිව්‍යුහගත කරගැනීමට හා අරමුදල් ප්‍රමාණයන් වැඩි කරගැනීමට සාකච්ඡා පවත්වමින් පවතින බව ද මෙහිදී අනාවරණය විය. භාණ්ඩාගාරය සමග වැය ශීර්ෂ සංශෝධනය කර ගැනීම සඳහා සාකච්ඡා පවත්වන බව ද ප්‍රාග්ධන වියදම් අඩුකර ගනිමින් එම ප්‍රතිපාදන පුනරාවර්තන වියදම් සඳහා ආදේශ කර ගැනීමට කටයුතු කරන බව ද හෙතෙම ප්‍රකාශ කළේය.<br><br>• විශ්ව විද්‍යාලවල මාර්ගගත ක්‍රමයට අධ්‍යාපනය ලබා දුන්නද ප්‍රායෝගික පරීක්ෂණ පැවැත්වීමේ දුෂ්කරතා පවතින බව ද ප්‍ර.ග.නි. ප්‍රකාශ කළේය. විශ්ව විද්‍යාල සිසුන්ට ලබාදෙන “මහපොළ” වැනි මූල්‍යාධාර සඳහා ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවන බව ද, ඇගයීම් ක්‍රියාවලිය අඛණ්ඩව මාර්ගගතව සිදු |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | **- ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) /ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම්**<br><br>**- කාරක සභාවේ නිරීක්ෂණ, නිර්දේශ / නියෝග** |
|---|---|---|
| | | කරගෙන යෑම අභියෝගාත්මක වී ඇති බව ද හෙතෙම ප්‍රකාශ කළේය. |
| 02 | ***<u>විශ්ව විද්‍යාල පද්ධතිය කොවිඩ් වසංගතය සහ පවතින ආර්ථික අර්බුදය හමුවේ ක්‍රියාත්මක වන ආකාරය</u>*** | 2020 මාර්තු මස සිට මාර්ගගත ක්‍රමයට විශ්ව විද්‍යාලවල දේශන පැවැත්වූ බව ද සිසුන් කොටස් වශයෙන් ගෙන්වා ප්‍රායෝගික පරීක්ෂණ පැවැත්වූ බව ද විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ උප සභාපතිවරයා ප්‍රකාශ කළේය. එසේම, ආර්ථික දුෂ්කරතා තිබූ ඇතැම් සිසුන්ට රජය මගින් ලබාදුන් සහන පොළී ණය යෝජනා ක්‍රමය හරහා පරිගණක ලබා ගැනීමේ අවස්ථාව සැලසූ බවද අන්තර්ජාල සේවා සපයන ආයතන මගින් ආචාර්යවරුන්ට හා සිසුන්ට නොමිලේ අන්තර්ජාල පහසුකම් ලබාදීමට කටයුතු කළ බව ද හෙතෙම වැඩිදුරටත් ප්‍රකාශ කළේය. වර්තමානයේදී ඉහත ණය යෝජනා ක්‍රමයේ මුදල් ප්‍රමාණය වැඩිකර ඉහළ ගොස් ඇති පොළී අනුපාතය අඩු කර ගැනීම සඳහා මහජන බැංකුව සමග සාකච්ඡා කරමින් පවතින බව ද ප්‍ර.ග.නි/ග.නි. ප්‍රකාශ කළේය.<br><br>2019 හා 2020 වර්ෂ වලදී විශ්ව විද්‍යාල සඳහා අමතර සිසුන් 10000 බැගින් බඳවා ගත් බව ද ඔවුන්ට අවශ්‍ය යටිතල පහසුකම් සැපයීම සඳහා ලෝක බැංකුව මගින් ලබා දී ඇති ඩොලර් මිලියන 100ක මූල්‍යාධාරවලට අමතරව තවත් ඩොලර් මිලියන 25ක් ලබා ගැනීමට ඉල්ලුම් කර ඇති බව ද ප්‍ර.ග.නි/ග.නි. ප්‍රකාශ කළේය. |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | **- ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) /ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම්**<br><br>**- කාරක සභාවේ නිරීක්ෂණ, නිර්දේශ / නියෝග** |
|---|---|---|
| | | පැවති කොවිඩ් තත්වය හා අමතර ශිෂ්‍ය බඳවා ගැනීම් හේතුවෙන් මෙම මූල්‍යාධාර සඳහා සකස් කර ඇති වැඩපිළිවෙල සමාලෝචනය කරමින් පවතින බව ද පවතින ලෝක බැංකු මූල්‍යාධාරවල දිගුවක් සඳහා හා පවතින අර්බුදය කළමනාකරණය කිරීමට නව ලෝක බැංකු ආධාර ලබා ගැනීම සඳහා සාකච්ඡා පැවැත්වීමට 21/171 දරන අමාත්‍ය මණ්ඩල තීරණය මගින් අවසර ලබාදී ඇති බව ද හෙතෙම ප්‍රකාශ කළේය.<br><br>**<u>නිර්දේශ</u>**<br><br>- මෙම ආධාර මගින් මාර්ගගත ඉගැන්වීම් සඳහා යටිතල පහසුකම් ලබාදීමට ප්‍රමුඛත්වයක් ලබාදිය යුතු බව.<br>- ඉහත ඩොලර් මිලියන 100ක මූල්‍යාධාර උපයෝජනයට අධ්‍යාපන අමාත්‍යාංශය විසින් සැලසුම් කර ඇති වැඩ පිළිවෙල 2022.06.29 දිනට පෙර කාරක සභාවට ලබා දෙන ලෙස කාරක සභාව ප්‍ර.ග.නි. වෙත නියෝග කළේය.<br><br>- මාර්ගගත අධ්‍යාපනය සඳහා පරිගණක හෝ අන්තර්ජාල පහසුකම් නොමැති සිසුන් පිළිබඳව තොරතුරු විශ්ව විද්‍යාල විසින් සිසුන් ඇතුළත් කර ගන්නා අවස්ථාවේදීම ලබාගෙන ඒ සඳහා පිළියමක් යෙදිය යුතු බව . |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | **- ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) /ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම්**<br><br>**- කාරක සභාවේ නිරීක්ෂණ, නිර්දේශ / නියෝග** |
|---|---|---|
| | | මාර්ගගත අධ්‍යාපනයේ ගුණාත්මක බව පිළිබඳව මෙහිදී කාරක සභාවේ අවධානයට යොමු විය. මාර්ගගත ඉගැන්වීම් හා ඇගයීම් ක්‍රියාවලිය සඳහා ප්‍රායෝගික ගැටළු පවතින බව ප්‍ර.ග.නි/ග.නි. ප්‍රකාශ කළේය. එම නිසා හැකි ඉක්මනින් සිසුන්ට පංති කාමර ඉගැන්වීම් ආරම්භ කළ යුතු බව හෙතෙම වැඩිදුරටත් අවධාරණය කළේය. වෛද්‍ය පීඨ හා විද්‍යා පීඨ සඳහා මේ වන විටත් භෞතික දේශන පවත්වන බව මෙහිදී අනාවරණය විය.<br><br>මාර්ගගත අධ්‍යාපනය සඳහා ප්‍රමාණවත් පංති කාමර හා උපකරණ පහසුකම් විශ්ව විද්‍යාලවල පවතීද හා ඒ සඳහා සැලසුමක් පවතීද යන කරුණු පිළිබඳව කාරක සභාවේ අවධානය යොමු විය. විශ්ව විද්‍යාල පද්ධතියේ ඇති පීඨ වලින් 80%කට පමණ මාර්ගගත අධ්‍යාපනයට අවශ්‍ය පහසුකම් පවතින බව ප්‍ර.ග.නි/ග.නි. ප්‍රකාශ කළේය. මාර්ගගත අධ්‍යාපනයට අවශ්‍ය සැලසුම් සකස් කළද ඒ සඳහා අවශ්‍ය ප්‍රසම්පාදනය සඳහා සැපයුම්කරුවන් සොයා ගැනීමේ ගැටළු පවතින බව හෙතෙම සඳහන් කළේය.<br><br><u>නිර්දේශ</u><br><br>- මේ අනුව, ඉහත සඳහන් කළ ලෝක බැංකු ආධාර විශ්ව විද්‍යාලවල මාර්ගගත අධ්‍යාපනය ලබාදීම |

| | **සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු** | **- ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) /ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම්**<br><br>**- කාරක සභාවේ නිරීක්ෂණ, නිර්දේශ / නියෝග** |
|---|---|---|
| | | වෙනුවෙන් යොදාගත යුතු බව හා මේ පිළිබඳ සකස් කළ සැලසුම 2022.06.29 දිනට පෙර කාරක සභාව වෙත ලබාදෙන ලෙස කාරක සභාව ප්‍ර.ග.නි/ග.නි වෙත නියෝග කළේය.<br><br>විශ්ව විද්‍යාල පද්ධතියේ කලා හා මානව ශාස්ත්‍ර සිසුන්ගේ රැකියා නියුක්ත වීමේ හැකියාව වැඩි කිරීමට ගෙන ඇති පියවර කාරක සභාව විමසීය. මෙම පීඨ සිසුන් සඳහා තොරතුරු තාක්ෂණ දැනුම ලබාදීමට අංශයක් ඇති කිරීමට අවසර ලබාදී ඇති බව ද විශ්ව විද්‍යාල 8ක දැනටමත් මෙම අංශ ඇති කර ඇති බව ද ප්‍ර.ග.නි/ග.නි ප්‍රකාශ කළේය. මේ සඳහා පීඨ 15කට යටිතල පහසුකම් සැපයීමට රු. මිලියන 315.7ක් වෙන් කර ඇති බව අනාවරණය විය.<br><br>පවතින අර්බුදය කළමනාකරණය සඳහා ඊට ගැලපෙන ලෙස උසස් අධ්‍යාපන විෂය මාලාවල ප්‍රතිසංස්කරණයක් සිදු කරන්නේද යන කරුණ පිළිබඳ කාරක සභාවේ අවධානයට යොමු විය. වර්තමානයට උචිත ලෙස උපාධි පාඨමාලා වසර 5කට වරක් සමාලෝචනය කරන බව ද නව තාක්ෂණ පීඨ පිහිටුවා ඇති බව ද අථත්‍ය (Virtual) විශ්ව විද්‍යාලයක් සඳහා කටයුතු සැලසුම් කරමින් පවතින බව ද ප්‍ර.ග.නි./ග.නි ප්‍රකාශ කළේය. විශ්ව විද්‍යාල නව ප්‍රවණතාවයන් අතර ක්‍රීඩා විශ්ව විද්‍යාලයක් ඇති කිරීම, හෙද විශ්ව |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | **- ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) /ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම්**<br><br>**- කාරක සභාවේ නිරීක්ෂණ, නිර්දේශ / නියෝග** |
|---|---|---|
| | | විද්‍යාලයක් ඇති කිරීම, විදේශ සිසුන් සඳහා අධ්‍යයන පීඨ ඇති කිරීම, සංචාරක අංශයට අදාළ පාඨමාලා ක්‍රියාත්මක කිරීම ආදිය ක්‍රියාවට නැංවීමට සැලසුම් කර ඇති බව ප්‍ර.ග.නි/ග.නි. ප්‍රකාශ කළේය.<br><br><u>නිර්දේශ</u><br><br>- මෙම නවතාවයන් ක්‍රියාවට නැංවීමට අවශ්‍ය පාසැල් විෂය නිර්දේශයන් ද සමාලෝචනය කළ යුතු බව කාරක සභාව අවධාරණය කළේය. |
| 03 | <u>*පාසැල් පද්ධතිය කොවිඩ් වසංගතය සහ පවතින ආර්ථික අර්බුදය හමුවේ ක්‍රියාත්මක වන ආකාරය*</u> | ජාතික අධ්‍යාපන ආයතනය විසින් කොවිඩ් වසංගතය කාලයේදී පාසැල් අධ්‍යාපනය ලබාදීම සඳහා රූපවාහිනී "අයි" නාලිකාව හරහා සිංහල හා දෙමළ භාෂාවෙන් දුරස්ථ අධ්‍යාපන වැඩසටහන් 9468 ක් විකාශය කර තිබුණු අතර අරමුදල් හිඟකම හේතුවෙන් වර්තමානයේදී එම පහසුකම අත්හිටුවා ඇති බව ප්‍ර.ග.නි/ග.නි. ප්‍රකාශ කළේය. කෙසේවුවද, පාසැල් දරුවන්ට භෞතික අධ්‍යාපනය ලබාදීමේ වැදගත්කම අවධාරණය කළ කාරක සභාව ඒ සම්බන්ධයෙන් ගෙන ඇති වැඩපිළිවෙළ පිළිබඳ විමසීය.<br><br><u>නිර්දේශ</u><br><br>- සිසුන්ට ගුණාත්මක අධ්‍යාපනයක් ලබා දීම සඳහා රූපවාහිනිය සහ |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | **- ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) /ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම්**<br><br>**- කාරක සභාවේ නිරීක්ෂණ, නිර්දේශ / නියෝග** |
|---|---|---|
| | | මාර්ගගත ක්‍රමයන් හරහා විකාශය වන සියලුම අධ්‍යාපනික වැඩසටහන් රජය විසින් නිසි ලෙස නියාමනය කරන ලෙස කාරක සභාව ප්‍ර.ග.නි/ග.නි වෙත උපදෙස් දෙන ලදී.<br><br>ඉදිරි අර්බුද හමුවේ තිරසාර සංවර්ධනය හා තිරසාර සාමය අරමුණු කරගත් අධ්‍යාපන ප්‍රතිසංස්කරණ හා නිවෙස් පාදක අධ්‍යාපන ක්‍රමයකට යොමු වීමට සිදුවනු ඇති බව ප්‍ර.ග.නි/ග.නි ප්‍රකාශ කළේය. පසුගිය වර්ෂවල පාසැල් විෂය නිර්දේශය භෞතික හා මාර්ගගත ක්‍රම වලට ආවරණය කළ බව ද, 2022 වර්ෂයේ විෂය නිර්දේශය දිනකට පැය 1ක් බැගින් වැඩිකර මෙම වර්ෂය තුළම අවසන් කිරීමට සැලසුම් කර ඇති බව ද හෙතෙම ප්‍රකාශ කළේය. තවද, ඉල්ලීම් කරන ගුරුවරුන් හා සිසුන් ආසන්නතම පාසැල් සඳහා තාවකාලිකව අනුයුක්ත කිරීමට අදාළ චක්‍රලේඛයක් නිකුත් කර ඇති බව ද ප්‍ර.ග.නි/ග.නි ප්‍රකාශ කළේය.<br><br>**<u>නිර්දේශ</u>**<br><br>- මෙම අර්බුද හමුවේ පාසැල් සිසුන්ට සිදුවූ අධ්‍යාපන අහිමිවීම් පිළිබඳ ඇගයීම් ක්‍රියාවලියේ දී සලකා බැලිය යුතු බව හා ඒ අනුව විෂය මාලා සමාලෝචනය කළ යුතු බව කාරක සභාව අවධාරණය කළේය. |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | - ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) /ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම්<br><br>- කාරක සභාවේ නිරීක්ෂණ, නිර්දේශ / නියෝග |
|---|---|---|
| | | - එසේම, අධ්‍යාපන අමාත්‍යාංශය, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව හා ජාතික අධ්‍යාපන ආයතනය සම්බන්ධීකරණයෙන් පාසැල් සිසුන්ට සිදුවූ අධ්‍යාපන අහිමිවීම් වෙනුවෙන් වැඩපිළිවෙළක් සකස් කර අදාළ සියලුම පළාත් හා කලාප අධ්‍යක්ෂවරුන් හා ගුරු උපදේශකවරුන් දැනුවත් කළ යුතු බව ද, ඒ සම්බන්ධයෙන් 2022.07.15 දිනට පෙර කාරක සභාවට වාර්තාවක් ලබාදෙන ලෙස ද, ප්‍ර.ග.නි/ග.නි වෙත කාරක සභාව නියෝග කළේය.<br><br>තවද, අධ්‍යාපන අමාත්‍යාංශයට අවශ්‍ය මුදල් ලැබීම්වල ප්‍රමාදයක් පවතින බව ද ඉදිරි විභාග පැවැත්වීමට රු. මිලියන 12.5ක් අවශ්‍ය බව ද පසුගිය විභාග රාජකාරි සඳහා ද තවමත් මුදල් ගෙවා නොමැති බව ද ප්‍ර.ග.නි/ග.නි මෙහිදී ප්‍රකාශ කළේය.<br><br>පැවති කොවිඩ් තත්වය මත උසස්පෙළ තාක්ෂණ විෂයයන් සඳහා 2020/2021 අයදුම් කර ඇති 8000ක් පමණ වන සිසුන් වෙනුවෙන් කර්මාන්ත ආශ්‍රිත පුහුණුවීම් ලබාදීමේදී මූල්‍ය ගැටළු බලපා ඇති බව ද එසේම, ලක්ෂ 11ක් පමණ වන පාසැල් සිසුන්ගේ පාසැල් පෝෂණ වැඩසටහන සඳහා ද අරමුදල් ලැබීමේ ගැටළු පවතින බව ද ප්‍ර.ග.නි/ග.නි ප්‍රකාශ කළේය. එබැවින්, ලෝක බැංකුව සමග මෙම |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | **- ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) /ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම්**<br><br>**- කාරක සභාවේ නිරීක්ෂණ, නිර්දේශ / නියෝග** |
|---|---|---|
| | | වර්ෂයේ ඉතිරි කාලය සඳහා පෝෂණ වැඩසටහන සඳහා හා ගුරු පුහුණු වැඩසටහන් සඳහා ද අරමුදල් ප්‍රතිව්‍යුහගත කර ගැනීමට සාකච්ඡා කරමින් පවතින බව ද හෙතෙම වැඩිදුරටත් ප්‍රකාශ කළේය.<br><br>**<u>නිර්දේශ</u>**<br><br>- පවතින ඉන්ධන අර්බුදය සහ ආර්ථික ගැටළු හේතුවෙන් පාසල් නොයන පාසල් දරුවන් සහ මාර්ගගත අධ්‍යාපනයට ප්‍රවේශය නොමැති සිසුන් සම්බන්ධයෙන් ගන්නා විධිමත් ක්‍රියාමාර්ග ඇතුළත් වාර්තාවක් කාරක සභාව වෙත ඉදිරිපත් කරන ලෙස කාරක සභාව ප්‍ර.ග.නි/ග.නි වෙත නියෝග කළේය.<br><br>පාසලේ සාමාන්‍ය අධ්‍යාපනය සහ ක්‍රියාකාරකම්වලින් පරිබාහිරව මාර්ගගත අධ්‍යාපනය කෙරෙහි දිගුකාලීන අවධානය යොමු කිරීම දරුවන්ගේ මානසික සෞඛ්‍ය / හැසිරීම් කෙරෙහි ප්‍රබල බලපෑමක් ඇති කර ඇති බව කමිටුව නිරීක්ෂණය කළේය.<br><br>**<u>නිර්දේශ</u>**<br><br>- සිසුන්ගේ මානසික සෞඛ්‍යය සම්බන්ධයෙන් මාර්ගගත අධ්‍යාපනයේ බලපෑම සහ එය යථා තත්ත්වයට පත් කිරීම සම්බන්ධයෙන් ගෙන ඇති ක්‍රියාමාර්ග / සැලසුම් ඇතුළත් වාර්තාවක් 2022.06.29 |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | - ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) /ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම්<br><br>- කාරක සභාවේ නිරීක්ෂණ, නිර්දේශ / නියෝග |
|---|---|---|
| | | දිනට පෙර කාරක සභාව වෙත ඉදිරිපත් කරන ලෙස කාරක සභාව ප්‍ර.ග.නි/ග.නි වෙත නියෝග කළේය.<br><br>- කාලීන අවශ්‍යතාවයන්ට අනුව විෂයමාලා ප්‍රතිසංස්කරණයක් කඩිනමින් සිදු කළ යුතු බව කාරක සභාව අවධාරණය කළේය.<br><br>- පූර්ව කාරක සභා මගින් නියෝග කරන ලද අධ්‍යාපන අමාත්‍යාංශයේ පූර්ණ දත්ත පද්ධතියක් සැකසීමේ ක්‍රියාවලිය සම්පූර්ණ කිරීමේ ප්‍රමාදය පිළිබඳ හා ජාතික පාසැල් සඳහා විදුහල්පතිවරුන් පත් කිරීමේ ප්‍රමාදය පිළිබඳ කඩිනම් පියවර ගන්නා ලෙස කාරක සභාව ප්‍ර.ග.නි/ග.නි වෙත නියෝග කළේය. |

**වර්තමාන ආර්ථික අර්බුදය හමුවේ රාජ්‍ය ආදායම වැඩි කර ගැනීම සඳහා ගත යුතු පියවර සම්බන්ධයෙන් සාකච්ඡා කිරීම සඳහා වන විශේෂ කාරක සභා රැස්වීම**

**විමර්ශනය කරන ලද දිනය - 2022 ජූනි 15**

- **කැඳවන ලද ආයතන -**

  මුදල්, ආර්ථික ස්ථායිකරණ හා ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය
  ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යාංශය
  දේශීය ආදායම් දෙපාර්තමේන්තුව
  ශ්‍රී ලංකා රේගුව
  සුරාබදු දෙපාර්තමේන්තුව

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | - ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) /ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම්<br><br>- කාරක සභාවේ නිරීක්ෂණ, නිර්දේශ / නියෝග |
|---|---|---|
| මෝටර්රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව | | |
| 01 | ***<u>ආදායම් පරිපාලනය සම්බන්ධයෙන් ගෙන ඇති දිගු කාලීන හා කෙටිකාලීන පියවර</u>***<br><br>දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් ඉදිරිපත් කරන ලද යෝජනා<br>- ආදායම් පරිපාලනය සම්බන්ධයෙන් මේ වන විටත් ගෙන ඇති දිගු කාලීන හා කෙටිකාලීන පියවර | • ලියාපදිංචි වීම, බදු වාර්තා ගොනු කිරීම හා ගෙවීම සඳහා ඊ සේවා<br>• වත්මන් බදු කරුණු හා අනුගතවීමේ අවශ්‍යතා වෙබ් අඩවිය මගින් යාවත්කාලීන කිරීම<br>• බැංකු 15 ක් සමග මාර්ගගත බදු ගෙවීම් වේදිකාව (Online Tax Payment Platform (OTTP))<br>• බදු වාර්තා හා බදු ගෙවීම සමීපව අධීක්ෂණය හා විස්තීර්ණ බදු විගණනය සිදු කිරීම සඳහා විශාල බදු ගෙවන්නන් ප්‍රතිව්‍යුහගත කිරීම, එක් එක් නිලධාරියෙකුට සීමිත ගොනු සංඛ්‍යාවක් වෙන් කිරීම (ගොනු 8 සිට 10 දක්වා ප්‍රමාණයක්)<br>• අර්බුදය හමුවේ අතථ්‍ය ක්‍රමවේද (virtual) භාවිතා කිරීම<br>• බදු සංශෝධන, බදු වාර්තා සම්පූර්ණ කිරිම සම්බන්ධයෙන් පැවැත්වූ දැනුවත් කිරීමේ වැඩසටහන් සඳහා සූම් තාක්ෂණය (zoom) යොදා ගැනීම<br>• දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ වෙබ් අඩවියේ දැනුවත් කිරීමේ වීඩියෝ ක්ලිප් හා යූ ටියුබ් මගින් වැඩිදුර දැනුවත්වීම් සඳහා පහසුකම් සැලසීම<br>• නිලධාරින්ට නිවසේ සිට සේවය කිරීම සඳහා පහසුකම් සැලසීම |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | **- ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) /ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම්**<br><br>**- කාරක සභාවේ නිරීක්ෂණ, නිර්දේශ / නියෝග** |
|---|---|---|
| | | • බදු ගෙවන්නන් ලියාපදිංචිය, බදු වර්ග ලියාපදිංචිය, ගෙවීම් යාවත්කාලීන කිරීම්, තොරතුරු යාවත්කාලීන කිරීම්, නිෂ්කාශන ලබා ගැනීම<br>• බදු ගෙවන්නන්ගේ ගැටළු විසඳීම සඳහා දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ ක්ෂණික ඇමතුම් අංකය 1944 ක් හඳුන්වා දීම |
| 02 | ***ආදායම් පරිපාලනය සම්බන්ධයෙන් ඉදිරියට ගනු ලබන පියවර*** | - නව ප්‍රතිපත්ති වෙනස්කම් සමග සමපාත වන වැඩි කරන ලද බදු පදනම<br>- අදාළ බදු පනත් සඳහා සංශෝධන කඩිනමින් පාර්ලිමේන්තුවේ සම්මත කළ යුතු අතර බදු ක්‍රමයට සිදු කරනු ලබන වෙනස්කම් බදු සංශෝධනවලට අනුකූලව සිදු කළ යුතුය. මෙහි අවසන් අරමුණ වන්නේ අහිමි වූ ආදායම එකතු කර ගැනීමයි<br>- බදු ගෙවන්නන් හා දේශීය ආදායම් නිලධාරින් සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම<br>- කොටස් පදනම මත බදු ආදායම එකතු කිරීම අධීක්ෂණය කිරීම, විශාල බදු ගෙවන්නන්ගේ අංශ, ඉහළ ඒකක හා මධ්‍යම ආයතනික ඒකක දැනටමත් පිහිටුවා ඇති අතර ඒවා තව දුරටත් ප්‍රතිව්‍යුහගත කරමින් පවතී<br>- හිඟ බදු එකතු කිරීමේ ක්‍රියාවලිය තව දුරටත් වේගවත් කරමින් පවතී |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | **- ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) /ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම්**<br><br>**- කාරක සභාවේ නිරීක්ෂණ, නිර්දේශ / නියෝග** |
|---|---|---|
| | | - බදු වාර්තා අනුකූලතාවය හා ස්වයං තක්සේරු ගෙවීම් පිළිද අධීක්ෂණය අවධාරණය කිරීම<br>- මෑතකදී නිකුත් කරන ලද බදු තක්සේරු (2018/2019 තක්සේරු වර්ෂය සඳහා) අය කර ගැනීමට ප්‍රමුඛතාව ලබා දීම<br>- බදු පදනම පුළුල් කිරීම<br>- විගණන කාර්යය වේගවත් කිරීම හා අවදානම් පදනම මත විගණන සංඛ්‍යාව වැඩි කිරීම<br>- බදු අභිම්වීම් වාර්තාකරණ ක්‍රියාමාර්ග සඳහා වැඩි අවධානයක් යොමු කිරීම<br>- මෑතකදී ලබා දෙන ලද බදු සමාවන් යටතේ ප්‍රකාශයන් කළමනාකරණය කිරීම<br>- බදු ආදායම වැඩි කිරීම සඳහා වෙනත් පරිපාලන ක්‍රියාමාර්ග ගැනීම |
| 03 | ***<u>කාරක සභාවෙන් නිකුත් කළ නිර්දේශ සම්බන්ධ ප්‍රගතිය</u>***<br><br>ප්‍රධාන සමාගම් කිහිපයක් විසින් හිඟ බදු ආපසු නොගෙවීම, බදු අභියාචන අදියර තුන එක් අදියරක් දක්වා අඩු කිරීම, මාස 6ක් ඇතුළත බදු අභියාචනා විභාග කර අවසන් කිරීම හා බදු ගෙවන්නා විසින් බදු තක්සේරුවෙන් 50%ක අනිවාර්ය ගෙවීමක් කළ යුතු | පැරණි පනත යටතේ (2006 අංක 10 දරන පනත) දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් වසර 2ක් තුළ බදු අභියාචනා විභාග කර අවසන් කිරීමට නීත්‍යානුකූලව බැඳී සිටි.එම නිසා කාරක සභාව විසින් දක්වා ඇති පරිදි වසර පහක කාලයක් ඒ සඳහා අවසර නොලැබෙන බවත්, කාරක සභාව විසින් යෝජනා කරන පරිදි බදු තක්සේරුවෙන් 50% ක මුදලක් නොගෙව්වද, බදු ගෙවන්නා විසින් යම් ප්‍රමාණයක් බදු ලෙස ගෙවිය යුතු බවත් |

| | | |
|---|---|---|
| | **සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු** | **- ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) /ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම්**<br><br>**- කාරක සභාවේ නිරීක්ෂණ, නිර්දේශ / නියෝග** |
| | බවට කාරක සභාවෙන් නිකුත් කළ නිර්දේශ සම්බන්ධ ප්‍රගතිය | දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ ග .නි විසින් ප්‍රකාශ කළේය.<br><br>රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් නිකුත් කරන ලද නිර්දේශ ඇතුළත් අමාත්‍ය මණ්ඩල සංදේශය අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කර ඇති බවත්, නීති කෙටුම්පත් සම්පාදක විසින් ඉදිරි පියවර ගනු ලබන බවත් ප්‍ර.ග.නි විසින් ප්‍රකාශ කරන ලදී. බදු අභියාචනා කොමිෂන් සභාවට සිදු කරනු ලබන සංශෝධන ඇතුළත් පනත් කෙටුම්පත, කෙටුම්පත් කරමින් පවතී.<br><br>__නිර්දේශ__<br><br>- බදු අභියාචනා කොමිෂන් සභාව විසින් බදු අභියාචනයක් විභාග කර අවසන් කිරීමට විශාල කාලයක් ගත කිරීම හා දිගු කාලයක් තිස්සේ ප්‍රධාන සමාගම් විසින් බදු ගෙවීම පැහැර හැරීම වලක්වා ගැනීමට කටයුතු කිරීම |
| 04 | ***__ඔට්ටු හා සූදු බද්ද අය කිරීම__*** | සමාගම් දෙකක් විසින් නියමිත බදු ප්‍රමාණයන් ගෙවා ඇති බවත්, බදු ගෙවීමට නොහැකි මන්දැයි හේතු දක්වන ලෙස ශ්‍රේෂ්ඨාධිකරණය විසින් අනෙක් බදු ගෙවන්නාට නියෝග කර ඇති බවත්, එම නඩුව තවමත් අවසන් වී නොමැති බවත් ග.නි ප්‍රකාශ කළේය. |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | **- ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) /ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම්**<br><br>**- කාරක සභාවේ නිරීක්ෂණ, නිර්දේශ / නියෝග** |
|---|---|---|
| | | <u>නිර්දේශ</u><br><br>- හිඟ බදුවල ඉතිරි ප්‍රමාණය අය කර ගැනීම සඳහා විකල්ප යාන්ත්‍රණයක් සකස් කිරීම |
| 05 | ***<u>ආදායම් පරිපාලන කළමනාකරණ තොරතුරු පද්ධතිය (RAMIS)</u>*** | ශ්‍රී ලංකා රේගුව, සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව, සුරාබදු දෙපාර්තමේන්තුව, මහජන බැංකුව, ලංකා බැංකුව හා ලංකා ක්ලියර් (පෞද්ගලික) සමාගම පද්ධතිය හා අතුරු මුහුණත් කිරීමට පියවර ගෙන ඇති බව දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ ග.නි ප්‍රකාශ කළේය.<br><br>අන්තර්- ක්‍රියාකාරිත්ව රාමුවක් හා බදු ගෙවන්නන් හඳුනා ගැනීම සඳහා ඒකීය අංකයක් නොමැති වීම, සමහර ආයතනවල දත්ත පද්ධතියක් නොමැති වීම දත්ත පද්ධතීන් අතර නොගැලපීම් වැනි කරුණු හේතුවෙන් අනෙක් ආතනන පද්ධතිය සමග අතුරු මුහුණත් කිරීම (interface) ප්‍රමාද වී ඇති බවත්, දත්ත පද්ධතීන් පවත්වා ගෙන යාම සඳහා සමාන තාක්ෂණයක් තිබිය යුතු බවත් ඔහු වැඩිදුරටත් ප්‍රකාශ කළේය.<br><br><u>නිර්දේශ</u><br><br>- වාර්ෂිකව රුපියල් බිලියන 2000ක් උපයන හා රජයේ සමස්ත ආදායමින් 90%ට වඩා දායක වන සුරාබදු දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා රේගුව |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | - ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) /ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම්<br><br>- කාරක සභාවේ නිරීක්ෂණ, නිර්දේශ / නියෝග |
|---|---|---|
| | | සමග දේශීය ආදායම් දෙපාර්තමේන්තුව අතුරු මුහුණත් කිරීමේ ක්‍රියාවලිය සම්පූර්ණ කිරීම<br><br>- තොරතුරු හා සන්නිවේදන නියෝජිතායතනයේ නිලධාරීන් සහභාගී වන පසුදින (16.06.2022) පැවැත්වීමට නියමිත කාරක සභා රැස්වීමේදී මෙම ගැටළුව තවදුරටත් සාකච්ඡා කිරීම |
| 06 | ***බදු සංශෝධන මගින් අපේක්ෂිත ආදායම*** | යෝජිත එකතු කළ අගය මත බදු අනුපාතයන් මේ වන විට සකස් කර ඇති බවත්, 2022 ජූලි 01 වන දින වන විට එය ක්‍රියාත්මක වනු ඇති බවත්, විදුලි සංදේශ බද්ද මේ වන විට අය කර ගෙන යන බවත් දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ ග.නි ප්‍රකාශ කළේය.<br><br>2022 ඔක්තෝබර් 01 වැනිදා සිට අනෙකුත් බදු ක්‍රියාත්මක වන බවත්, මෙම බදු සංශෝධන මගින් රු. බිලියන 135ක ආදායම් වැඩි වීමක් අපේක්ෂා කරන බවත් ඔහු ප්‍රකාශ කළේය. |
| 07 | ***සමාජ ආරක්ෂණ දායක බද්ද*** | **නිර්දේශ**<br><br>- මෙම බද්දේ අවසන් බදු බර පාරිභෝගිකයා මත පැටවෙන බැවින් හා අපේක්ෂිත ආදායම රජයට එකතු කර ගැනීමට නොහැකි වන බැවින් අත්‍යවශ්‍ය භාණ්ඩ මෙම බද්දෙන් |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | **- ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) /ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම්**<br><br>**- කාරක සභාවේ නිරීක්ෂණ, නිර්දේශ / නියෝග** |
|---|---|---|
| | | නිදහස් කිරීමේ හැකියාව ප්‍ර.ග.නි විසින් සොයා බැලීම |
| 08 | ***<u>එකතු කළ අගය මත බද්දේ බලපෑම</u>*** | සමාජ ආරක්ෂණ බද්ද මෙන් නොව එකතු කළ අගය මත බද්දේ බදු බර කිහිප වරක් පාරිභෝගිකයා වෙත පැටවීමේ බලපෑමක් නොමැති බව දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ ග.නි ප්‍රකාශ කළේය. |
| 09 | ***<u>හිඟ බදු එකතු කර ගැනීම සඳහා පියවර</u>***<br><br>රු. බිලියන 169ක් වන RAMIS හා LEGACY පද්ධති යටතේ වන හිඟ බදු එකතු කර ගැනීම සඳහා ගනු ලැබූ පියවර | 2022 මාර්තු මස වන විට බිලියන 15ක් අය කර ගැනීමට පියවර ගෙන ඇති බව ග.නි ප්‍රකාශ කළේය. |
| 10 | ***<u>රජය මගින් විශාල බදු සහන ලබා දීම</u>***<br><br>• රජයට අහිමි වන ආදායම හා විශාල බදු සහන ප්‍රදානය කිරීම හේතුවෙන් ආර්ථිකයට ඇති වන අහිතකර බලපෑම පිළිබඳව රජයට දන්වා සිටීමට පියවරක් ගෙන නොතිබීම | මෙම තීරණය හේතුවෙන් රටට ඇති විය හැකි අහිතකර ප්‍රතිඵල පිළිබඳව මුදල් අමාත්‍යාංශයට දන්වා තිබූ බව ග.නි ප්‍රකාශ කළේය. |
| 11 | ***<u>ශ්‍රී ලංකා රේගුව විසින් ඉදිරිපත් කරන ලද යෝජනා</u>*** | ආදායම් උත්පාදනය සඳහා බලපාන කරුණු<br><br>• බදු ප්‍රතිපත්තිය වෙනස්වීම්<br><br>• බදු නිදහස් කිරීම් හා බදු සහන<br><br>• සීමාවන්/ නියාමන පියවර යෙදීම |

| | | |
|---|---|---|
| | **සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු** | **- ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) /ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම්**<br><br>**- කාරක සභාවේ නිරීක්ෂණ, නිර්දේශ / නියෝග** |
| | | • ද්වි පාර්ශ්වික හා බහු පාර්ශ්වික ගිවිසුම්<br><br>• සෘතුමය බලපෑම් (උත්සව, ප්‍රවණතා යනාදිය)<br><br>• ගෝලීය ආර්ථික හා දේශපාලනික තත්ත්වයන්<br><br>• හදිසි ආපදා<br><br>• ආදායම් කාන්දුවීම්<br><br>ආදායම් කාන්දුවීම්වලට බලපාන්නේ අඩු තක්සේරු කිරීම්, භාණ්ඩ ප්‍රකාශයට පත් නොකිරීම, නීති විරෝධීව භාණ්ඩ ගෙන්වීම, හා සුසංයෝගී පද්ධති කේත වර්ගීකරණය<br><br>• අඩු තක්සේරු කිරීම් වැලැක්වීම සඳහා භාණ්ඩ ආනයනයේදී කොළඹ හා මොරටුව විශ්ව විද්‍යාලවලවල සහයෝගයෙන් රේගු සටහන්කර ඉදිරිපත් කරන අවස්ථාවේම නිවැරදි තක්සේරුව ලබා ගැනීමට මෘදුකාංගයක් සකස් කිරීමට අංශයක් ස්ථාපිත කර ඇත.<br><br>•නීති විරෝධීව භාණ්ඩ ගෙන්වීම වැළැක්වීම සඳහා ස්කැනරයක් භාවිතා කරනු ලබයි.<br><br>•වැරදි සුසංයෝගී පද්ධති කේත වර්ගීකරණය වැළැක්වීම සඳහා වූ යෝජනාවලියක් වැඩිදුර පියවර ගැනීම |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | **- ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) /ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම්**<br><br>**- කාරක සභාවේ නිරීක්ෂණ, නිර්දේශ / නියෝග** |
|---|---|---|
| | | සඳහා භාණ්ඩාගාර ලේකම් වෙත යොමු කර ඇත.<br><br><u>නිර්දේශ</u><br><br>- ශ්‍රී ලංකා රේගුව විසින් ඉදිරිපත් කරන ලද යෝජනා ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍ර.ග.නි විසින් අවශ්‍ය පියවර ගැනීම |
| 12 | ***<u>ආදායම් එකතු කිරීම වැඩි කර ගැනීම හා ප්‍රේෂණ ගලා ඒම වැඩි කිරීම සඳහා වූ යෝජනා</u>*** | •එක හා සමාන භාණ්ඩ සඳහා සමාන තීරුබදු අනුපාතයන් හඳුන්වා දීම මගින් බදු පැහැර හැරීම් අවම කිරීම උදා- ඉරිඟු පිෂ්ඨය හා ඉරිඟු පිටි<br><br>•රටවල් අතර සිදු වන වාණිජ වෙළඳාම සඳහා බදු පැනවීම<br><br>•නිසි දේශීය උප බෙදීම් (National Sub Divisions) නොමැති වීම නිසා නිවැරදිව වර්ගීකරණය කළ නොහැකි භාණ්ඩ සඳහා නව දේශීය උප බෙදීම් හඳුන්වා දීම<br><br>•විශේෂිතව හඳුනා ගත් භාණ්ඩ සඳහා බදු හඳුන්වා දීම/ බදු වැඩි කිරීම<br><br>උදා: පරිච්ඡේද 50-55, 58 සහ 60 යටතේ රෙදිපිළි සඳහා එකතු කළ අගය මත බද්ද (VAT ) අය කිරීම සලකා බැලීම. පවතින තීරු බදු ව්‍යුහය, බර අනුව අදාළ වන සෙස් (CESS ) බද්දකින් සමන්විත වන බැවින් මෙම භාණ්ඩ සාමාන්‍යයෙන් වැඩි අගයක් ගනු ලැබේ.<br><br>• ශ්‍රී ලංකා මහ බැංකුව සමග එක් වී අපනයන ප්‍රේෂණ ගලා ඒම අධීක්ෂණය |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | **- ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) /ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම්**<br><br>**- කාරක සභාවේ නිරීක්ෂණ, නිර්දේශ / නියෝග** |
|---|---|---|
| | | කිරීම සඳහා ප්‍රේෂණ කළමනාකරණ පද්ධතියක් සකස් කිරීම<br><br>•මිනිස් මැදිහත්වීම අවම කිරීම සඳහා අනෙකුත් අදාළ රාජ්‍ය ආයතන අතර ඒකාබද්ධ ස්වයංක්‍රීය පද්ධතියක් ක්‍රියාත්මක කිරීම කඩිනම් කිරීම<br><br>• වෙළෙඳ කටයුතුවල පහසුව සඳහා රත්‍, කහ, කොළ හා සම්පූර්ණ තීරුබදු නිදහස් ආකාරයට ආනයනික භාණ්ඩ සඳහා අවදානම් කළමනාකරණ නිර්ණායකයක් හඳුන්වා දීම මගින් පශ්චාත් නිශ්කාෂණ විගණන ක්‍රියාකාරිත්වය ශක්තිමත් කිරීම<br><br>• නීතිවිරෝධීව භාණ්ඩ මෙරටට ගෙන්වීම වැලැක්වීම සඳහා රේගු නාවික අංශය ශක්තිමත් කිරීම |
| 13 | ***<u>සංයෝජිත වර්ගීකරණ අංක (HS Code) වෙනස් කිරීම</u>*** | මෙවැනි අක්‍රමිකතා වැලැක්වීමට දෙපාර්තමේන්තුව විසින් දැනටමත් නිසි ක්‍රියාමාර්ග ගෙන ඇති බව ග.නි. පැවසීය. |
| **14** | ***<u>2017 වසරේ සිට 2021 වසර දක්වා ඛනිජ තෙල් නිෂ්පාදන බදු වලින් ලැබූ ආදායම 72%කින් අඩු වීම</u>*** | ඉන්ධන මිල වැඩිවීම වැළැක්වීම සඳහා හඳුන්වා දුන් බදු නිදහස්කිරීම හේතුවෙන් ඛනිජතෙල් නිෂ්පාදන බද්ද අඩු වූ බව ප්‍ර.ග.නි/ ග.නි ප්‍රකාශ කළේය. |
| **15** | ***<u>සුරාබදු දෙපාර්තමේන්තුවේ යෝජනා</u>***<br>● එතනෝල් හා ඉන්ධන හිඟය නිසා සිදු වන ආදායම් අහිමි වීම | එතනෝල් හිඟය නිසා දිනකට රු. මිලියන 50-100 ක් රජයට අහිමි වන බව සුරාබදු දෙපාර්තමේන්තුවේ ග.නි ප්‍රකාශ කළ |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | **- ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) /ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම්**<br><br>**- කාරක සභාවේ නිරීක්ෂණ, නිර්දේශ / නියෝග** |
|---|---|---|
| | | අතර ඒ සඳහා පහත දැක්වෙන පිළියම් යෝජනා කරන ලදී.<br><br>- මොලැස් හා ඉරිඟු ආනයනය කිරීමට රාජ්‍ය ආයතන 2ට අවසර ලබා දීම<br><br>- ආරක්ෂිත තොගයක් (buffer stock) පවත්වා ගෙන යාම සඳහා එතනෝල් ආනයනයට අවසර ලබා දීම<br><br>-ඉරිඟු ඇට ටොන් 15,000-20,000 ක ප්‍රමාණයක් ආනයනය කිරීමට අවසර ලබා දීම<br><br>-ඉරිඟු හා උක් වගාවන් සඳහා ප්‍රමාණවත් පොහොර සපයා දීම<br><br>-මත්පැන් බෝතල් නිෂ්පාදනය සඳහා අමු ද්‍රව්‍ය සැපයීම |
| **16** | ***<u>මත්පැන් අලෙවිසැල් අන්තර් සම්බන්ධ කිරීමේ ප්‍රගතිය</u>*** | නියමිත කාලය තුළ එම ක්‍රියාවලිය සම්පූර්ණ කරනු ඇති බවත්, අවශ්‍යතා එක් රැස් කිරීමට හා අවදානම් හඳුනා ගැනීමට කටයුතු කර ඇති බවත් සුරාබදු දෙපාර්තමේන්තුවේ ග.නි ප්‍රකාශ කළේය. |
| **17** | ***<u>රා බලපත්‍ර සඳහා ලබා දී ඇති බදු සහන හේතුවෙන් අහිමි වී ඇති ආදායම</u>***<br><br>රා බලපත්‍ර සඳහා ලබා දී ඇති බදු සහන හේතුවෙන් දිනකට රු.මිලියන 400ක ආදායමක් සුරාබදු දෙපාර්තමේන්තුවට අහිමි වීම | ආදායමින් 93%ක් උපයනු ලබන්නේ සමාගම් 6ක් විසින් හා ආදායමින් 7%ක් සමාගම් 15ක් විසින් උපයනු ලබන බව මෙහිදී අනාවරණය විය. එසේම, 2022 ජනවාරි 03 වැනිදා සිට මත්පැන් බෝතල් සඳහා ස්ටිකර් හඳුන්වා දීම මගින් වංචා වැළැක්වීමට පියවර ගෙන ඇති බව සුරාබදු දෙපාර්තමේන්තුවේ ග.නි ප්‍රකාශ |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | **- ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) /ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම්**<br><br>**- කාරක සභාවේ නිරීක්ෂණ, නිර්දේශ / නියෝග** |
|---|---|---|
| | | කළේය. ඊට අමතරව ජංගම යෙදුම හරහා යම් බදු ගෙවන්නෙකු බදු ගෙවා තිෙබ්ද යන්න මහජනයාට දැන ගත හැකි වන බවද ඔහු වැඩිදුරටත් ප්‍රකාශ කළේය.<br><br>ස්ටිකර් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරනු ලබන ඉන්දියානු සමාගමේ පවතින යම් තාක්ෂණික ගැටළුවක් හේතුවෙන් ජංගම යෙදුම් ව්‍යාපෘතිය අවසන් කිරීම ප්‍රමාද වී ඇති බවත්, මෙම ව්‍යාපෘතිය හඳුන්වා දීමෙන් පසු රා බලපත්‍ර ආදායම තුන් ගුණයකින් වැඩි වීම හේතුවෙන් 17%කින් ආදායම වැඩි වි ඇති බවත් කාරක සභාවේ විමසුමට පිළිතුරු දෙමින් සුරාබදු දෙපාර්තමේන්තුවේ ග.නි ප්‍රකාශ කළේය.<br><br>2022 ජූලි මස 01 වැනිදා සිට ආනයන මත්පැන් බලපත්‍ර ක්‍රියාවලිය මෙම ජංගම යෙදුම හරහා පරීක්ෂා කිරීමට පහසුකම් සලසන බව කාරක සභාවේ විමසුමට පිළිතුරු දෙමින් සුරාබදු දෙපාර්තමේන්තුවේ ග.නි ප්‍රකාශ කළේය.<br><br><u>නිර්දේශ</u><br><br>- ස්ටිකර් ව්‍යාපෘතිය භාර ඉන්දියානු සමාගමට ගෙවීම් නැවැත්වීම හා ගිවිසුම ප්‍රකාරව අවශ්‍ය පියවර ගැනීම |
| **18** | ***<u>රා සඳහා ප්‍රමිතීන් නියම කිරීම</u>*** | ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය, කාර්මික තාක්ෂණ ආයතනය හා ආණ්ඩුවේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුව සමග |

| | | |
|---|---|---|
| | **සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු** | **- ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) /ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම්**<br><br>**- කාරක සභාවේ නිරීක්ෂණ, නිර්දේශ / නියෝග** |
| | | ඒකාබද්ධව රා සඳහා ප්‍රමිතිය නියම කිරීම සඳහා පියවර ගන්නා බව කාරක සභාවේ විමසුමට පිළිතුරු දෙමින් සුරාබදු දෙපාර්තමේන්තුවේ ග.නි ප්‍රකාශ කළේය. |
| **19** | ***<u>කෘත්‍රිම රා තහනම් කිරීම</u>*** | කෘත්‍රිම රා තහනම් කිරීම සඳහා ක්‍රමවත් වැඩපිළිවෙළක් අවශ්‍ය බවත්, මනුෂ්‍ය ශරීරයට අහිතකර රා පරිභෝජනය එමගින් නතර වනු ඇති බවත් සුරාබදු දෙපාර්තමේන්තුවේ ග.නි ප්‍රකාශ කළේය. සෑම මත්පැන් වර්ගයක් සඳහාම ප්‍රමිතීන් මේ වන විට නියම කර ඇතැයිද ඔහු වැඩිදුරටත් ප්‍රකාශ කළේය.<br><br><u>**නිර්දේශ**</u><br><br>- නිෂ්පාදනයේ ගුණාත්මකභාවය මිනිස් ශරීරයට අහිතකර නොවන බවට සහතික වීම<br><br>- කෘත්‍රිම රා නිෂ්පාදනය අධෛර්යමත් කිරීම සඳහා අවශ්‍ය පියවර ගැනීම හා ස්වාභාවික රා ප්‍රවර්ධනය කිරීම |
| **20** | ***<u>මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව- ඊ මෝටරින් ව්‍යාපෘතිය</u>*** | <u>**නිර්දේශ**</u><br><br>ඉහත ජංගම යෙදුම් ව්‍යාපෘතිය කඩිනමින් අවසන් කිරීම සඳහා කටයුතු කිරීම හා ඒ පිළිබඳව කාරක සභාවට වාර්තා කිරීම |

<table>
<tr><td></td><td>සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු</td><td>- ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) /ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම්<br><br>- කාරක සභාවේ නිරීක්ෂණ, නිර්දේශ / නියෝග</td></tr>
<tr><td colspan="3">ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුවේ බලපත්‍ර නිකුත් කිරීමේ ක්‍රියාවලිය විධිමත් කිරීම සඳහා පරිගණක මෘදුකාංග පද්ධතියක් හඳුන්වා දීමේ හැකියාව පිළිබඳ සාකච්ඡා කිරීම සඳහා කැඳවූ විශේෂ කාරක සභා රැස්වීම<br><br>විමර්ශනය කරන ලද දිනය - 2022 ජූනි 16</td></tr>
<tr><td colspan="3">❖ කැඳවන ලද ආයතන -<br>මුදල්, ආර්ථික ස්ථායිකරණ හා ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය<br>විදේශ සම්පත් දෙපාර්තමේන්තුව<br>ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුව<br>ශ්‍රී ලංකා රේගුව<br>ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුව<br>දේශීය ආදායම් දෙපාර්තමේන්තුව<br>මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව<br>තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය (ICTA)</td></tr>
<tr><td>01</td><td><u>ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුවේ මෘදුකාංග පද්ධතිය</u><br><br>2015 වර්ෂයේදී ආරම්භ වී පළමු අදියරෙන් පසු අතරමග නතර කර දැමූ ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුවේ මෘදුකාංග පද්ධතිය<br>• ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුව විසින් මෘදුකාංග පද්ධතියක් ස්ථාපිත කිරීම සඳහා 2015 වසර වන විට ටෙන්ඩර් පටිපාටියක් ආරම්භ කර තිබූ</td><td>• මෙම පද්ධතිය මගින් ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුවෙන් ආනයන බලපත්‍ර ලබා ගන්නා ආනයනකරුවන් මාර්ගගත ආකාරයට අයදුම්පත් ඉදිරිපත් කිරීමේ ක්‍රියාවලියේ දී යම් අඩුපාඩු ඇති වූ බවත්, එම අඩුපාඩු නිවැරදි කිරීම සඳහා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය (ICTA) ආයතනය වෙත දන්වා ඇති බවත් ග.නි ප්‍රකාශ කළේය.</td></tr>
</table>

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | **- ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) /ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම්**<br><br>**- කාරක සභාවේ නිරීක්ෂණ, නිර්දේශ / නියෝග** |
|---|---|---|
| | නමුත් එම ක්‍රියාවලිය නවත්වා වෙනත් මෘදුකාංග පද්ධතියක් දියත් කිරීම සඳහා ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය (ICTA) මගින් ටෙන්ඩර් කැඳවා බාහිරව සේවය සපයන (outsource) ආයතනයක් වෙත ටෙන්ඩරය ලබා දීම<br><br>• මෙහි පළමු අදියර අවසන් කළ නමුත් පළමු අදියර ක්‍රියාත්මක කිරීමේදී ඇති වූ ගැටළු කිහිපයක් හේතුවෙන් දෙවන අදියර ආරම්භ කිරීමට නොහැකි වීම<br><br>• පළමු අදියරේ වැඩ කටයුතු අවසන් කිරීම සඳහා රු. මිලියන 8.1ක් වැය වීම<br><br>• පළමු අදියරේදී ආනයනකරුවන් 60 ක් අතුරින් 12 දෙනෙකු පමණක් ලියාපදිංචි කර ඇති බැවින් එහි ප්‍රගතිය 20% ක් පමණක් වීම | • ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුවේ බලපත්‍ර නිකුත් කිරීමේ කාර්යය සඳහා නිර්දේශ ඉදිරිපත් කරන අධිකාරීන් 6ක් මෙම තොරතුරු පද්ධතිය හා සම්බන්ධ කිරීමට අපේක්ෂා කළ නමුත් එම පද්ධතිය හරහා ලබා දෙන වාර්තා නිවැරදි නොවූ බැවින් මෙම වැරදි නිවැරදි කිරීමටත් ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය වෙත කිහිප වරක් දන්වා යැවූ බවද ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුවේ ගණන් දීමේ නිලධාරියා (ග.නි) ප්‍රකාශ කළේය.<br><br>• තොරතුරු තාක්ෂණ පද්ධති අවශ්‍ය ආයතනයන්හි පිරිවිතර නිවැරදිව තම ආයතනය වෙත ලබා නොදීම බොහෝ මෘදුකාංග අසමත් වීමට ප්‍රධාන හේතුව බව තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය නියෝජනය කළ නිලධාරියා ප්‍රකාශ කළේය.<br><br>**<u>නිර්දේශ</u>**<br><br>- සැපයුම්කාර සමාගම සඳහා ටෙන්ඩරය ප්‍රදානය කළේ ශ්‍රී ලංකා |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | **- ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) /ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම්**<br><br>**- කාරක සභාවේ නිරීක්ෂණ, නිර්දේශ / නියෝග** |
|---|---|---|
| | | තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනයේ නිර්දේශය මත නම් තොරතුරු පද්ධතියේ පැන නගින ගැටළු පිළිබඳව අදාළ සමාගම සමඟ සාකච්ඡා කර නිවැරදි කිරීමේ වගකීම පැවරී ඇත්තේද ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය වෙත බව<br><br>- අදාළ මෘදුකාංග පද්ධතිය ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුව විසින් ලිඛිතව භාර ගෙන තිබේනම් එම භාර ගැනීම සනාථ කෙරෙන ලේඛන සති දෙකක් තුළ ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය විසින් කාරක සභාව වෙත යොමු කිරීම<br><br>- ව්‍යාපෘතියේ අරමුදල් මූලාශ්‍රය, අරමුදල් ප්‍රමාණය, අතරමග නැවැත්වීමට හේතු වූ කරුණු, පැවති දුර්වලතා, දෙපාර්තමේන්තුව විසින් මෙම තොරතුරු පද්ධතිය විධිමත්ව භාර ගෙන තිබේද යනාදී කරුණු ඇතුළත් සවිස්තරාත්මක වාර්තාවක් මාසයක් තුළ ප්‍ර.ග.නි/ ග.නි විසින් කාරක සභාව වෙත යොමු කිරීම<br><br>- අවම ලන්සුව ප්‍රදානය කරනු ලබන සැපයුම්කරු වෙත ටෙන්ඩර ප්‍රදානය කිරීමෙන් විවිධ තාක්ෂණික ගැටළු/ |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | - ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) /ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම්<br><br>- කාරක සභාවේ නිරීක්ෂණ, නිර්දේශ / නියෝග |
|---|---|---|
| | | දෝෂ ඇති විය හැකි බැවින් තොරතුරු තාක්ෂණ විෂයේදී ප්‍රශස්තම තාක්ෂණයක් භාවිතා කරන ආයතනය මෘදුකාංග ස්ථාපිත කිරීමේ කාර්යය සඳහා ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය විසින් තෝරා ගැනීම<br><br>- මේ සම්බන්ධයෙන් වසර 10ක් පමණ ඉදිරිය පිළිබඳ සලකා බලා තීරණ ගැනීම |
| 02 | ***<u>එස්තෝනියානු ප්‍රදානය යටතේ ස්ථාපිත කිරීමට නියමිත තොරතුරු පද්ධතිය</u>***<br>• මේ සඳහා දේශීය වශයෙන් රු. මිලියන 15ක පමණ මුදලක් වැය වීම හා මෙම පද්ධතිය ස්ථාපිත කිරීමෙන් පසු වෙනත් පද්ධතීන් හා ගලපා ගැනීමේ ගැටළු (compatibility issues) ඇති වීමේ හැකියාව | එස්තෝනියානු රජයේ ප්‍රදානයක් ලෙස ජාත්‍යන්තර සංවර්ධනය පිළිබඳ එක්සත් ජනපද නියෝජිතායතනය (USAID) රු. මිලියන 150 ක වටිනාකමින් යුතු මෘදුකාංග පද්ධතියක් ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුවේ ස්ථාපනය කිරීමට යෝජනාවක් ඉදිරිපත් වී ඇති බවද, ඒ සඳහා තාක්ෂණ කමිටුවක් පත් කර, ඉදිරි කටයුතු සිදු කර ගෙන යන බවද, ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය නියෝජනය කළ නිලධාරියා ප්‍රකාශ කළේය.<br><br>එමෙන්ම, අවුරුද්දක් ඇතුළත මෙම තොරතුරු පද්ධතිය ස්ථාපනය කිරීමට නියමිත බවද ඔහු වැඩිදුරටත් ප්‍රකාශ කළේය.<br><br>2016 වර්ෂයේ සිට ලෝක බැංකුව සමග එක්ව රජය විසින් සියලු රාජ්‍ය ආයතන |

| | | |
|---|---|---|
| | **සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු** | **- ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) /ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම්**<br><br>**- කාරක සභාවේ නිරීක්ෂණ, නිර්දේශ / නියෝග** |
| | | ඒකාබද්ධ කරමින් තනි කවුළු පද්ධතියක් (single window system) ආරම්භ කිරීමට සැලසුම් කර තිබූ බවත්, මෙය ඉතා මන්දගාමී ක්‍රියාවලියක් වූ බවත් මෙම පද්ධතියේ වැඩ කටයුතු සිදු කරමින් යන අතරතුර එස්තෝනියානු ප්‍රදානය පිළිබඳ යෝජනාව ඉදිරිපත් වූ බවත් විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා ප්‍රකාශ කළේය.<br><br>එස්තෝනියානු ප්‍රදානය පළමු ව්‍යාපෘතියෙන් පරිබාහිර ව්‍යාපෘතියක් බවද, ඒකීය පද්ධතියක් ස්ථාපිත කිරීම වඩා යෝග්‍ය බවද ඔහු ප්‍රකාශ කළේය. එසේම, වරින් වර අමාත්‍යාංශ වෙනස් වීම වැනි ප්‍රායෝගික හේතු මත මෙම පද්ධතිය වසරක් තුළ අවසන් කිරීමට නොහැකි වන බව විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා ප්‍රකාශ කළේය.<br><br>මෙම මෘදුකාංගය පැරණි මෘදුකාංගයක් බවත්, වෙනත් පද්ධතීන් සමග ගලපා ගැනීමේදී ගැටළු උද්ගත විය හැකි බවත්, තනි කවුළු පද්ධතිය අවුරුද්දක් ඇතුළත ස්ථාපිත කිරීමට හැකි වුවහොත් ඒ අනුව මෙම පද්ධතිය අභිරුචිකරණය (customize) සැපයුම්කරු විසින් සිදු කරනු ලබන බවත් ශ්‍රී ලංකා තොරතුරු සන්නිවේදන හා තාක්ෂණ නියෝජිතායතනයේ නියෝජනය කළ නිලධාරියා ප්‍රකාශ කළේය. |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | **- ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) /ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම්**<br><br>**- කාරක සභාවේ නිරීක්ෂණ, නිර්දේශ / නියෝග** |
|---|---|---|
| | | <u>නිර්දේශ</u><br><br>- ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුවේ කාර්යයන් වඩාත් විධිමත් කිරීම සඳහා නව මෘදුකාංග පද්ධතිය කඩිනමින් ස්ථාපිත විය යුතු බව<br>- ජනාධිපති ලේකම් විසින් නිකුත් කරන ලද චක්‍රලේඛය ප්‍රකාරව රාජ්‍ය ආයතන මගින් ආරම්භ කරනු ලබන සියලු තොරතුරු පද්ධතීන්, ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනයේ අධීක්ෂණය යටතට ගැනෙන බැවින් එම ආයතනය අදාළ පද්ධතීන්වල ගැලපුම (compatibility) සම්බන්ධයෙන් මාර්ගෝපදේශ ලබා දිය යුතු වීම<br><br>- තනි කවුළු පද්ධතිය අනුව මෙම මෘදුකාංගය යාවත්කාලීන කිරීම ප්‍රදානයේ අංගයක් විය යුතු බවද, එමගින් අනවශ්‍ය වැයක් දැරීමට සිදු නොවන බව<br><br>- එම මෘදුකාංගය ඒ ආකාරයෙන් ස්ථාපිත කර පසුව යාවත්කාලීන කිරීම් සහ වැඩිදියුණු කිරීම් සිදු කිරීම මෙම පද්ධතිය ස්ථාපිත කර වසරක් ඇතුළත සිදු කරන්නේ නම් පමණක් සැපයුම්කාර සමාගම විසින් එය |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | **- ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) /ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම්**<br><br>**- කාරක සභාවේ නිරීක්ෂණ, නිර්දේශ / නියෝග** |
|---|---|---|
| | | නොමිලයේ සිදු කිරීමට කොන්දේසි ඉදිරිපත් කිරීම වැරදි සහගත බව<br><br>- මෙම ව්‍යාපෘතිය පිළිබඳ අවසන් නිර්දේශය ලබා දීමට පෙර එහි නඩත්තු වියදම් ආදී ඉදිරි වියදම් වෙනුවෙන් විශාල වියදමක් දැරීම සුදුසු නොවන බව<br><br>- ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය මගින් ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුවෙන් ඉල්ලා සිටින කරුණු ඉතා පැහැදිලි විය යුතු බව<br><br>- තනි කවුළු පද්ධතියට ගැලපෙන ලෙස මෙම මෘදුකාංග පද්ධතිය අභිරුචිකරණය කරන ලෙස ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය මගින් නිර්දේශයක් ලබා දීම වඩා යෝග්‍ය බව<br><br>- ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය හා ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුව කැඳවා මෙම ව්‍යාපෘතිය සම්බන්ධයෙන් සාකච්ඡා කර අදාළ ව්‍යාපෘතිය සඳහා ලැබීමට නියමිත එස්තෝනියානු ප්‍රදානය භාර ගැනීම/නොගැනීම පිළිබඳ නිර්දේශය |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | **- ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) /ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම්**<br><br>**- කාරක සභාවේ නිරීක්ෂණ, නිර්දේශ / නියෝග** |
|---|---|---|
| | | ඇතුළත් සවිස්තරාත්මක වාර්තාවක් මාසයක් තුළ ප්‍ර.ග.නි විසින් කාරක සභාව වෙත යොමු කිරීම<br><br>- මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන්නේ නම් එය අනවශ්‍ය මුදල් නාස්තියක් නොවනු බවට ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය විසින් වග බලා ගැනීම |
| 03 | ***<u>ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය මගින් උපදේශන සේවා සපයා ඇති හා දැනට උපදේශන සේවා සපයනු ලබන මෘදුකාංග පද්ධතීන්</u>***<br><br>• සමස්ත රාජ්‍ය සේවයේම තොරතුරු තාක්ෂණය භාවිත කිරීම අසතුටුදායක මට්ටමක පැවතීම, තොරතුරු තාක්ෂණය භාවිත නොකිරීම හේතුවෙන් රාජ්‍ය සේවයේ කාර්යක්ෂමතාවය හීන වී තිබීම, එමෙන්ම රාජ්‍ය ආදායම නිසි ලෙස එකතු කර ගැනීමට නොහැකි වීම හා වංචා දූෂණ ඉහළ ගොස් තිබීම | <u>නිර්දේශ</u><br><br>- ඉහත කී ගැටළුවලට පිළියම් ලෙස රාජ්‍ය සේවයේ කටයුතු සඳහා තොරතුරු තාක්ෂණය හඳුන්වා දීම<br><br>- වසර 20කට පමණ ඉහතදී අංක 2003/27 දරන තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ පනත මගින් තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය ස්ථාපිත කර තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය පිළිබඳ ජාතික ප්‍රතිපත්තියක් හා ක්‍රියා සැලසුමක් පිළියෙල කිරීමේ වගකීම එම ආයතනය වෙත පවරා ඇති හෙයින් එම වගකීම් තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය නිසි පරිදි ක්‍රියාත්මක කිරීම |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | - ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) /ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම්<br><br>- කාරක සභාවේ නිරීක්ෂණ, නිර්දේශ / නියෝග |
|---|---|---|
| | | - තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය මගින් සකස් කරන ලද රාජ්‍ය ආයතනවල ක්‍රියාත්මක වන මෘදුකාංග පද්ධතීන් මොනවාද යන්න හා ඒවායේ වර්තමාන තත්ත්වය, එම ආයතනය මගින් දැනට ආරම්භ කර ඇති නමුත් මෙතෙක් නිම වී නොමැති මෘදුකාංග පද්ධතීන් මොනවාද යන්න හා ඒවායේ වර්තමාන තත්ත්වය හා එම ආයතනය මගින් මෘදුකාංග පද්ධතීන් සඳහා උපදේශන සේවය ලබා දුන් හා දැනට සපයනු ලබන රාජ්‍ය ආයතන මොනවාද යන්න හා ඒවායේ වර්තමාන තත්ත්වය පිළිබඳ වාර්තාවක් තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය මගින් කාරක සභාව වෙත යොමු කිරීම |
| 04 | ***<u>සමස්ත රාජ්‍ය සේවයම ඒකාබද්ධ කිරීමේ අරමුණින් යෝජිත තනි කවුළු පද්ධතිය (Single Window System)</u>***<br>● රජය මගින් සමස්ත රාජ්‍ය සේවයම ඒකාබද්ධ කිරිමේ ප්‍රතිපත්තිය 2015 වර්ෂයේදී ආරම්භ කර වසර 7ක් ගත වුවද, එම කාර්යය ඉටු කර ගැනීමට ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ | එම වැඩසටහනේ මුල් අදියර යටතේ රාජ්‍ය ආයතන විශාල ප්‍රමාණයක් පද්ධතිගත/ ජාලගත කරන ලද බවත්, එම පද්ධතිය යම් මට්ටමකින් ක්‍රියාත්මක වන බවත් ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනයේ නිලධාරියා ප්‍රකාශ කළේය.<br><br>**<u>නිර්දේශ</u>**<br><br>- එක් එක් ආයතනය වෙන වෙනම මෘදුකාංග පද්ධති ස්ථාපිත කිරීමට |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | **- ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) /ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම්**<br><br>**- කාරක සභාවේ නිරීක්ෂණ, නිර්දේශ / නියෝග** |
|---|---|---|
| | නියෝජිතායතනය අපොහොසත් වීම<br>• දැනට පවතින මෘදුකාංග පද්ධති තනි කවුළු පද්ධතිය හා ක්‍රියාත්මක කිරීම සඳහා ඇමරිකන් ඩොලර් මිලියන 16ක මූල්‍යමය අවශ්‍යතාවයක් පැවතීම | වඩා එක් පද්ධතියක් හරහා එම ආයතන සම්බන්ධ කිරීම ව්‍යාපෘතියක් සැලසුම් කිරීම ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනයේ වගකීම විය යුතු බවත්, එසේ නොමැතිව එක් එක් ආයතනයට අවශ්‍ය වූ විට එබඳු මෘදුකාංග පද්ධති නිර්මාණය කිරීම යෝග්‍ය නොවන බව |
| 05 | ***<u>ඊ-රාජ්‍ය (E-Government) පද්ධතියක් වැඩි දියුණු කර ගැනීමේදී සිදු වී තිබෙන ප්‍රමාදය</u>***<br><br>• තොරතුරු තාක්ෂණ පද්ධතියක් නිර්මාණය කිරීම සඳහා රාජ්‍ය ආයතනය විසින් තම අවශ්‍යතාවය පිළිබඳව නිවැරදිව සැපයුම්කරුවා දැනුවත් කිරීම සිදු නොවීම<br>• අවම පිරිවිතර ඉදිරිපත් කරන සැපයුම්කරුවන් තෝරා ගැනීම නිසා පද්ධතිවල දුර්වලතා උද්ගත වීම | රාජ්‍ය ආයතන සඳහා අවශ්‍ය නිවැරදි තොරතුරු තාක්ෂණ පිරිවිතරයන් ලැයිස්තුවක් සකස් කර ලබා දුනහොත් එම අවශ්‍යතාවය ඉටු කළ හැකි බව තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය නියෝජනය කළ නිලධාරියා ප්‍රකාශ කළේය.<br><br>මේ සම්බන්ධයෙන් ලෝක බැංකුව සමග විදේශ සම්පත් දෙපාර්තමේන්තුව සාකච්ඡා පවත්වමින් සිටින බව විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා ප්‍රකාශ කළේය.<br><br>**<u>නිර්දේශ</u>**<br><br>- රාජ්‍ය ආයතන සඳහා තොරතුරු සන්නිවේදන තාක්ෂණය හඳුන්වා දීමට එම ආයතන මැලිකමක් දක්වන නමුත් එම තාක්ෂණය හඳුන්වාදීම සඳහා අවශ්‍ය සියලු පියවර ගැනීම ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | **- ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) /ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම්**<br><br>**- කාරක සභාවේ නිරීක්ෂණ, නිර්දේශ / නියෝග** |
|---|---|---|
| | | තාක්ෂණ නියෝජිතායතනයේ වගකීමක් බව<br><br>- විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ සම්බන්ධීකරණයෙන් හා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනයේ මූලිකත්වයෙන් රටට ගැලපෙන ඊ රාජ්‍ය සේවා ආකෘතියක් පිළියෙල කිරීම<br><br>- මුදල් අමාත්‍යාංශයේ අතිරේක ලේකම්වරයෙකු යටතේ තනි කවුළු පද්ධතිය ක්‍රියාත්මක කිරීමට අදාළ රාජ්‍ය ආයතන කැඳවා මූලික සාකච්ඡාවක් පවත්වා මාසයක් තුළ කාරක සභාව වෙත වාර්තාවක් යොමු කිරීම<br><br>- දැනට රාජ්‍ය ආයතනවල ක්‍රියාත්මක වන සියලු මෘදුකාංග පද්ධතීන් පිළිබඳ අවධානය යොමු කොට රාජ්‍ය සේවය ඒකාබද්ධ කිරීමේ රාජ්‍ය ප්‍රතිපත්තිය යටතේ තනි කවුළු පද්ධතිය ක්‍රියාවට නැංවීම සඳහා ඒකාබද්ධ කළ යුතු ආයතන මොනවාද යන්න හා එම කාර්යය සඳහා එම ආයතන විසින් නිශ්චිත දිනයකදී සිදු කළ යුතු කාර්යයන්/ අවශ්‍යතා/ නෛතික සංශෝධන ඇතුළත් යෝජනාවලියක් ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය විසින් |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | - ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) /ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම්<br><br>- කාරක සභාවේ නිරීක්ෂණ, නිර්දේශ / නියෝග |
|---|---|---|
| | | මාසයක් තුළ කාරක සභාව වෙත යොමු කිරීම |
| 06 | ***<u>දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ ආදායම් පරිපාලන කළමනාකරණ තොරතුරු පද්ධතිය (RAMIS)</u>***<br>• 2015 වසරේ සිටම මෙම මෘදුකාංගය (RAMIS) ස්ථාපිත කිරීමේ අවශ්‍යතාව අවධාරණය කළද එය මේ වන තුරුත් නිම කිරීමට නොහැකි වීම<br><br>• මෙම පද්ධතිය හා මූලික වශයෙන් රාජ්‍ය ආයතන 12ක් ඒකාබද්ධ විය යුතුව තිබුණද, මේ වන විට ඒකාබද්ධ කර ඇත්තේ ආයතන 6ක් පමණක් වීම<br>• ආයතන සම්බන්ධ කිරීමේදී ඒකීය ඩිජිටල් හැඳුනුම්පතක් (Unique Digital Identity) නොමැති වීම මෙම පද්ධතිය ක්‍රියාත්මක කිරීමේදී මතු වී තිබෙන විශාලම ගැටළුව බවද, මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව මෙම පද්ධතිය හා සම්බන්ධ කිරීමට නොහැකි වීමට මෙම ගැටළුව බලපා තිබීම | දේශීය ආදායම් පනතේ සිදු වන සංශෝධන අනුව ඒකාබද්ධ කළ යුතු ආයතන වරින් වර වෙනස් වීම, ඒකාබද්ධ විය යුතු සමස්ත ආයතන සංඛ්‍යාව ප්‍රමුඛතා පදනම මත සකස් කර අඩු ප්‍රමුඛතාවයක් සහිත ආයතන ඒකාබද්ධ කිරීමෙන් තාවකාලිකව ඉවත් කිරීම හා ඇතැම් ආයතනවල පවතින නෛතික බාධා හේතුවෙන් මෙම පද්ධතියට සම්බන්ධ කිරීමට නොහැකිව පවතින බවද දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ ග.නි ප්‍රකාශ කළේය.<br><br>ඒකීය ඩිජිටල් හැඳුනුම්පතක් (Unique Digital Identity පිළිබඳ ගැටළුව නිරාකරණය වන්නේ නම් ඕනෑම ආයතන ප්‍රමාණයක් තොරතුරු හුවමාරුව සඳහා සම්බන්ධ කළ හැකි බවද, බදු හඳුනා ගැනීමේ අංකය (TIN) භාවිතා කරන සියලුම ආයතන මේ වන විටත් පද්ධතිය හා සම්බන්ධ කර ඇති බවද, නීතිමය බාධාවන් සහිත ආයතනවල එම බාධාවන් නිරාකරණය කර ගෙන යන බවද ග.නි වැඩිදුරටත් ප්‍රකාශ කළේය.<br><br><u>**නිර්දේශ**</u><br><br>- දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ ආදායම් පරිපාලන කළමනාකරණ තොරතුරු පද්ධතිය (RAMIS) |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | **- ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) /ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම්**<br><br>**- කාරක සභාවේ නිරීක්ෂණ, නිර්දේශ / නියෝග** |
|---|---|---|
| | | මෙන්ම තනි කවුළු පද්ධතිය යන ව්‍යාපෘති දෙකම ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනයේ (ICTA) සම්බන්ධීකරණයෙන් සහ මෙම ව්‍යාපෘති දෙකම මුදල් අමාත්‍යාංශය මගින් ක්‍රියාත්මක කිරීම<br>- ආදායම් පරිපාලන කළමනාකරණ පද්ධතිය හා ඒකාබද්ධ විය යුතු ආයතන කැඳවමින් මුදල් අමාත්‍යාංශයේ අතිරේක ලේකම්වරයාගේ ප්‍රධානත්වයෙන් රැස්වීමක් පවත්වා එම ආයතන මෙම පද්ධතිය හා සම්බන්ධ වීමට ඉටු කළ යුතු කාර්යයන් සම්බන්ධයෙන් දින වකවානු සහිත වාර්තාවක් මාසයක් තුළ ප්‍ර.ග.නි විසින් කාරක සභාවට ඉදිරිපත් කිරීම |
| 07 | ***<u>සුරාබදු දෙපාර්තමේන්තුවේ මෘදුකාංග පද්ධතිය</u>*** | මත්පැන් වෙළෙඳසැල්, පොලිස් ස්ථාන, ප්‍රාදේශීය ලේකම් කාර්යාල වැනි සෑම පාර්ශ්වයක්ම සම්බන්ධ වන ආකාරයට මෙම පද්ධතිය සකස් වෙන බවත්, බලපත්‍ර නිකුත් කිරීමේ ක්‍රියාවලිය, නිෂ්පාදනාගාර අධීක්ෂණය, සුරාබදු හා බදු පරිපාලනය, මත්පැන් බෙදා හැරීම, සැපයුම, දාම නියාමනය, අපරාධ හා නීති කළමනාකරණය, වාර්තා නිකුත් කිරීමේ පහසුව මෙන්ම අවදානම් කළමනාකරණය ආදී සෑම ක්ෂේත්‍රයක්ම |

| | | |
|---|---|---|
| | **සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු** | **- ප්‍රධාන ගණන් දීමේ නිලධාරී (ප්‍ර.ග.නි.) /ගණන් දීමේ නිලධාරීගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම්**<br><br>**- කාරක සභාවේ නිරීක්ෂණ, නිර්දේශ / නියෝග** |
| | | මෙමගින් ආවරණය වන බව. සුරාබදු දෙපාර්තමේන්තුවේ ග.නි ප්‍රකාශ කළේය.<br><br>__නිර්දේශ__<br><br>- දැනට සුරාබදු බලපත්‍ර අනුමැතිය දෘඪ පිටපතක් ලෙස ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් වෙන බවත්, එම අනුමැතිය මාර්ගගත ක්‍රමයට ඉදිරිපත් විය යුතු බව |
| 08 | __*මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ මෘදුකාංග පද්ධතිය*__ | මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ ලේඛන කළමනාකරණ පද්ධතිය මේ වන විටත් ක්‍රියාත්මක වන බව මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ ග.නි ප්‍රකාශ කළේය. |
| **ශ්‍රී ලංකාවේ පවතින ආර්ථික අර්බුදය යටතේ පවතින අභියෝගවලට මුහුණ දීම සඳහා පොදු ප්‍රවාහන පහසුකම්වල කාර්යක්ෂමතාව ඉහළ නැංවීමට ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යාංශයේ වත්මන් සහ අනාගත සැලසුම් විමර්ශනය කිරීමේ විශේෂ රැස්වීම**<br><br>**විමර්ශනය කරන ලද දිනය - 2022 ජූලි 05** | | |
| ❖ කැඳවන ලද ආයතන -<br>ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යාංශය,<br>දුම්රිය දෙපාර්තමේන්තුව, මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව,<br>ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය, ජාතික ගමනාගමන කොමිෂන් සභාව | | |
| 01 | __*ප්‍රධාන මෙහෙයුම් සැලැස්මක් සකස් කිරීමට නිදහස් කළ ප්‍රතිපාදන*__ | උක්ත ප්‍රදානය ලැබී ඇත්තේ කොළඹ තදාසන්න දුම්රිය ව්‍යාපෘතියට (Colombo Suburban Railway Project) බවත්, මෙම |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | - ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) /ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම්<br><br>- කාරක සභාවේ නිරීක්ෂණ, නිර්දේශ / නියෝග |
|---|---|---|
| | • 2017 වසරේදී ආසියානු සංවර්ධන බැංකුවේ ප්‍රදාන යටතේ ලද ඇ.ඩො.මි.1.5ක් වැය කර දුම්රිය දෙපාර්තමේන්තුව සඳහා ප්‍රධාන මෙහෙයුම් සැලැස්මක් සකස් කිරීමට 2017 ඔක්තෝබර් මස ගිවිසුම්ගතව තිබුණි. මෙම ව්‍යාපෘතිය 2020 ජූනි මාසයේදී නිම කළ යුතු වුවද, 2021 ජූනි මාසය දක්වා කාලය දීර්ඝ කර ඇත. ආසියානු බැංකු මූලාශ්‍ර වලට අනුව 2021 ජූලි වන විට නිදහස් කළ ප්‍රතිපාදන ඇ.ඩො.1,056,555.63ක් බව කාරක සභාව නිරීක්ෂණය කළේය. ආසියානු සංවර්ධන බැංකුවෙන් 2017 වර්ෂයේ ලැබුණා වූ එම මුදලට කුමක් සිදු වූයේද යන්න පිළිබඳ වාර්තා වී නොමැති බව විගණකාධිපතිවරයා අනාවරණය කළේය.<br><br>• සකස් කරන ලද මෙහෙයුම් සැලැස්ම පිළිබඳ විස්තර විගණනය සඳහා ඉදිරිපත් නොවීම ද එම ප්‍රදානයන් ප්‍රවාහන අමාත්‍යාංශයේ අයවැය ඇස්තමේන්තු තුළ හෝ මූල්‍ය ප්‍රකාශන තුළ | ව්‍යාපෘතිය යටතේ ඇති ශ්‍රී ලංකා දුම්රිය ප්‍රධාන සැලැස්ම, ඊට අදාළ උපදේශන සමාගම වන ජපානයේ පැඩෙකෝ සමාගම විසින් සකස් කළ බවත් ප්‍ර.ග.නි. / ග.නි. ප්‍රකාශ කළේය. එම පැඩෙකෝ (PADECO Co. Ltd) සමාගමේ නියෝජිතයන් දැනට ලංකාවේ නොමැති බවත්, එම සමාගම සමඟ කටයුතු කළ දේශීය සමාගම සමඟ Zoom තාක්ෂණය ඔස්සේ රැස්වීමක් පවත්වා මේ සම්බන්ධයෙන් සති 3ක් තුළ කාරක සභාවට වාර්තාවක් ලබා දීමටත් ප්‍ර.ග.නි. /ග.නි. එකඟ විය.<br><br>ආසියානු සංවර්ධන බැංකුව විසින් ලබා දෙන ප්‍රදානයන් මගින් සිදු කරන මෙවැනි ව්‍යාපෘතිවලට ශක්‍යතා අධ්‍යයනය සිදු කිරීමේදී, අවශ්‍ය උපදේශකයන් එම බැංකුව මගින්ම පත් කරන බවත්, මෙම ඇ.ඩො.මිලියනයට ආසන්න මුදල ඒ වෙනුවෙන් දරා ඇති බවත් ප්‍ර.ග.නි. ප්‍රකාශ කළේය. මෙවැනි ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී ව්‍යාපෘතියේ අධීක්ෂණ ආයතනය (Executing Agency) ලෙස අමාත්‍යාංශය ක්‍රියාකරන බවත්, ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ ආයතනය (Implementing Agency) ලෙස දුම්රිය දෙපාර්තමේන්තුව ක්‍රියා කරන බවත් ප්‍ර.ග.නි. ප්‍රකාශ කළේය.<br><br>මෙම ප්‍රදානය ලබා ගැනීම සඳහා අමාත්‍යාංශයේ ප්‍ර.ග.නි. වෙනුවට අතිරේක ලේකම්වරයකු සම්බන්ධ වීම, මෙහි |

| | **සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු** | **- ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) /ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම්**<br><br>**- කාරක සභාවේ නිරීක්ෂණ, නිර්දේශ / නියෝග** |
|---|---|---|
| | ඇතුළත්ව නොතිබීම පිළිබඳව ද කාරක සභාවේ විශේෂ අවධානය යොමු විය.<br><br>• මෙහි ව්‍යාපෘති අධ්‍යක්ෂ ලෙස කටයුතු කොට ඇත්තේ අමාත්‍යාංශයේ අතිරේක ලේකම්වරයකු බවත්, ඔහු දැනට සේවයේ නොමැති බවත් අනාවරණය විය.<br><br>• විදේශ ප්‍රදාන ගිණුම් තැබීම | ගෙවීම් සිදු කළ පසු ව්‍යාපෘති ගිණුම් (Project Accounts) විගණනයට ඉදිරිපත් නොවීම හා එම ප්‍රදානයන් ගිණුම් ගත නොවීම වැරදි සහගත බව කාරක සභාව අවධාරණය කළේය.<br><br>ආසියානු සංවර්ධන බැංකුව විසින් ප්‍රදාන (Grant) ලබා දීමේදී ඒ පිළිබඳ මහා භාණ්ඩාගාරය දැනුවත් කළ යුතු බව හා විදේශ සම්පත් ගිණුම් තැබීමට අදාළව විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ ගිණුම් චක්‍රලේඛ 33 අනුකූලව ක්‍රියාකළ යුතු බව විගණකාධිපතිවරයා ප්‍රකාශ කළේය. තවද, මෙම ප්‍රදානය සෘජු ගෙවීමක් (Direct Payment) බැවින්, අමාත්‍යාංශය විසින් වැය ශීර්ෂයක් (Vote) පිළියෙල කර, අයවැය දෙපාර්තමේන්තුවෙන් මෙම ප්‍රදානය සඳහා ප්‍රතිපාදන වෙන් කර ගත යුතු බවද විගණකාධිපතිවරයා පෙන්වා දුන්නේය. එසේම, මෙය ප්‍රදානයක් ලෙස හඳුනා ගැනීම තුළ එය මහා භාණ්ඩාගාරයේ ගිණුම් ගත කළ යුතු බවද කාරක සභාව හමුවේ ඔහු වැඩිදුරටත් ප්‍රකාශ කළේය.<br><br>ශ්‍රී ලංකා දුම්රිය ප්‍රධාන සැලැස්ම යටතේ වූ ව්‍යාපෘතියට සම්බන්ධව තීරණ ගත්තා වූ නිලධාරීන් ද ඒ හා සම්බන්ධ විශ්‍රාම ගිය නිලධාරීන්ද මීළඟ කාරක සභා රැස්වීම්වලට කැඳවන බව ප්‍ර.ග.නි. වෙත කාරක සභාව දැනුම් දුන්නේය. |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | **- ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) /ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම්**<br><br>**- කාරක සභාවේ නිරීක්ෂණ, නිර්දේශ / නියෝග** |
|---|---|---|
| | | මෙම මෙහෙයුම් සැලැස්ම පිළිබඳ තොරතුරු සහ ආසියානු සංවර්ධන බැංකුවෙන් ලද ප්‍රදානයන් ප්‍රවාහන අමාත්‍යාංශයේ අයවැය ඇස්තමේන්තු තුළ හෝ මූල්‍ය ප්‍රකාශ තුළ ඇතුළත්ව නොතිබීමට හේතු සහ ඒ සම්බන්ධ සියලු තොරතුරු ඇතුළත් වාර්තාවක් මාසයක් තුළ කාරක සභාවට ඉදිරිපත් කරන ලෙසද ප්‍ර.ග.නි. වෙත කාරක සභාව නියෝග කළේය. |
| 02 | ***<u>කැළණිවැලි දුම්රිය මාර්ග ව්‍යාපෘතිය</u>***<br><br>•කොළඹ තදාසන්න දුම්රිය ව්‍යාපෘතිය (Colombo Suburban Railway Project) යටතේ දුම්රිය මාර්ග පද්ධතිය වැඩිදියුණු කිරීම සඳහා වූ කැළණි වැලි දුම්රිය මාර්ගයේ ශක්‍යතා අධ්‍යන වාර්තාව හා සවිස්තරාත්මක වාර්තා 2021 මාර්තු මස ප්‍රවාහන අමාත්‍යාංශය වෙත භාර දී දැනට දුම්රිය දෙපාර්තමේන්තුව භාරයේ පැවතිය ද වසරකට ආසන්න කාලයක් ගත වී ඇතත් ඒ සම්බන්ධව ගත යුතු ඉදිරි ක්‍රියාමාර්ග කිසිවක් ගෙන නොතිබීම. | මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය ණය පහසුකම් ලබා දීමට ආසියානු සංවර්ධන බැංකුව විසින් සිය එකඟතාවය පළ කර තිබුණ ද, අමාත්‍ය මණ්ඩලය විසින් 2019/2020 වර්ෂවලදී, ප්‍රවාහන අමාත්‍යාංශයේ ව්‍යාපෘති පිළිබඳ පරීක්ෂා කිරීම සඳහා පත් කළ නිලධාරීන් තිදෙනෙකුගෙන් යුක්ත කමිටුවෙහි වාර්තාව මගින් මෙම ව්‍යාපෘතිය නැවැත්වීමට නිර්දේශ කර තිබූ බව ප්‍ර.ග.නි. කාරක සභාව හමුවේ අනාවරණය කළේය.<br><br>ප්‍රවාහන අමාත්‍යාංශයේ ව්‍යාපෘති පිළිබඳ පරීක්ෂා කිරීම සඳහා පත් කළ කමිටුව විසින් අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කරන ලද කැළණිවැලි දුම්රිය ව්‍යාපෘතිය නැවැත්වීම සම්බන්ධ වාර්තාව හා එම කමිටුවේ නිලධාරීන් පිළිබඳව හා ඔවුන්ගේ සුදුසුකම් හා පළපුරුද්ද |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | - ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) /ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම්<br><br>- කාරක සභාවේ නිරීක්ෂණ, නිර්දේශ / නියෝග |
|---|---|---|
| | •ආසියානු සංවර්ධන බැංකු ණය පහසුකම යටතේ රු.1,446,952,381ක මුදලක් වැයකර ශක්‍යතා අධ්‍යනයක් සිදුකර තිබූ අතර එම ණය සඳහා වූ ණය වාරිකය වූ ඇ.ඩො.275,000 ක් බැගින් අර්ධ වාර්ෂිකව 2022 මාර්තු 15 දින සිට ගෙවීමට නියමිතව තිබීම.<br>•මෙම ව්‍යාපෘතිය සඳහා ඇ.ඩො.මි.8.97ක් වැය කර තිබුණද ව්‍යාපෘතිය මෙතෙක් ක්‍රියාත්මක කිරීමට කටයුතු කර නොතිබීම කාරක සභාවේ අවධානයට ලක් විය | සම්බන්ධ තොරතුරු ඇතුළත් වාර්තාවක් කාරක සභාව වෙත ඉදිරිපත් කරන ලෙස කාරක සභාව ප්‍ර.ග.නි. වෙත නියෝග කළේය. |
| 03 | ***<u>විදේශ ආධාර මත ක්‍රියාත්මක ව්‍යාපෘතිවල ප්‍රගතිය අධීක්ෂණය කිරීමේ ක්‍රියාවලිය</u>*** | විදේශ ආධාර ව්‍යාපෘතිවල ප්‍රගතිය පිළිබඳ සාකච්ඡා, මාසිකව හෝ සති 2කට වරක් අදාළ ව්‍යාපෘති අධ්‍යක්ෂ හා අමාත්‍යාංශයේ සහභාගීත්වයෙන් සිදු කරන බවද, ඊට අමතරව සෑම මාස 3කටම වරක් අමාත්‍යාංශ ලේකම්වරයාගේ සභාපතීත්වයෙන් යුක්ත මෙහෙයුම් කමිටුව (Steering Committee) රැස්වන බවද, ඒ හරහා ව්‍යාපෘති සම්බන්ධ ගැටළුවලට විසඳුම් ලබා දෙන බවද ප්‍ර.ග.නි. කාරක සභාව හමුවේ ප්‍රකාශ කළේය. නමුත් මෙහිදී එම අධීක්ෂණ ක්‍රියාවලිය නිවැරදිව සිදු වී නොමැති නමුත්, මේ වන විට සියලුම ව්‍යාපෘති පිළිබඳ පසු විපරම් ක්‍රියාවලියක් සිදුවන බව ප්‍ර.ග.නි. ප්‍රකාශ කළේය |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | - ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) /ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම්<br><br>- කාරක සභාවේ නිරීක්ෂණ, නිර්දේශ / නියෝග |
|---|---|---|
| 04 | ***<u>ඉන්දියානු ණය ආධාර යටතේ ඉන්දියාවෙන් මිල දී ගත් දුම්රිය මැදිරි 160 කින් 103 ක් මේ වන විටත් භාවිතයට නොගැනීම</u>*** | එලෙස ඉන්දියාවෙන් ගෙන්වා ඇති දුම්රිය මැදිරි "එයාර් බ්‍රේක්" (Air Brake) ක්‍රමවේදයට අයත් මැදිරි බවත් දුම්රිය දෙපාර්තමේන්තුව සතු දුම්රිය මැදිරි "වැකියුම් බ්‍රේක්" (Vacuum Brake) ක්‍රමවේදයට ක්‍රියාත්මක වන දුම්රිය මැදිරි බවත් විගණකාධිපති වාර්තාවෙන් හෙළිදරව් විය.<br><br>එලෙස මෙරට භාවිතයට නොගැලපෙන දුම්රිය මැදිරි මිලදී ගැනීම කාරක සභාවේ අප්‍රසාදයට ලක් විය. පිරිවිතර වලට පටහැනිව මෙම මැදිරි මිලදී ගැනීම පිළිබඳ විශේෂ විගණන වාර්තාවක් ඉදිරියේදී පාර්ලිමේන්තුවේ සභාගත කිරීමට නියමිත බව විගණකාධිපතිවරයා කාරක සභාව හමුවේ ප්‍රකාශ කළේය. |
| 05 | ***<u>විධිමත් ප්‍රවාහන ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක නොවීම</u>*** | 2009 වර්ෂයේ ප්‍රවාහන ප්‍රතිපත්තිය සකස් කළද පවතින රජයන්ගේ වෙනස් වීම මත ප්‍රවාහන ප්‍රතිපත්තිය වෙනස් වූ බවද, මේ වන තෙක් එම ප්‍රතිපත්තිය සඳහා අනුමැතිය ලබා ගැනීමට නොහැකි වී ඇති බව ද කාරක සභාවේදී අනාවරණය විය. එම තත්වය පොදු ප්‍රවාහනයේ ගුණාත්මකභාවය අඩු කිරීමට හේතුවන බව කාරක සභාව අවධාරණය කළේය. |
| 06 | ***<u>දුම්රිය ප්‍රවාහන සේවය කාර්යක්ෂම කිරීමට ගත හැකි ක්‍රියාමාර්ග</u>*** | • කාර්යාල ගමන් සේවා සඳහා වැඩි අවධානයක් යොමු කර, දුම්රිය ගමන් වාර සංඛ්‍යාව හා දුම්රිය මැදිරි |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | - ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) /ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම්<br><br>- කාරක සභාවේ නිරීක්ෂණ, නිර්දේශ / නියෝග |
|---|---|---|
| | රට තුළ පවතින අර්බුදකාරී ආර්ථික වාතාවරණය තුළ වැඩි මගීන් පිරිසක් ප්‍රවාහනය සඳහා දුම්රිය භාවිතා කිරීමට යොමු වී ඇති හෙයින් දුම්රිය ප්‍රවාහන සේවය කාර්යක්ෂම කිරීමට ගත හැකි ක්‍රියාමාර්ග | සංඛ්‍යාව වැඩි කිරීමට අවශ්‍ය පියවර ගන්නා ලෙස කාරක සභාව ප්‍ර.ග.නි./ග.නි. ට උපදෙස් දුන්නේය. මුහුදුබඩ දුම්රිය ප්‍රවාහන කටයුතු වැඩි දියුණු කිරීමට කටයුතු කරන ලෙසද බෙලිඅත්ත-මාතර අතර දිවෙන දුම්රිය සඳහා අවම වශයෙන් එක් දුම්රිය මැදිරියක් හෝ වැඩි කිරීමට අවශ්‍ය පියවර ගන්නා ලෙසද කාරක සභාව ප්‍ර.ග.නි.ට නිර්දේශ කළේය.<br>• වැඩි කළ යුතු දුම්රිය ගමන් වාර පිළිබඳ සොයා බැලීම සඳහා විශ්ව විද්‍යාල ශිෂ්‍ය කණ්ඩායම්වල සහයෝගය ලබා ගෙන දුම්රිය ගමන් වාර සම්බන්ධයෙන් විශ්ලේෂණයක් සිදු කිරීමටත්, මගී ජනතාවට පහසුව සැලසෙන ආකාරයෙන් විද්‍යානුකූල ප්‍රවාහන කාල සටහනක් සකස් කර ගන්නා ලෙසත් කාරක සභාව ප්‍ර.ග.නි.ට නියෝග කළේය.<br>• එසේම විශේෂයෙන් බස් රථ හා දුම්රිය ඒකාබද්ධ කාල සටහනක් අනුව ධාවනය කිරීමට අවශ්‍ය පියවර ගන්නා ලෙස ප්‍ර.ග.නි./ග.නි. වෙත කාරක සභාව තවදුරටත් නියෝග කළේය.<br><br>පොදු ප්‍රවාහනය සඳහා ලබා දී ඇති මහා භාණ්ඩාගාර ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවන බවත් දුම්රිය සේවය වැඩි දියුණු කිරීමට විදේශීය උපදේශකත්වය අවශ්‍ය බවත් ප්‍ර.ග.නි. සඳහන් කළේය. |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | **- ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) /ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම්**<br><br>**- කාරක සභාවේ නිරීක්ෂණ, නිර්දේශ / නියෝග** |
|---|---|---|
| | | උපදේශකත්වය ලබා ගැනීම සඳහා ඉන්දියාව යෝග්‍ය බවද, තාක්ෂණය දියුණු රටවල උපදේශකත්වය ලබා ගත හැකි නම් වඩාත් සුදුසු බවද කාරක සභාවේ අදහස විය. |
| 07 | ***<u>වර්තමානයේ පවතින අර්බුදකාරී තත්වය තුළ ධාවනය වන බස්රථ ප්‍රමාණය</u>*** | මේ වන විට ශ්‍රී.ලං.ග.ම. බස් රථ 800 / 900ක් පමණ ධාවනය කරගත නොහැකි තත්වයක් පවතින බව ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩලයේ ග.නි. ප්‍රකාශ කළේය.<br><br>සාමාන්‍යයෙන් ප්‍රසම්පාදන කටයුතු වසර මුල ඇරඹෙන බවත්, ඇමෙරිකන් ඩොලරයේ අගය අසාමාන්‍ය ලෙස ඉහළ යෑම නිසා වාහන උපාංග මිල අනපේක්ෂිත ලෙස ඉහළ යාම හේතුවෙන් ප්‍රසම්පාදන කමිටු විසින් තෝරාගත් සැපයුම්කරුවන් සිය ප්‍රසම්පාදන කටයුතු නවත්වා ඇති බවත් මෙහිදී සඳහන් විය. දැනට පවතින චක්‍රලේඛ අනුව යමින් උපාංග (ටයර්, බැටරි, ටියුබ්) මිලදී ගැනීමට අපහසු බවද වර්තමාන අර්බුදකාරී තත්වයට ගැලපෙන ලෙස අදාළ චක්‍රලේඛ සංශෝධනය විය යුතු බවද ග.නි. ප්‍රකාශ කළේය.වෙනස් වූ මිල ගණන් අනුව එම උපාංග මිලදී ගැනීම සඳහා අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලබා ගන්නා බවද ඉදිරි වර්ෂයේදී ප්‍රසම්පාදන සඳහා ගිවිසුම් වලට එළඹීමේදී, භාණ්ඩාගාරයේ අනුමැතිය සහිතව, ඩොලරයේ හෝ ඉන්ධන මිල ඉහළ යාම අනුව භාණ්ඩ වල මිල ගණන් වෙනස් |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | **- ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) /ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම්**<br><br>**- කාරක සභාවේ නිරීක්ෂණ, නිර්දේශ / නියෝග** |
|---|---|---|
| | | කිරීමට එම ගිවිසුම්වලට මිල සූත්‍රයක් ඇතුළත් කිරීමට අපේක්ෂා කරන බවද ප්‍ර.ග.නි. ප්‍රකාශ කළේය.<br><br><u>**නිර්දේශ**</u><br><br>- වර්තමානයේ පවතින ඉන්ධන අර්බුදය හේතුවෙන් සීමිත බස් රථ ප්‍රමාණයක් පමණක් ධාවනය වීමත් විශාල මගීන් ප්‍රමාණයක් එම බස් රථවල ගමන් කිරීමත් හේතුවෙන් ඇතිවිය හැකි අනතුරු වලක්වාලීම සඳහා බස් රථවල ප්‍රමිතිය පරීක්ෂා කිරීමට කටයුතු කරන ලෙස ප්‍ර.ග.නි./ග.නි. වෙත කාරක සභාව නියෝග කළේය. |
| 08 | <u>*රට තුළ පවතින ඉන්ධන හිඟය බස් සේවාව කෙරෙහි බලපා ඇති ආකාරය*</u> | අන්තර් පළාත් බස් රථ 3200ක් සහ පළාත් සභා බස් රථ 16 500 ක් පමණ පැවතියද රට තුළ පවතින ඉන්ධන හිඟය හේතුවෙන් අද වන විට ඉන් බස් රථ 10%ක් පමණක් ධාවනයේ යෙදවෙන බව ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩලයේ ග.නි. ප්‍රකාශ කළේය.<br><br>ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය, ජාතික ගමනාගමන කොමිෂන් සභාව හා මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය යන ආයතනවල නියෝජනයෙන්, ඉන්ධන කමිටුවක් ප්‍රවාහන අමාත්‍යාංශයේ ස්ථාපිතව ඇති බව මෙහිදී අනාවරණය විය. ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | **- ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) /ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම්**<br><br>**- කාරක සභාවේ නිරීක්ෂණ, නිර්දේශ / නියෝග** |
|---|---|---|
| | | විසින් දිනකට ශ්‍රී.ලං.ග.ම. සඳහා ලබා දෙනු ලබනුයේ ධාරිතාවය ලීටර් 6600ක් වූ ඉන්ධන බවුසර් 80ක් බව ග.නි. ප්‍රකාශ කළේය. ලං.ග.ම හා පෞද්ගලික බස් රථ, සුව සැරිය ගිලන් රථ, රජයේ විශේෂිත ආයතන සේවා සඳහා සහ පෞද්ගලික අංශයේ අත්‍යවශ්‍ය සේවා ඇතුළු සියලු කටයුතු සඳහා ලබා දීමට සිදුවන්නේ ලීටර් 528,000ක් වූ ඉන්ධන ප්‍රමාණයක් බවද මෙහිදී අනාවරණය විය.<br><br><u>නිර්දේශ</u><br><br>- ශ්‍රී.ලං.ග.ම. ඩිපෝ හරහා පෞද්ගලික බස් රථ වලට ඉන්ධන ලබා දීමේදී පවතින කොන්දේසි ලිහිල්කර හෝ එම ඉන්ධන ලබා දීමේ ක්‍රමවේදය වේගවත් කිරීමට කටයුතු කරන ලෙස ප්‍ර.ග.නි./ග.නි. වෙත කාරක සභාව නියෝග කළේය.<br><br>- මගී ප්‍රවාහනය වැඩිපුර අවශ්‍ය වන මාර්ගවල ධාවනය වන පෞද්ගලික බස් රථ සඳහා ඩීසල් නිකුත් කිරීමේදී ප්‍රමුඛතාවය ලබාදීමට කටයුතු කරන ලෙසද ප්‍ර.ග.නි./ග.නි. වෙත කාරක සභාව නියෝග කළේය |
| 09 | ශ්‍රී .ලං.ග.ම. ඩිපෝ හරහා පෞද්ගලික බස් රථ වලට ලබා දෙන ඉන්ධන එලෙසම බස් රථ ධාවනය කිරීම සඳහා යොදා | ඒ ආකාරයෙන් පෞද්ගලික බස් රථ නියාමනය කිරීමට එම බස් රථවලට (ගෝලීය ස්ථාන නිර්ණයන පද්ධතිය- Global Positioning System) GPS |

| | **සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු** | **- ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) /ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම්**<br><br>**- කාරක සභාවේ නිරීක්ෂණ, නිර්දේශ / නියෝග** |
|---|---|---|
| | ගන්නේද යන්න සොයා බැලිය හැකි ලෙස පද්ධතිය සකස් කළ යුතු බවට කාරක සභාවේ අවධාරණය කිරීම | තාක්ෂණය යොදා ගැනීම සඳහා කටයුතු කරන ලෙස ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ ග.නි. වෙත කාරක සභාව නියෝග කළේය.<br><br>එසේම, වර්තමානයේ පෞද්ගලික බස් රථ, ජාතික ගමනාගමන කොමිෂන් සභාව (NTC) හා පළාත් සභා අතර නිසි සම්බන්ධීකරණයක් නොමැති බව පෙන්වා දුන් කාරක සභාව එවැනි සම්බන්ධීකරණයක වැදගත්කම අවධාරණය කළේය.<br><br>**<u>නිර්දේශ</u>**<br><br>- ඉදිරි කාලසීමාව තුළ පොදු ප්‍රවාහනය වඩා කාර්යක්ෂමව පවත්වා ගැනීම සහ දියුණු කිරීම සඳහා කෙටිකාලීනව හා මධ්‍යකාලීනව ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත ක්‍රියාකාරී සැලැස්මක් සකස් කර කාරක සභාව වෙත ඉදිරිපත් කරන ලෙස ප්‍ර.ග.නි. වෙත කාරක සභාව නියෝග කළේය |

## සූචිය

| | පිටු අංකය |
|---|---|
| **අ** | |
| ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුව | 64 |
| **ක** | |
| කොළඹ මහනගර සභාව | 15 |
| කෘෂිකර්ම අමාත්‍යාංශය | 58 |
| **බ** | |
| බලශක්ති අමාත්‍යාංශය | 47, 51 |
| **ව** | |
| විදේශ සම්පත් දෙපාර්තමේන්තුව | 77 |
| වෙළඳ අමාත්‍යාංශය | 38 |
| **ස** | |
| සුරාබදු දෙපාර්තමේන්තුව | 29 |

## විශේෂ විමර්ශන


**පිටු අංකය**

- 2021.11.19 දින රජයේ ගිණුම් පිළිබඳ කාරක සභා රැස්වීමේදී ගත් තීරණ ප්‍රකාරව කැඳවූ ශ්‍රී ලංකාවේ අපද්‍රව්‍ය බැහැරකිරීම සහ සමුද්‍රීය පරිසර ආරක්ෂණය පිළිබඳ වර්තමානයේදී පවතින ගැටළු සාකච්ඡා කිරීම සඳහා වන විශේෂ කාරක සභා රැස්වීම. 22

- ශ්‍රී ලංකාව වර්තමානයේ මුහුණ දෙමින් සිටින මන්දපෝෂණ තත්වය අඩු කිරීම හා ආහාර අර්බුදය විසඳීම සඳහා ගත හැකි ක්‍රියාමාර්ග පිළිබඳව සොයා බැලීම සඳහා වූ විශේෂ කාරක සභා රැස්වීම. 82

- ශ්‍රී ලංකාවේ අධ්‍යාපන පද්ධතිය මත ක්‍රියාත්මක කිරීමට නියමිත අනාගත අධ්‍යාපන සැලසුම් සහ අධ්‍යාපන පද්ධතිය මත කොවිඩ් වසංගතයේ බලපෑම සහ පවතින ආර්ථික අර්බුදයේ බලපෑම පිටුදැකීම සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග විමර්ශනය කිරීමේ විශේෂ රැස්වීම. 92

- වර්තමාන ආර්ථික අර්බුදය හමුවේ රාජ්‍ය ආදායම වැඩි කර ගැනීම සඳහා ගත යුතු පියවර සම්බන්ධයෙන් සාකච්ඡා කිරීම සඳහා වන විශේෂ කාරක සභා රැස්වීම 102

- ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුවේ බලපත්‍ර නිකුත් කිරීමේ ක්‍රියාවලිය විධිමත් කිරීම සඳහා පරිගණක මෘදුකාංග පද්ධතියක් හඳුන්වා දීමේ හැකියාව පිළිබඳ සාකච්ඡා කිරීම සඳහා කැඳවූ විශේෂ කාරක සභා රැස්වීම 116

- ශ්‍රී ලංකාවේ පවතින ආර්ථික අර්බුදය යටතේ පවතින අභියෝගවලට මුහුණ දීම සඳහා පොදු ප්‍රවාහන පහසුකම්වල කාර්යක්ෂමතාව ඉහළ නැංවීමට ප්‍රවාහන හා මහාමාර්ග 129

අමාත්‍යාංශයේ වත්මන් සහ අනාගත සැලසුම් විමර්ශනය කිරීමේ විශේෂ රැස්වීම